අ.පො.ස. (උ.පෙළ) විභාගය

# ඇගයීම් වාර්තාව

# 2021

## 23 දේශපාලන විද්‍යාව

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස (උ.පෙළ) විභාගය - 2021

# ඇගයීම් වාර්තාව

# 23 - දේශපාලන විද්‍යාව

Curriculum
Assessment
&
Evaluation

Teaching Learning

NETS

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව

ජාතික ඇගයීම් හා පර්යේෂණ සේවාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**සියලු ම හිමිකම් ඇවිරිණි**

**අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2021**

**ඇගයීම් වාර්තාව - දේශපාලන විද්‍යාව**

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | ඒ.කේ.එස් .ඉන්දිකා කුමාරි ලියනගේ<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා සංවිධානය | : | ඩබ්.එස්. ඩී. වීරසිංහ<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| විෂය සම්බන්ධීකරණය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |

**අන්තර්ගතය සංවර්ධන සඳහා**

| | | |
|---|---|---|
| විෂයපාදක මඟ පෙන්වීම | : | මහාචාර්ය අතුල විතානවසම්<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| ශාස්ත්‍රීය මඟ පෙන්වීම | : | ඩබ්.එස්. ඩී. වීරසිංහ<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| | | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| අන්තර්ගත සංවර්ධන කමිටුව | : | එල්. ආර්.ආර් සිල්වා<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂක (සමාජ විද්‍යා)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | එච්.එම්.ඒ සෙනරත් බණ්ඩාර<br>ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>ගලෙන්බිඳුණුවැව |

| | | |
|---|---|---|
| ලේඛක හා සංස්කාරක මණ්ඩලය | : | සී. එම්. අනුර චන්ද්‍රසේකර<br>ශ්‍රී. ලං. ගු. සේ. I<br>අ/ වලිසිංහ හරිස්චන්ද්‍ර ජාතික පාසල<br>අනුරාධපුර |
| | | එම්. ඩබ්ලිව්. සී. ප්‍රියජීවන්ත මද්දුමවෙල්ලාල<br>ශ්‍රී. ලං. ගු. සේ. I<br>ර/ සීවලී මධ්‍ය විද්‍යාලය<br>රත්නපුර |
| | | ඩබ්ලිව්. එම්. වයි. සී. වන්නිනායක<br>ශ්‍රී. ලං. ගු. සේ. 2 I<br>නික/ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලය<br>නිකවැරටිය |
| | | එච්. ඒ. එස්. සාරංග හෙට්ටිආරච්චි<br>ශ්‍රී. ලං. ගු. සේ. 2 II<br>ර/ අනුර මහා විද්‍යාලය<br>ගැටහැත්ත |
| ලේඛන සහාය | : | ජී. ඩබ්ලිව්. ශෂිකා මධුමාලි<br>කළමනාකරණ සේවා නිලධාරී |
| පරිගණක පිටපත් සැකසුම | : | ආර්. ඒ. එන්. එම්. පෙරේරා<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| පිටකවර සැකසුම | : | ඒ. එල්. කේ. චතුරාණි<br>කළමනාකරණ සේවා නිලධාරී |

## විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ 2021 වර්ෂයේ දේශපාලන විද්‍යාව විෂයයට අදාළව මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කර ඇත්තේ අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ දත්තමය හා විශ්ලේෂණාත්මක අවබෝධයක් ලබා දීම, ඔවුන්ගේ ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනීම සහ එම අනාවරණයන් පදනම් කරගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මෙන්ම පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ අරමුණ පෙරදැරිව ය.

මෙම වාර්තාවේ, විෂය නිර්දේශයේ අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා හා ඉගෙනුම් ඵල අනුව අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇත. ඒ අනුව එක් එක් පරීක්ෂණ අයිතමය සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර, ශක්තීන් හා දුර්වලතා මෙන් ම වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඒ සඳහා සුදුසු අධ්‍යාපන යෝජනා ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව ගුරුවරුන්, පාසල් පරිපාලකයන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයන්, සිසුන් සහ දෙමාපියන් ඇතුළු අධ්‍යාපන පද්ධතියේ සියලු ම පාර්ශ්වකරුවන් සඳහා වැදගත් ලේඛනයකි. වාර්තාවේ අන්තර්ගත, විශ්ලේෂණ මඟින් ගුරුවරුන්ට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දුර්වලතා නිවැරදිව හඳුනාගෙන ඉලක්කගත ඉගැන්වීම් ක්‍රමෝපායන් සැලසුම් කිරීමට හැකි වන අතර, සිසුන්ට තම ඉගෙනුම් අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව සූදානම් වීමට මඟ පෙන්වයි. එමෙන් ම විෂයමාලා සංශෝධනය, ගුරු වෘත්තීය සංවර්ධනය, සම්පත් වෙන් කිරීම සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ද මෙම වාර්තාව ඉවහල් වනු ඇත.

මෙම වාර්තාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා, අපේක්ෂකයන්ගේ සාධන දත්ත සමඟ එක් එක් පරීක්ෂණ අයිතමයට අදාළ විශ්ලේෂණ, නිරීක්ෂණ සහ නිර්දේශ ඒකාබද්ධව අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. එමඟින් සිසුන් මුහුණ දෙන සංකල්පමය දුර්වලතා සහ ඉගෙනුම් අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන ඒ සඳහා සුදුසු මැදිහත්වීම් සැලසුම් කළ හැකි වනු ඇත. තවද, මෙම වාර්තාව ඉදිරි වසරවල අපේක්ෂකයන්ගේ සාධනය සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීම සඳහා දත්ත පදනමක් ලෙස ද භාවිත කළ හැකිය.

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා දත්ත මත පදනම් වූ තීරණ ගැනීම අත්‍යවශ්‍ය වන බැවින්, මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති අනාවරණයන් සහ නිර්දේශ ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ගුරුවරුන් සහ සිසුන් විසින් ප්‍රායෝගිකව භාවිතයට ගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට දායක කර ගනු ඇතැයි මම විශ්වාස කරමි.

අවසාන වශයෙන්, මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කිරීම සඳහා කැපවීමෙන් දායක වූ සියලු ම සම්පත්දායකයන්ට සහ විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ නිලධාරීන්ට මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි. විශේෂයෙන් ම විද්‍යාත්මක ප්‍රවේශයකින් මෙම වාර්තාව සම්පාදනය කිරීම සඳහා ඔවුන් දැක්වූ වෘත්තීමය දායකත්වය ඉතා අගය කොට සලකමි.

ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ

විභාග කොමසාරිස් ජනරාල්

# සංක්ෂිප්තය

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ 2021 වර්ෂයේ දේශපාලන විද්‍යාව විෂයයට අදාළව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද මෙම ඇගයීම් වාර්තාව, අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ප්‍රකාශනයකි. මෙම වාර්තාව ගුරුවරුන්, විෂයභාර නිලධාරීන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පර්යේෂකයන්, සිසුන් සහ දෙමාපියන් සඳහා ප්‍රයෝජනවත් ලේඛනයක් ලෙස භාවිත කළ හැකි ය.

මෙම වාර්තාව ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.

**පළමු කොටසෙහි**, දේශපාලන විද්‍යා විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන්ගේ සාමාන්‍ය තොරතුරු, මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව අපේක්ෂක සංඛ්‍යාව, දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප අනුව සාධනය, ශ්‍රේණි ව්‍යාප්තිය සහ අනෙකුත් සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත. එමෙන්ම විෂය අරමුණු, ඇගයීම් රාමුව සහ විභාගයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද ලබා දී ඇත.

**දෙවන කොටසෙහි**, I පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි I පත්‍රයේ ව්‍යුහය, ප්‍රශ්න සැකැස්ම, ලකුණු ලබාදීමේ පටිපාටිය සහ එක් එක් ප්‍රශ්නයට අපේක්ෂකයන් දැක්වූ ප්‍රතිචාර පිළිබඳ දත්තමය විශ්ලේෂණ ද අන්තර්ගත වේ. තව ද, අයිතමවල පහසුතාව/පහසුතා දර්ශක, විභේදන හැකියාව සහ අපේක්ෂකයන්ගේ සාමාන්‍ය ප්‍රතිචාර රටා ද විග්‍රහ කර ඇත.

**තෙවන කොටසෙහි**, II පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි එක් එක් ප්‍රශ්නය, එහි කොටස් හා අනුකොටස් සඳහා අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇති අතර, අයිතමවල පහසුතා දර්ශක, නිපුණතා මට්ටම් සහ සංකල්පමය දුර්වලතා හඳුනාගෙන ඇත. එසේම, එම අනාවරණයන් මත පදනම්ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී ලෙස සංවිධානය කිරීම සඳහා සංවර්ධනාත්මක යෝජනා ද ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව සකස් කිරීම සඳහා සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory - CTT) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory - IRT) යන විද්‍යාත්මක ප්‍රවේශයන් යොදාගෙන අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය කර ලබාගත් දත්ත භාවිත කර ඇත. මීට අමතරව පිළිතුරු පත්‍ර ඇගයීමේ කටයුතුවල නිරත වූ ප්‍රධාන පරීක්ෂකවරුන්, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන් සහ සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ, අදහස් සහ යෝජනා ද මෙම වාර්තාව සකස් කිරීම සඳහා පාදක කරගෙන ඇත.

මෙම වාර්තාවේ ඇතුළත් විශ්ලේෂණයන් සහ නිර්දේශ, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, විෂය සාධනය ඉහළ නැංවීම, විෂයමාලා සංවර්ධනය සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

# පටුන

## I කොටස

1 විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු 01
1.1 විෂය අරමුණු 01
1.2 අපේක්ෂකයන්ගේ විෂයය සාධනය පිළිබඳ තොරතුරු 02
1.2.1 දේශපාලන විද්‍යාව විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 02
1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 02
1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 04
1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය අධ්‍යාපන කලාප අනුව 06
1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය 09

## II කොටස

2 ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - I පත්‍රය 10
2.1 දේශපාලන විද්‍යාව I පත්‍රයේ ව්‍යුහය 10
2.2 දේශපාලන විද්‍යාව I පත්‍රය 11
2.3 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය 19
2.4 I පත්‍රයේ වරණ තෝරා ඇති ආකාරය 20
2.5 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක 21
2.6 I පත්‍රයේ විශ්ලේෂණය 22
2.7 නිපුණතා අනුව විශ්ලේෂණය 23
2.8 නිපුණතා අනුව පහසුතා දර්ශක 24
2.9 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ , නිගමන හා යෝජනා 26

## III කොටස

3 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - II පත්‍රය 29
3.1 දේශපාලන විද්‍යාව II පත්‍රයේ ව්‍යුහය 29
3.2 II පත්‍රයේ විශ්ලේෂණය 30
3.3 II පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂී නිරීක්ෂණ හා නිර්දේශ 34
3.3.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර 34
3.3.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය 36
3.3.3 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර 38
3.3.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය 40
3.3.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර 42

3.3.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය 44
3.3.7 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර 46
3.3.8 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය 48
3.3.9 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර 50
3.3.10 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය 53
3.3.11 ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර 55
3.3.12 ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය 58
3.3.13 ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර 60
3.3.14 ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය 62
3.3.15 ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර 64
3.3.16 ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය 66
3.3.17 ප්‍රශ්න අංක 9 සහ අපේක්ෂිත පිළිතුර 68
3.3.18 ප්‍රශ්න අංක 9 සඳහා විශ්ලේෂණය 71
3.3.19 ප්‍රශ්න අංක 10 සහ අපේක්ෂිත පිළිතුර 73
3.3.20 ප්‍රශ්න අංක 10 සඳහා විශ්ලේෂණය 77

## වගු නාමාවලිය

වගුව 1.1 මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය 02

වගුව 1.2 ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය 02

වගුව 1.3 දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය 04

වගුව 1.4 අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය 06

වගුව 1.5 පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය 09

වගුව 2.1 I - A ලකුණු දීමේ පටිපාටිය 19

වගුව 2.2 I - A කොටසෙහි එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 20

වගුව 2.3 නිපුණතා අනුව I - A කොටසට අදාළ ප්‍රශ්න අංක 23

## ප්‍රස්තාර නාමාවලිය


| | | |
|---|---|---|
| ප්‍රස්තාරය 2.1 | I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක | 21 |
| ප්‍රස්තාරය 2.2 | I පත්‍රයේ A කොටසෙහි විෂය නිපුණතා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශක | 24 |
| ප්‍රස්තාරය 2.3 | I පත්‍රයේ B කොටසෙහි විෂය නිපුණතා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශක | 25 |
| ප්‍රස්තාරය 3.1 | II පත්‍රයේ එක් එක් ප්‍රශ්නවල පහසුතාව හා ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 30 |
| ප්‍රස්තාරය 3.2 | පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්න සඳහා අපේක්ෂකයන්ගේ සාධනය | 32 |
| ප්‍රස්තාරය 3.3 | II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය | 33 |
| ප්‍රස්තාරය 3.4 | ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 36 |
| ප්‍රස්තාරය 3.5 | 1 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය | 36 |
| ප්‍රස්තාරය 3.6 | ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 40 |
| ප්‍රස්තාරය 3.7 | 2 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය | 40 |
| ප්‍රස්තාරය 3.8 | ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 44 |
| ප්‍රස්තාරය 3.9 | 3 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය | 44 |
| ප්‍රස්තාරය 3.10 | ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 48 |
| ප්‍රස්තාරය 3.11 | 4 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය | 48 |
| ප්‍රස්තාරය 3.12 | ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 53 |
| ප්‍රස්තාරය 3.13 | 5 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය | 53 |
| ප්‍රස්තාරය 3.14 | ප්‍රශ්න අංක 6 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 58 |
| ප්‍රස්තාරය 3.15 | 6 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය | 58 |
| ප්‍රස්තාරය 3.16 | ප්‍රශ්න අංක 7 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 62 |
| ප්‍රස්තාරය 3.17 | 7 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය | 62 |
| ප්‍රස්තාරය 3.18 | ප්‍රශ්න අංක 8 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 66 |
| ප්‍රස්තාරය 3.19 | 8 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය | 66 |
| ප්‍රස්තාරය 3.20 | ප්‍රශ්න අංක 9 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 71 |
| ප්‍රස්තාරය 3.21 | 9 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය | 71 |
| ප්‍රස්තාරය 3.22 | ප්‍රශ්න අංක 10 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 77 |
| ප්‍රස්තාරය 3.23 | 10 ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය | 77 |

# I කොටස

## 1 විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අරමුණු

- ශාස්ත්‍රීය විෂයයක් ලෙස දේශපාලන විද්‍යාවේ අන්තර්ගතය, තේමා සහ වැදගත්කම හඳුනා ගැනීම
- තමන් ජීවත්වන පරිසරයේ, සමාජයේ සහ ලෝකයේ දේශපාලන ක්‍රියාවලීන්, දේශපාලන ආයතන සහ දේශපාලන වෙනස්වීම් හඳුනා ගැනීම හා විචාරාත්මක ව තේරුම් ගැනීම
- පුරවැසියන් හැටියට රටේත්, ලෝකයේත් ජීවත් වීමේ දී වැදගත්වන සාධනීය දේශපාලන සාරධර්ම, අරමුණු සහ මූලධර්ම පිළිබඳව සවිඥානික වීම
- දේශපාලන විද්‍යා විෂයයයේ ඓතිහාසික සහ සමකාලීන ප්‍රවණතා හඳුනා ගැනීම
- සාධනීය සමාජ, දේශපාලන පරිවර්තන සඳහා පුරවැසියන් ලෙස දායකත්වය ලබා දීමට අවශ්‍ය දැනුම, අවබෝධය සහ හැකියාවන් ලබා ගැනීම

**මූලාශ්‍රය**: දේශපාලන විද්‍යාව විෂය නිර්දේශය, 12-13 ශ්‍රේණි, 2017, ජා.අ.ආ.

## 1.2 අපේක්ෂකයන්ගේ විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1 දේශපාලන විද්‍යාව විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

**වගුව 1.1**

මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| මාධ්‍යය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| සිංහල | 7,990 | 31.39 | 17,465 | 68.61 | 25,455 | 1,250 | 30.66 | 2,827 | 69.34 | 4,077 | 9,240 | 31.29 | 20,292 | 68.71 | 29,532 |
| දෙමළ | 2,612 | 29.83 | 6,144 | 70.17 | 8,756 | 1,600 | 47.13 | 1,795 | 52.87 | 3,395 | 4,212 | 34.66 | 7,939 | 65.34 | 12,151 |
| ඉංග්‍රීසි | 42 | 63.64 | 24 | 36.36 | 66 | 41 | 53.95 | 35 | 46.05 | 76 | 83 | 58.45 | 59 | 41.55 | 142 |
| එකතුව | **10,644** | **31.05** | **23,633** | **68.95** | **34,277** | **2,891** | **38.30** | **4,657** | **61.70** | **7,548** | **13,535** | **32.36** | **28,290** | **67.64** | **41,825** |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

2021 වර්ෂයේ දේශපාලන විද්‍යා විෂය සඳහා පෙනී සිටි මුළු අපේක්ෂකයන් සංඛ්‍යාව 41,825කි. ඉන් 70.6% (29,532)ක් සිංහල මාධ්‍යයෙන් ද, 29.05% (12,151)ක් දෙමළ මාධ්‍යයෙන් ද, 0.34% (142)ක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද පෙනී සිට ඇත.

මුළු අපේක්ෂකයන් අතුරෙන් 81.95% (34,277)ක් පාසල් අපේක්ෂකයන් වන අතර පෞද්ගලික අපේක්ෂකයන් ප්‍රතිශතය 18.05% (7548)කි. පාසල් අපේක්ෂකයන් අතුරෙන් 68.95%ක් ස්ත්‍රී අපේක්ෂකයන් වන අතර 31.05%ක් පුරුෂ අපේක්ෂකයන් වේ.

ස්ත්‍රී පුරුෂභාවය අනුව මුළු අපේක්ෂකයන් සංඛ්‍යාව සැලකීමේ දී 67.64% (28,290)ක් ස්ත්‍රී අපේක්ෂකයන් වන අතර, 32.36% (13,535)ක් පුරුෂ අපේක්ෂකයන් වේ. ඒ අනුව මෙම වර්ෂයේ සමස්ත අපේක්ෂකයන් සංඛ්‍යාව සැලකූ විට පුරුෂ අපේක්ෂකයන්ට සාපේක්ෂව ස්ත්‍රී අපේක්ෂකයන් වැඩි ප්‍රමාණයක් දේශපාලන විද්‍යා විෂය සඳහා පෙනී සිට ඇත.

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

**වගුව 1.2**

ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| ශ්‍රේණිය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| **A** | 441 | 4.14 | 2,510 | 10.62 | 2,951 | 91 | 3.15 | 246 | 5.28 | 337 | 532 | 3.93 | 2,756 | 9.74 | 3,288 |
| **B** | 480 | 4.51 | 2,784 | 11.78 | 3,264 | 158 | 5.47 | 375 | 8.05 | 533 | 638 | 4.71 | 3,159 | 11.17 | 3,797 |
| **C** | 1,584 | 14.88 | 6,968 | 29.48 | 8,552 | 496 | 17.16 | 1,056 | 22.68 | 1,552 | 2,080 | 15.37 | 8,024 | 28.36 | 10,104 |
| **S** | 2,481 | 23.31 | 5,676 | 24.02 | 8,157 | 616 | 21.31 | 1,078 | 23.15 | 1,694 | 3,097 | 22.88 | 6,754 | 23.87 | 9,851 |
| **F** | 5,658 | 53.16 | 5,695 | 24.10 | 11,353 | 1,530 | 52.92 | 1,902 | 40.84 | 3,432 | 7,188 | 53.11 | 7,597 | 26.85 | 14,785 |
| එකතුව | **10,644** | **100.00** | **23,633** | **100.00** | **34,277** | **2,891** | **100.00** | **4,657** | **100.00** | **7,548** | **13,535** | **100.00** | **28,290** | **100.00** | **41,825** |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

අ.පො.ස. (උ.පෙළ) 2021 දේශපාලන විද්‍යාව විෂයය සඳහා පෙනී සිටි සමස්ත අපේක්ෂකයන් 41,825 අතුරෙන් සමත් ප්‍රතිශතය 64.65% (27,040)කි. මුළු අපේක්ෂකයන් අතුරෙන් 7.86% A සාමර්ථ්‍යයද , 9.07% B සාමර්ථ්‍යයද, 24.15% C සාමර්ථ්‍යයද ලබා ඇත. මෙම විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන්ගේ ස්ත්‍රී - පුරුෂභාවය සැලකීමේ දී ස්ත්‍රී අපේක්ෂකයන් 28,290ක් අතුරෙන් 9.74%ක් 'A' සාමර්ථ ලබා ඇත. පුරුෂ අපේක්ෂකයන් 13,535ක් අතුරෙන් 3.93%ක් පමණක් 'A' සාමර්ථ ලබා ඇත. පාසල් අපේක්ෂකයන් සැලකීමේ දී 23,633ක් වූ ස්ත්‍රී අපේක්ෂකයන්ගෙන් 10.62%ක් 'A' සාමර්ථ්‍යය ලබා ඇති අතර 10,644ක් වූ පුරුෂ අපේක්ෂකයන්ගෙන් 4.14%ක් 'A' සාමර්ථ්‍යය ලබා ඇත. මෙම විෂය අසමත් ප්‍රතිශතය සැලකීමේ දී සමස්ත ස්ත්‍රී අපේක්ෂකයන් අතුරෙන් 26.85%ක් හා සමස්ත පුරුෂ අපේක්ෂකයන් අතුරෙන් 53.10%ක් අසමත් වී ඇත.

## 1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

### වගුව 1:3

දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| දිස්ත්‍රික්ක | පෙනී සිටි සංඛ්‍යාව | දේශපාලන විද්‍යාව | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | විශිෂ්ට සම්මාන (A) | | අධි සම්මාන (B) | | සම්මාන (C) | | සාමාන්‍ය (S) | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 2,307 | 202 | 8.76 | 176 | 7.63 | 509 | 22.06 | 582 | 25.23 | 1,469 | 63.68 | 838 | 36.32 |
| ගම්පහ | 2,451 | 258 | 10.53 | 207 | 8.45 | 551 | 22.48 | 532 | 21.71 | 1,548 | 63.16 | 903 | 36.84 |
| කළුතර | 1,803 | 169 | 9.37 | 161 | 8.93 | 426 | 23.63 | 395 | 21.91 | 1,151 | 63.84 | 652 | 36.16 |
| මහනුවර | 2,406 | 124 | 5.15 | 190 | 7.90 | 576 | 23.94 | 632 | 26.27 | 1,522 | 63.26 | 884 | 36.74 |
| මාතලේ | 741 | 62 | 8.37 | 67 | 9.04 | 180 | 24.29 | 162 | 21.86 | 471 | 63.56 | 270 | 36.44 |
| නුවරඑළිය | 2,010 | 131 | 6.52 | 168 | 8.36 | 646 | 32.14 | 605 | 30.10 | 1,550 | 77.11 | 460 | 22.89 |
| ගාල්ල | 2,476 | 245 | 9.89 | 250 | 10.10 | 505 | 20.40 | 506 | 20.44 | 1,506 | 60.82 | 970 | 39.18 |
| මාතර | 1,207 | 115 | 9.53 | 141 | 11.68 | 250 | 20.71 | 243 | 20.13 | 749 | 62.05 | 458 | 37.95 |
| හම්බන්තොට | 1,290 | 114 | 8.84 | 130 | 10.08 | 280 | 21.71 | 248 | 19.22 | 772 | 59.84 | 518 | 40.16 |
| යාපනය | 683 | 51 | 7.47 | 64 | 9.37 | 190 | 27.82 | 156 | 22.84 | 461 | 67.50 | 222 | 32.50 |
| මන්නාරම | 175 | 10 | 5.71 | 10 | 5.71 | 59 | 33.71 | 57 | 32.57 | 136 | 77.71 | 39 | 22.29 |
| වවුනියාව | 199 | 9 | 4.52 | 17 | 8.54 | 52 | 26.13 | 54 | 27.14 | 132 | 66.33 | 67 | 33.67 |
| මුලතිව් | 30 | 1 | 3.33 | 1 | 3.33 | 5 | 16.67 | 7 | 23.33 | 14 | 46.67 | 16 | 53.33 |
| කිලිනොච්චි | 52 | 1 | 1.92 | 2 | 3.85 | 13 | 25.00 | 10 | 19.23 | 26 | 50.00 | 26 | 50.00 |
| මඩකලපුව | 1,032 | 59 | 5.72 | 90 | 8.72 | 284 | 27.52 | 281 | 27.23 | 714 | 69.19 | 318 | 30.81 |
| අම්පාර | 1,716 | 140 | 8.16 | 183 | 10.66 | 493 | 28.73 | 401 | 23.37 | 1,217 | 70.92 | 499 | 29.08 |
| ත්‍රිකුණාමලය | 499 | 48 | 9.62 | 59 | 11.82 | 126 | 25.25 | 115 | 23.05 | 348 | 69.74 | 151 | 30.26 |
| කුරුණෑගල | 2,938 | 231 | 7.86 | 270 | 9.19 | 669 | 22.77 | 681 | 23.18 | 1,851 | 63.00 | 1,087 | 37.00 |
| පුත්තලම | 1,528 | 123 | 8.05 | 165 | 10.80 | 396 | 25.92 | 347 | 22.71 | 1,031 | 67.47 | 497 | 32.53 |
| අනුරාධපුරය | 1,505 | 175 | 11.63 | 142 | 9.44 | 385 | 25.58 | 339 | 22.52 | 1,041 | 69.17 | 464 | 30.83 |
| පොළොන්නරුව | 702 | 84 | 11.97 | 69 | 9.83 | 194 | 27.64 | 170 | 24.22 | 517 | 73.65 | 185 | 26.35 |
| බදුල්ල | 2,174 | 193 | 8.88 | 242 | 11.13 | 620 | 28.52 | 592 | 27.23 | 1,647 | 75.76 | 527 | 24.24 |
| මොණරාගල | 979 | 91 | 9.30 | 92 | 9.40 | 278 | 28.40 | 252 | 25.74 | 713 | 72.83 | 266 | 27.17 |
| රත්නපුරය | 2,210 | 246 | 11.13 | 260 | 11.76 | 536 | 24.25 | 505 | 22.85 | 1,547 | 70.00 | 663 | 30.00 |
| කෑගල්ල | 1,164 | 69 | 5.93 | 108 | 9.28 | 329 | 28.26 | 285 | 24.48 | 791 | 67.96 | 373 | 32.04 |
| **සමස්ත දිවයින** | **34,277** | **2,951** | **8.61** | **3,264** | **9.52** | **8,552** | **24.95** | **8,157** | **23.80** | **22,924** | **66.88** | **11,353** | **33.12** |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

දේශපාලන විද්‍යා විෂය සඳහා වැඩිම පාසල් අපේක්ෂකයන් එනම් අපේක්ෂකයන් 2938ක් පෙනී සිටි කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමත් ප්‍රතිශතය 63%කි.

දිස්ත්‍රික්කයකින් පෙනී සිටි අපේක්ෂකයන් සැලකීමේ දී වැඩිම සමත්වීමේ ප්‍රතිශතයක් මන්නාරම (77.71%), නුවරඑළිය (77.11%) සහ බදුල්ල (75.76%) යන දිස්ත්‍රික්කවලින් වාර්තා වේ. මෙම දිස්ත්‍රික්කවලින් පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව පිළිවෙලින් 175ක්, 2010ක් හා 2174ක් වේ.

වැඩිම A සාමර්ථ ප්‍රතිශතයක් වාර්තා වන දිස්ත්‍රික්ක ලෙස පොළොන්නරුව (11.97%), අනුරාධපුර (11.63%) සහ රත්නපුර (11.13%) යන දිස්ත්‍රික්ක හඳුනාගත හැකි ය. මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක දෙක සැලකීමේ දී මුලතිව් දිස්ත්‍රික්කයෙන් අපේක්ෂකයන් 30ක් හා කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් අපේක්ෂකයන් 52ක් ලෙස අඩු අපේක්ෂකයන් සංඛ්‍යාවක් මෙම විෂය සඳහා පෙනී සිට ඇත.

## 1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

## වගුව 1.4

අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| අධ්‍යාපන කලාප | පෙනී සිටි සංඛ්‍යාව | දේශපාලන විද්‍යාව | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | A | | B | | C | | S | | A+B+C+S | | F | |
| | | සංඛ්‍යාව | % | සඛ්‍යාව | % | සඛ්‍යාව | % | සඛ්‍යාව | % | සඛ්‍යාව | % | සඛ්‍යාව | % |
| කොළඹ | 996 | 129 | 12.95 | 80 | 8.03 | 231 | 23.19 | 251 | 25.20 | 691 | 69.38 | 305 | 30.62 |
| හෝමාගම | 325 | 25 | 7.69 | 21 | 6.46 | 68 | 20.92 | 73 | 22.46 | 187 | 57.54 | 138 | 42.46 |
| ශ්‍රී ජයවර්ධනපුර | 501 | 26 | 5.19 | 43 | 8.58 | 107 | 21.36 | 133 | 26.55 | 309 | 61.68 | 192 | 38.32 |
| පිළියන්දල | 485 | 22 | 4.54 | 32 | 6.60 | 103 | 21.24 | 125 | 25.77 | 282 | 58.14 | 203 | 41.86 |
| ගම්පහ | 811 | 139 | 17.14 | 93 | 11.47 | 194 | 23.92 | 147 | 18.13 | 573 | 70.65 | 238 | 29.35 |
| මිනුවන්ගොඩ | 385 | 29 | 7.53 | 34 | 8.83 | 84 | 21.82 | 94 | 24.42 | 241 | 62.60 | 144 | 37.40 |
| මීගමුව | 649 | 37 | 5.70 | 39 | 6.01 | 130 | 20.03 | 139 | 21.42 | 345 | 53.16 | 304 | 46.84 |
| කැළණිය | 606 | 53 | 8.75 | 41 | 6.77 | 143 | 23.60 | 152 | 25.08 | 389 | 64.19 | 217 | 35.81 |
| කළුතර | 809 | 67 | 8.28 | 69 | 8.53 | 190 | 23.49 | 207 | 25.59 | 533 | 65.88 | 276 | 34.12 |
| මතුගම | 487 | 49 | 10.06 | 46 | 9.45 | 128 | 26.28 | 96 | 19.71 | 319 | 65.50 | 168 | 34.50 |
| හොරණ | 507 | 53 | 10.45 | 46 | 9.07 | 108 | 21.30 | 92 | 18.15 | 299 | 58.97 | 208 | 41.03 |
| මහනුවර | 972 | 78 | 8.02 | 86 | 8.85 | 203 | 20.88 | 274 | 28.19 | 641 | 65.95 | 331 | 34.05 |
| දෙනුවර | 191 | 7 | 3.66 | 8 | 4.19 | 54 | 28.27 | 38 | 19.90 | 107 | 56.02 | 84 | 43.98 |
| ගම්පොළ | 378 | 8 | 2.12 | 37 | 9.79 | 104 | 27.51 | 87 | 23.02 | 236 | 62.43 | 142 | 37.57 |
| තෙල්දෙණිය | 311 | 17 | 5.47 | 28 | 9.00 | 87 | 27.97 | 88 | 28.30 | 220 | 70.74 | 91 | 29.26 |
| වත්තේගම | 308 | 7 | 2.27 | 22 | 7.14 | 74 | 24.03 | 78 | 25.32 | 181 | 58.77 | 127 | 41.23 |
| කටුගස්තොට | 246 | 7 | 2.85 | 9 | 3.66 | 54 | 21.95 | 67 | 27.24 | 137 | 55.69 | 109 | 44.31 |
| මාතලේ | 407 | 27 | 6.63 | 27 | 6.63 | 77 | 18.92 | 97 | 23.83 | 228 | 56.02 | 179 | 43.98 |
| ගලේවෙල | 182 | 13 | 7.14 | 15 | 8.24 | 51 | 28.02 | 40 | 21.98 | 119 | 65.38 | 63 | 34.62 |
| නාඋල | 40 | 3 | 7.50 | 3 | 7.50 | 8 | 20.00 | 9 | 22.50 | 23 | 57.50 | 17 | 42.50 |
| විල්ගමුව | 112 | 19 | 16.96 | 22 | 19.64 | 44 | 39.29 | 16 | 14.29 | 101 | 90.18 | 11 | 9.82 |
| නුවරඑළිය | 591 | 21 | 3.55 | 30 | 5.08 | 197 | 33.33 | 218 | 36.89 | 466 | 78.85 | 125 | 21.15 |
| කොත්මලේ | 296 | 30 | 10.14 | 38 | 12.84 | 111 | 37.50 | 71 | 23.99 | 250 | 84.46 | 46 | 15.54 |
| හැටන් | 541 | 30 | 5.55 | 56 | 10.35 | 181 | 33.46 | 169 | 31.24 | 436 | 80.59 | 105 | 19.41 |
| වළපනේ | 297 | 39 | 13.13 | 36 | 12.12 | 100 | 33.67 | 70 | 23.57 | 245 | 82.49 | 52 | 17.51 |
| හඟුරන්කෙත | 285 | 11 | 3.86 | 8 | 2.81 | 57 | 20.00 | 77 | 27.02 | 153 | 53.68 | 132 | 46.32 |
| ගාල්ල | 959 | 125 | 13.03 | 82 | 8.55 | 209 | 21.79 | 208 | 21.69 | 624 | 65.07 | 335 | 34.93 |
| ඇල්පිටිය | 570 | 45 | 7.89 | 67 | 11.75 | 126 | 22.11 | 105 | 18.42 | 343 | 60.18 | 227 | 39.82 |
| අම්බලන්ගොඩ | 574 | 43 | 7.49 | 56 | 9.76 | 86 | 14.98 | 106 | 18.47 | 291 | 50.70 | 283 | 49.30 |
| උඩුගම | 373 | 32 | 8.58 | 45 | 12.06 | 84 | 22.52 | 87 | 23.32 | 248 | 66.49 | 125 | 33.51 |
| මාතර | 471 | 43 | 9.13 | 56 | 11.89 | 99 | 21.02 | 96 | 20.38 | 294 | 62.42 | 177 | 37.58 |
| අකුරැස්ස | 133 | 10 | 7.52 | 12 | 9.02 | 21 | 15.79 | 30 | 22.56 | 73 | 54.89 | 60 | 45.11 |
| මුලටියන (හක්මන) | 229 | 20 | 8.73 | 26 | 11.35 | 47 | 20.52 | 43 | 18.78 | 136 | 59.39 | 93 | 40.61 |
| දෙණියාය (මොරවක) | 374 | 42 | 11.23 | 47 | 12.57 | 83 | 22.19 | 74 | 19.79 | 246 | 65.78 | 128 | 34.22 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තංගල්ල | 278 | 26 | 9.35 | 31 | 11.15 | 59 | 21.22 | 52 | 18.71 | 168 | 60.43 | 110 | 39.57 |
| හම්බන්තොට | 650 | 69 | 10.62 | 62 | 9.54 | 141 | 21.69 | 125 | 19.23 | 397 | 61.08 | 253 | 38.92 |
| වලස්මුල්ල | 362 | 19 | 5.25 | 37 | 10.22 | 80 | 22.10 | 71 | 19.61 | 207 | 57.18 | 155 | 42.82 |
| යාපනය | 218 | 10 | 4.59 | 24 | 11.01 | 66 | 30.28 | 52 | 23.85 | 152 | 69.72 | 66 | 30.28 |
| දූපත් | 58 | 3 | 5.17 | 2 | 3.45 | 22 | 37.93 | 13 | 22.41 | 40 | 68.97 | 18 | 31.03 |
| තෙන්මාරච්චි | 66 | 9 | 13.64 | 11 | 16.67 | 15 | 22.73 | 12 | 18.18 | 47 | 71.21 | 19 | 28.79 |
| වලිකාමම් | 255 | 26 | 10.20 | 25 | 9.80 | 71 | 27.84 | 54 | 21.18 | 176 | 69.02 | 79 | 30.98 |
| වඩමාරච්චි | 86 | 3 | 3.49 | 2 | 2.33 | 16 | 18.60 | 25 | 29.07 | 46 | 53.49 | 40 | 46.51 |
| කිලිනොච්චිය | 30 | 1 | 3.33 | 2 | 6.67 | 9 | 30.00 | 5 | 16.67 | 17 | 56.67 | 13 | 43.33 |
| කිලිනොච්චිය | 22 | 0 | 0.00 | 0 | 0.00 | 4 | 18.18 | 5 | 22.73 | 9 | 40.91 | 13 | 59.09 |
| මන්නාරම | 159 | 10 | 6.29 | 10 | 6.29 | 55 | 34.59 | 49 | 30.82 | 124 | 77.99 | 35 | 22.01 |
| මඩු | 16 | 0 | 0.00 | 0 | 0.00 | 4 | 25.00 | 8 | 50.00 | 12 | 75.00 | 4 | 25.00 |
| වව්නියාව (දකුණ) | 182 | 9 | 4.95 | 17 | 9.34 | 47 | 25.82 | 50 | 27.47 | 123 | 67.58 | 59 | 32.42 |
| වව්නියාව (උතුර) | 17 | 0 | 0.00 | 0 | 0.00 | 5 | 29.41 | 4 | 23.53 | 9 | 52.94 | 8 | 47.06 |
| මුලතිව් | 28 | 1 | 3.57 | 1 | 3.57 | 5 | 17.86 | 6 | 21.43 | 13 | 46.43 | 15 | 53.57 |
| තුනුක්කායි | 2 | 0 | 0.00 | 0 | 0.00 | - | 0.00 | 1 | 50.00 | 1 | 50.00 | 1 | 50.00 |
| මඩකලපුව | 303 | 18 | 5.94 | 24 | 7.92 | 90 | 29.70 | 92 | 30.36 | 224 | 73.93 | 79 | 26.07 |
| කල්කුඩා | 197 | 3 | 1.52 | 5 | 2.54 | 50 | 25.38 | 61 | 30.96 | 119 | 60.41 | 78 | 39.59 |
| පදිරිප්පු | 100 | 9 | 9.00 | 9 | 9.00 | 24 | 24.00 | 23 | 23.00 | 65 | 65.00 | 35 | 35.00 |
| මඩකලපුව (මධ්‍යම) | 338 | 29 | 8.58 | 45 | 13.31 | 102 | 30.18 | 74 | 21.89 | 250 | 73.96 | 88 | 26.04 |
| මඩකලපුව(බටහිර) | 94 | 0 | 0.00 | 7 | 7.45 | 18 | 19.15 | 31 | 32.98 | 56 | 59.57 | 38 | 40.43 |
| අම්පාර | 309 | 27 | 8.74 | 26 | 8.41 | 91 | 29.45 | 63 | 20.39 | 207 | 66.99 | 102 | 33.01 |
| කල්මුණේ | 502 | 48 | 9.56 | 65 | 12.95 | 128 | 25.50 | 110 | 21.91 | 351 | 69.92 | 151 | 30.08 |
| සමන්තුරෙයි | 183 | 18 | 9.84 | 19 | 10.38 | 77 | 42.08 | 45 | 24.59 | 159 | 86.89 | 24 | 13.11 |
| මහඔය | 128 | 17 | 13.28 | 18 | 14.06 | 47 | 36.72 | 31 | 24.22 | 113 | 88.28 | 15 | 11.72 |
| දෙහිඅත්තකණ්ඩිය | 217 | 11 | 5.07 | 19 | 8.76 | 57 | 26.27 | 62 | 28.57 | 149 | 68.66 | 68 | 31.34 |
| අක්කරෙයිපත්තු | 176 | 12 | 6.82 | 23 | 13.07 | 43 | 24.43 | 39 | 22.16 | 117 | 66.48 | 59 | 33.52 |
| තිරුක්කෝවිල් | 201 | 7 | 3.48 | 13 | 6.47 | 50 | 24.88 | 51 | 25.37 | 121 | 60.20 | 80 | 39.80 |
| ත්‍රිකුණාමලය | 80 | 4 | 5.00 | 5 | 6.25 | 19 | 23.75 | 22 | 27.50 | 50 | 62.50 | 30 | 37.50 |
| මුතූර් | 184 | 29 | 15.76 | 33 | 17.93 | 56 | 30.43 | 37 | 20.11 | 155 | 84.24 | 29 | 15.76 |
| කන්තලේ | 166 | 10 | 6.02 | 12 | 7.23 | 33 | 19.88 | 43 | 25.90 | 98 | 59.04 | 68 | 40.96 |
| කින්නියා | 46 | 4 | 8.70 | 3 | 6.52 | 13 | 28.26 | 9 | 19.57 | 29 | 63.04 | 17 | 36.96 |
| ත්‍රිකුණාමලය | 23 | 1 | 4.35 | 6 | 26.09 | 5 | 21.74 | 4 | 17.39 | 16 | 69.57 | 7 | 30.43 |
| කුරුණෑගල | 634 | 42 | 6.62 | 58 | 9.15 | 136 | 21.45 | 166 | 26.18 | 402 | 63.41 | 232 | 36.59 |
| කුලියාපිටිය | 531 | 38 | 7.16 | 47 | 8.85 | 148 | 27.87 | 120 | 22.60 | 353 | 66.48 | 178 | 33.52 |
| නිකවැරටිය | 552 | 41 | 7.43 | 61 | 11.05 | 116 | 21.01 | 116 | 21.01 | 334 | 60.51 | 218 | 39.49 |
| මහව | 571 | 55 | 9.63 | 44 | 7.71 | 144 | 25.22 | 140 | 24.52 | 383 | 67.08 | 188 | 32.92 |
| ගිරිඋල්ල | 422 | 36 | 8.53 | 41 | 9.72 | 66 | 15.64 | 88 | 20.85 | 231 | 54.74 | 191 | 45.26 |
| ඉබ්බාගමුව | 228 | 19 | 8.33 | 19 | 8.33 | 59 | 25.88 | 51 | 22.37 | 148 | 64.91 | 80 | 35.09 |
| පුත්තලම | 896 | 67 | 7.48 | 101 | 11.27 | 249 | 27.79 | 206 | 22.99 | 623 | 69.53 | 273 | 30.47 |
| හලාවත | 632 | 56 | 8.86 | 64 | 10.13 | 147 | 23.26 | 141 | 22.31 | 408 | 64.56 | 224 | 35.44 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය | 554 | 82 | 14.80 | 51 | 9.21 | 147 | 26.53 | 115 | 20.76 | 395 | 71.30 | 159 | 28.70 |
| තඹුත්තේගම | 171 | 12 | 7.02 | 14 | 8.19 | 37 | 21.64 | 29 | 16.96 | 92 | 53.80 | 79 | 46.20 |
| කැකිරාව | 296 | 19 | 6.42 | 20 | 6.76 | 78 | 26.35 | 79 | 26.69 | 196 | 66.22 | 100 | 33.78 |
| ගලෙන්බිඳුණුවැව | 302 | 41 | 13.58 | 39 | 12.91 | 74 | 24.50 | 72 | 23.84 | 226 | 74.83 | 76 | 25.17 |
| කැබිතිගොල්ලෑව | 182 | 21 | 11.54 | 18 | 9.89 | 49 | 26.92 | 44 | 24.18 | 132 | 72.53 | 50 | 27.47 |
| පොළොන්නරුව | 261 | 29 | 11.11 | 23 | 8.81 | 81 | 31.03 | 56 | 21.46 | 189 | 72.41 | 72 | 27.59 |
| හිඟුරක්ගොඩ | 228 | 33 | 14.47 | 23 | 10.09 | 53 | 23.25 | 49 | 21.49 | 158 | 69.30 | 70 | 30.70 |
| දිඹුලාගල | 213 | 22 | 10.33 | 23 | 10.80 | 60 | 28.17 | 65 | 30.52 | 170 | 79.81 | 43 | 20.19 |
| බදුල්ල | 503 | 70 | 13.92 | 56 | 11.13 | 126 | 25.05 | 131 | 26.04 | 383 | 76.14 | 120 | 23.86 |
| බණ්ඩාරවෙල | 560 | 36 | 6.43 | 59 | 10.54 | 162 | 28.93 | 165 | 29.46 | 422 | 75.36 | 138 | 24.64 |
| මහියංගණය | 319 | 23 | 7.21 | 20 | 6.27 | 82 | 25.71 | 100 | 31.35 | 225 | 70.53 | 94 | 29.47 |
| වැලිමඩ | 452 | 44 | 9.73 | 76 | 16.81 | 122 | 26.99 | 107 | 23.67 | 349 | 77.21 | 103 | 22.79 |
| පස්සර | 230 | 12 | 5.22 | 23 | 10.00 | 96 | 41.74 | 61 | 26.52 | 192 | 83.48 | 38 | 16.52 |
| වියළුව | 110 | 8 | 7.27 | 8 | 7.27 | 32 | 29.09 | 28 | 25.45 | 76 | 69.09 | 34 | 30.91 |
| මොණරාගල | 324 | 28 | 8.64 | 30 | 9.26 | 97 | 29.94 | 94 | 29.01 | 249 | 76.85 | 75 | 23.15 |
| වැල්ලවාය | 186 | 18 | 9.68 | 19 | 10.22 | 46 | 24.73 | 45 | 24.19 | 128 | 68.82 | 58 | 31.18 |
| බිබිලේ | 268 | 24 | 8.96 | 27 | 10.07 | 78 | 29.10 | 75 | 27.99 | 204 | 76.12 | 64 | 23.88 |
| තණමල්විල | 201 | 21 | 10.45 | 16 | 7.96 | 57 | 28.36 | 38 | 18.91 | 132 | 65.67 | 69 | 34.33 |
| රත්නපුර | 765 | 82 | 10.72 | 104 | 13.59 | 189 | 24.71 | 186 | 24.31 | 561 | 73.33 | 204 | 26.67 |
| බලංගොඩ | 346 | 31 | 8.96 | 39 | 11.27 | 101 | 29.19 | 78 | 22.54 | 249 | 71.97 | 97 | 28.03 |
| නිවිතිගල | 345 | 30 | 8.70 | 31 | 8.99 | 84 | 24.35 | 84 | 24.35 | 229 | 66.38 | 116 | 33.62 |
| ඇඹිලිපිටිය | 754 | 103 | 13.66 | 86 | 11.41 | 162 | 21.49 | 157 | 20.82 | 508 | 67.37 | 246 | 32.63 |
| කෑගල්ල | 352 | 29 | 8.24 | 38 | 10.80 | 94 | 26.70 | 75 | 21.31 | 236 | 67.05 | 116 | 32.95 |
| මාවනැල්ල | 320 | 11 | 3.44 | 21 | 6.56 | 96 | 30.00 | 74 | 23.13 | 202 | 63.13 | 118 | 36.88 |
| දෙහිඕවිට | 492 | 29 | 5.89 | 49 | 9.96 | 139 | 28.25 | 136 | 27.64 | 353 | 71.75 | 139 | 28.25 |
| **සමස්ත දිවයින** | **34,277** | **2,951** | **8.61** | **3,264** | **9.52** | **8,552** | **24.95** | **8,157** | **23.80** | **22,924** | **66.88** | **11,353** | **33.12** |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

අධ්‍යාපන කලාප අනුව විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සැලකීමේ දී ඉහළ ප්‍රතිඵල ලබාගෙන ඇත්තේ, පිළිවෙලින් විල්ගමුව (90.18%) මහඔය (88.28%) සමන්තුරේ (86.89%) සහ කොත්මලේ (84.46%) යන අධ්‍යාපන කලාප වේ. අධ්‍යාපන කලාප 100න් අධ්‍යාපන කලාප 46ක් දිවයිනේ සමත් ප්‍රතිශතය වූ 66.88% ඉක්ම වූ සමත් ප්‍රතිශත වාර්තා කර ඇත. මෙම විෂය සඳහා වැඩිම අපේක්ෂකයන් සංඛ්‍යාවක් පෙනී සිටි අධ්‍යාපන කලාපය වශයෙන් කොළඹ අධ්‍යාපන කලාපය හඳුනාගත හැකි අතර එම කලාපයෙන් ඉදිරිපත් වූ අපේක්ෂකයන් 996 අතුරෙන් 69.38%ක් මෙම විෂය සමත් වී තිබේ.

**1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය**

**වගුව 1.5**

පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය

| පන්ති ප්‍රාන්තර | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91-100 | 100 | 0.24 | 41,825 | 100.00 |
| 81-90 | 1,382 | 3.30 | 41,725 | 99.76 |
| 71-80 | 3,146 | 7.52 | 40,343 | 96.46 |
| 61-70 | 4,212 | 10.07 | 37,197 | 88.93 |
| 51-60 | 4,918 | 11.76 | 32,985 | 78.86 |
| 41-50 | 5,784 | 13.83 | 28,067 | 67.11 |
| 31-40 | 6,746 | 16.13 | 22,283 | 53.28 |
| 21-30 | 7,539 | 18.03 | 15,537 | 37.15 |
| 11-20 | 6,507 | 15.56 | 7,998 | 19.12 |
| 00-10 | 1,498 | 3.57 | 1,498 | 3.58 |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

ඉහත වගුව 1.5 අනුව අඩු සාධන මට්ටමක් සහිත එනම් ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 53.28%කි. ලකුණු 51ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 32.89%කි. ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලකුණු ලබා ගත් ප්‍රතිශතය 3.56%කි.

# II කොටස

## 2 ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - I පත්‍රය

### 2.1 දේශපාලන විද්‍යාව I පත්‍රයේ ව්‍යුහය

**I පත්‍රය - කාලය පැය 02යි.**

මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

**A කොටස**

වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 30කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 30කට ලකුණු 60කි.

**B කොටස**

කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 20කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 20කට ලකුණු 40කි.

I පත්‍රය සඳහා මුළු ලකුණු 100කි.

**මූලාශ්‍රය :** අ.පො.ස (උ.පෙළ) විභාගය වර්ෂ 2019 හා ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න, 2018, ශ්‍රී.ලං.වි.දෙ.

අ.පො.ස (උ.පෙළ) විභාගය - 2021

දේශපාලන විද්‍යාව

## 2.2 දේශපාලන විද්‍යාව I පත්‍රය

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

23 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය: ..........................................

**උපදෙස්:**
- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B කොටස් දෙකකින් සමන්විත ය.
- A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
- එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 1 – 3 | |
| 2 | 4 – 11 | |
| 3 | 12 – 19 | |
| 4 | 20 – 25 | |
| 5 | 26 – 30 | |
| 6 | 31 – 36 | |
| 7 | 37 – 43 | |
| 8 | 44 – 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අධීක්ෂක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

### A කොටස

- අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

**1.** දේශපාලනය
(1) රාජ්‍ය පරිපාලන කටයුතුවලට සීමා වන්නකි.
(2) සැමවිට ම සමාජ ප්‍රගමනය පිළිබඳව සැලකිලිමත් වෙයි.
(3) මැතිවරණ ක්‍රියාදාමයට සීමා වේ.
(4) පුරවැසියන් අතර පවතින සමාජ සබඳතාවයකි.
(5) සමාජයේ සදාචාරාත්මක ඇගයුම් අධ්‍යයනය කිරීමකි. (......)

**2.** දේශපාලන විද්‍යාව
(1) දේශපාලන බලය ලබාගැනීම අරමුණු කර ගනියි.
(2) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමට සීමා වේ.
(3) සමාජීය විද්‍යා ක්ෂේත්‍රයකට අයත්වෙයි.
(4) පක්ෂ දේශපාලනය අනුගමනය කරයි.
(5) ව්‍යවහාර ඥානය මත පදනම් වේ. (......)

**3.** ව්‍යවස්ථානුකූලවාදය
(1) සංවරණ සහ තුලන මූලධර්මය ප්‍රතික්ෂේප කරයි.
(2) නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායට එරෙහිව යයි.
(3) ප්‍රභූ හා බලය අපසාරණය කිරීම ප්‍රවර්ධනය කරයි.
(4) විධායකය සහ ව්‍යවස්ථාදායකය තුළ රාජ්‍ය බලය ඒකරාශී වීමට හැකියාව ලබා දෙයි.
(5) පුරවැසියන්ගේ මූලික අයිතීන් සහ නිදහස සුරක්ෂිත කරයි. (......)

4. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
   (1) සම්භවය ලැබුවේ 17වන සියවසේ දී ය.
   (2) ලිබරල්වාදය සමඟ සමීපව සම්බන්ධ වී තිබිණි.
   (3) බ්‍රිතාන්‍ය කොන්සර්වටිව් පක්ෂයේ දේශපාලන මතවාදය විය.
   (4) ධනවාදය සහ සමාජවාදය යන දෙකෙහිම ලක්ෂණවල සංයෝගයකි.
   (5) ආර්ථික අසමානතා අහෝසි කිරීමට ධනවාදයට පවතින හැකියාව විශ්වාස කළේ ය. (......)

5. නීතියේ ආධිපත්‍යය
   (1) ආණ්ඩුවේ නිලධරතන්ත්‍රයේ ආධිපත්‍ය බලය සාධාරණය කරයි.
   (2) ජාතික හදිසි අවස්ථාවල දී අත්තනෝමතිකව ක්‍රියා කිරීමේ හැකියාව ආණ්ඩුවට ලබාදෙයි.
   (3) ආණ්ඩුවේ තීරණ සැමවිට ම බහුතරයේ කැමැත්ත පිළිබිඹු කළ යුතු බව අවධාරණය කරයි.
   (4) දේශපාලන බලය වගවීමෙන් තොරව භාවිත කිරීම වැළැක්වීම අරමුණු කරයි.
   (5) සමාජවාදයේ නෛතික සංකල්පයකි. (......)

6. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී දේශපාලන පක්ෂවල කාර්යභාරයට ඇතුළත් වන්නේ,
   (1) දේශපාලන බලය ලබා ගැනීම සඳහා පමණක් මහජන ගැටලු ප්‍රයෝජනයට ගැනීමයි.
   (2) රාජ්‍ය ප්‍රතිපත්තිවල ප්‍රතිඵල පිළිබඳ පුරවැසියන්ට අවබෝධයක් ලබා දීමයි.
   (3) ප්‍රතිපත්ති ක්‍රියාදාමය තුළ ජනතා සහභාගිත්වය සීමා කිරීමයි.
   (4) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය මගින් පෞද්ගලික අභිලාෂ ප්‍රවර්ධනය කිරීමයි.
   (5) පක්ෂ නායකත්වය ප්‍රතිපත්ති විවාදවලට සම්බන්ධ වීම අධෛර්ය කිරීමයි. (......)

7. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ මෑතකාලීන ප්‍රවණතාවලට ඇතුළත් වන්නේ,
   (1) සාම්ප්‍රදායික පක්ෂ මතවාද අඛණ්ඩව පවත්වාගෙන යාමයි.
   (2) ජනවාර්ගික-ආගමික පක්ෂ අතුරුදහන් වීමයි.
   (3) සාම්ප්‍රදායික වාමාංශික පක්ෂවල ජනප්‍රියත්වය වර්ධනය වීමයි.
   (4) සාම්ප්‍රදායික ප්‍රධාන පක්ෂ දෙක පිරිහීමට පත්වීමයි.
   (5) පක්ෂ අභ්‍යන්තර ගැටුම් අඩු වීමයි. (......)

8. ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමයේ ප්‍රතිඵලයක් වන්නේ,
   (1) නියෝජනය ලබා ගැනීමට කුඩා පක්ෂවලට වැඩි අවකාශ ලැබීමයි.
   (2) මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා අඩු වීමයි.
   (3) ජාතික ලැයිස්තුව හඳුන්වා දීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වීමයි.
   (4) මැතිවරණ ප්‍රචාරණය සඳහා යොදවන වියදම් අඩු වීමයි.
   (5) ජනවාර්ගික අනන්‍යතාව සහිත දේශපාලන පක්ෂ බිහිවීම වැළැක්වීමයි. (......)

9. ශ්‍රී ලංකාවේ පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1972) මගින්
   (1) රාජ්‍ය සේවය දේශපාලන විධායකයේ පාලනයෙන් නිදහස් කෙරිණ.
   (2) රාජ්‍ය සේවකයන් පත්කිරීමේ හා මාරුකිරීමේ බලය කැබිනට් අමාත්‍යවරුන්ට පැවරිණි.
   (3) රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය අහෝසි කරන ලදී.
   (4) රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය තහවුරු කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා ප්‍රතිපාදන හඳුන්වා දෙන ලදී.
   (5) රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ ක්‍රියාවලිය නිර්දේශපාලනීය කෙරිණි. (......)

10. ජාතික අභිලාෂ සාධනය කරගැනීමට ජාත්‍යන්තර දේශපාලනය තුළ ඇති මාධ්‍යයක් වන්නේ,
   (1) රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ය.
   (2) දේශපාලන පක්ෂ ය.
   (3) බහුජාතික සමාගම් ය.
   (4) ප්‍රභූ කණ්ඩායම් ය.
   (5) සමාජ ව්‍යාපාර ය. (......)

11. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය
   (1) දකුණු ආසියානු කලාපයේ රාජ්‍යවල වැදගත්කම නොසලකා හැරියේ ය.
   (2) සමාජවාදී මතවාදය මගින් මෙහෙයවනු ලැබිණ.
   (3) හැඩගැසුණේ බලයට පත් පාලන තන්ත්‍රවල මතවාද සහ අභිලාෂවලිනි.
   (4) ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීමේ වාසිය සැමවිට ම නොසලකා හැර ඇත.
   (5) එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති මගින් නිශ්චය කරනු ලැබ ඇත. (......)

**12.** දේශපාලන විද්‍යාවේ චර්යාවාදී ප්‍රවේශය
(1) සම්භාව්‍ය ග්‍රීක යුගය දක්වා දිවෙන ඉතිහාසයකට හිමිකම් කියයි.
(2) ආනුභවික පර්යේෂණ සමග සම්බන්ධ විය.
(3) දේශපාලන ආයතනවල ඉතිහාසය අවධාරණය කරයි.
(4) ඇමෙරිකානු දේශපාලන විද්‍යාඥයින්ගේ සහාය ලබා ගැනීමට අසමත් විය.
(5) පුද්ගල දේශපාලන චර්යාව අධ්‍යයනය කිරීම නොසලකා හරියි. (......)

**13.** ආණ්ඩුව
(1) රාජ්‍යයට වඩා දිගුකාලීන පැවැත්මක් සහිත ය.
(2) සමාජයේ දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනයයි.
(3) රාජ්‍යයේ මූලික ආයතනික නියෝජිතයා ය.
(4) ජාතියේ බාහිර ස්වාධිපත්‍යට හිමිකම් කියයි.
(5) රාජ්‍යය යන සංකල්පයට සමාන අර්ථයක් දෙයි. (......)

**14.** ඉන්දියානු නිරාගමිකවාදයෙන් අදහස් කරනුයේ,
(1) සෑම ආගමක් ම රාජ්‍ය ආගම් ලෙස සැලකීමයි.
(2) රාජ්‍යය සියලු ආගම්වලට අපක්ෂපාතව සැලකීමයි.
(3) සියලු පුරවැසියන්ගේ ජනවාර්ගික අනන්‍යතාවලට ගරු කිරීමයි.
(4) සුළුතර ආගම්වලට විශේෂ සැලකිලි දැක්වීමයි.
(5) ආගමික ඉගැන්වීම් සම්බන්ධ මතභේද විසඳීමට ආණ්ඩුව මැදිහත් වීමයි. (......)

**15.** ලිබරල්වාදය
(1) රාජ්‍යය පවතින්නේ පන්ති සහිත සමාජ තුළ බවට තර්ක කරයි.
(2) පුරවැසියන්ගේ පුද්ගලික නිදහස සුරක්ෂිත කිරීම අරමුණ කරගනියි.
(3) වෙළෙඳ කටයුතු තුළ රාජ්‍යයේ මැදිහත්වීම ප්‍රවර්ධනය කරයි.
(4) මාක්ස්වාදීන්ගේ සහයෝගය ලැබූ දේශපාලන මතවාදයකි.
(5) සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය අධෛර්යයට පත් කරයි. (......)

**16.** ස්විස්ටර්ලන්තය
(1) සතු ආණ්ඩුක්‍රමය, අර්ධ සන්ධීය යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රකාශිත ය.
(2) දියුණු සන්ධීය ක්‍රමයක් පවතින සාපේක්ෂ වශයෙන් විශාල රටකි.
(3) හවුල් පාලනයට (shared-rule) සහ ස්වයං පාලනයට (self -rule) ඉඩ සපයන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මූලධර්මයක් සහිත රටකි.
(4) කැන්ටන් ඒකකවලට ස්වයං පාලන බලතල ලබා නොදෙයි.
(5) සතුව තිබෙන්නේ ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයකි. (......)

**17.** ඇමෙරිකානු එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(1) බලතල වෙන්කිරීමට ඉඩ සලසන්නේ නැත.
(2) සමූහාණ්ඩුවාදය ප්‍රතික්ෂේප කොට ඇත.
(3) පෙර පැවති ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසිකොට පිහිටුවනු ලැබ ඇත.
(4) විදේශ රාජ්‍ය සමඟ ගිවිසුම්වලට එළැඹීමට ප්‍රාන්තවලට බලය ලබා දී ඇත.
(5) මධ්‍යම ආණ්ඩුවෙහි බලතල පමණක් දක්වා සිටියි. (......)

**18.** ජනාධිපති ආණ්ඩුක්‍රමයට අදාළ මූලධර්මය වන්නේ,
(1) විධායකය සහ ව්‍යවස්ථාදායකය සඳහා වෙන් වෙන්ව මැතිවරණ පැවැත්වීමයි.
(2) විධායකය එහි පැවැත්ම සඳහා ව්‍යවස්ථාදායකය මත පදනම් වීමයි.
(3) ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයා නොවීමයි.
(4) විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ නිල කාලය එකවර අවසන් වීමයි.
(5) ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම සාපේක්ෂ වශයෙන් පහසු ක්‍රියාදාමයක් වීමයි. (......)

**19.** වෙස්ට්මින්ස්ටර් මාදිලියේ ආණ්ඩුක්‍රමය
(1) ප්‍රංශ ආණ්ඩුක්‍රමයට සමාන වේ.
(2) රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමේ ප්‍රතිපාදන සහිත වේ.
(3) පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලය උත්තරීතර කොට සලකයි.
(4) නීති අධිකරණ විමර්ශනයට ලක් කිරීමට ඉඩ සලසයි.
(5) කැබිනට් අමාත්‍යවරුන්ගේ සාමූහික වගකීමට අවකාශ ලබා නොදෙයි. (......)

**20.** ශ්‍රී ලංකාවේ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(1) සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දුන්නේ ය.
(2) ආණ්ඩුකාරවරයා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා බවට පත් කළේ ය.
(3) ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුක්‍රමයක් සඳහා පදනම දැමී ය.
(4) වාර්ගික නියෝජනය ප්‍රවර්ධනය කළේ ය.
(5) ස්ත්‍රීන්ට ඡන්ද අයිතිය ලබාදීම ප්‍රතික්ෂේප කළේ ය. (……)

- අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරන්න.

**21.** සෝල්බරි ව්‍යවස්ථාවේ වෙස්ට්මින්ස්ටර් ලක්ෂණ වූයේ,
A - අග්‍රාණ්ඩුකාරවරයා නාමමාත්‍ර විධායකය වීම ය.
B - දේශපාලන විධායකය පාර්ලිමේන්තුව මගින් තෝරා පත්කර ගැනීම ය.
C - ව්‍යවස්ථාදායකය ද්වි-මාණ්ඩලික වීම ය.
D - අග්‍රාමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වීම ය.
E - අග්‍රාණ්ඩුකාරවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු වීම ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**22.** ශ්‍රී ලංකාවේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය
A - සිවිල් සහ දේශපාලන අයිතීන් සහතික කරයි.
B - මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධව ඕනෑම අධිකරණයකට පෙත්සම් ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට අවස්ථාව සලසයි.
C - මූලික අයිතිවාසිකම් නඩු විභාග කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ලබා දෙයි.
D - සාමූහික සහ සමාජ අයිතීන් ඇතුළත් නොවීම නිසා විවේචනයට ලක් වේ.
E - හදිසි අවස්ථාවක් පැනවූ විට මූලික අයිතිවාසිකම් මත සීමා ඇති කරයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**23.** සාමය ගොඩනැගීම
A - බිම් මට්ටමේ සාම ප්‍රයත්න පමණක් ප්‍රවර්ධනය කරයි.
B - එක් එක් රටවල සුවිශේෂ තත්ත්වයන්ට අනුව සකස් වේ.
C - දිග්ගැස්සුණු ගැටුම් සිදුවන සමාජයන්හි තිරසර සාමය අවධාරණය කරයි.
D - පුරවැසියන් සහ සිවිල් සමාජ ව්‍යාපාරවල සහභාගිත්වය අවධාරණය කරයි.
E - සාධනීය හා නිෂේධනීය සාමය (positive and negative peace) යන දෙඅංශයෙන් ම සමන්විත වේ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**24.** ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1972) යටතේ පැවැති ව්‍යවස්ථාදායකය
A - අධිකරණ අධීක්ෂණයට යටත් නොවී ය.
B - රාජ්‍ය බලයේ උත්තරීතර ආයතනය ලෙස සැලකිණි.
C - බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ආකෘතියෙන් වෙනස් විය.
D - ද්වි මාණ්ඩලික විය.
E - නිල වශයෙන් හඳුන්වන ලද්දේ ජාතික රාජ්‍ය සභාව ලෙස ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**25.** ඇමෙරිකානු සන්ධීය ආණ්ඩු ක්‍රමය
A - ප්‍රාන්ත රාජ්‍යවල ස්වායත්තතාව යන අදහස මත පදනම් ව ගොඩනැගිණි.
B - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සඳහා ප්‍රාන්ත ව්‍යවස්ථාදායකවල අනුමැතිය අවශ්‍ය බව කියයි.
C - මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩුවලට සමගාමී බලතල ලබා නොදෙයි.
D - ද්වි-මණ්ඩල ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කර ඇත.
E - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරත්වය මූලික පදනම් මූලධර්මයක් වශයෙන් සලකයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැ'යි තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **26.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අධිකරණයෙන් දඬුවම් ලැබූ වරදකරුවකුට සමාව ප්‍රදානය කිරීමේ බලය තිබෙන්නේ ජනාධිපතිවරයාට පමණි. | එම සමාව ප්‍රදානය කිරීමේ බලය ක්‍රියාත්මක කිරීමට පෙර ජනාධිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ උපදෙස් ලබාගත යුතු ය. | (……) |
| **27.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරාගනු ලබන්නේ මැතිවරණ දිස්ත්‍රික්ක පදනම් කරගෙන ය. | ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම්, වාර්ගික සහ ආගමික සාමය මෙන් ම ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීමට පනවා ඇති නෛතික සීමාවන්ට යටත් වේ. | (……) |
| **28.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවැනි සංශෝධනයට අනුව, පාර්ලිමේන්තු සභාව සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවැනි සංශෝධනයට අනුව, පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයන් අතර, සිවිල් සමාජයේ නියෝජිතයන් නැත. | (……) |
| **29.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ සැසි වාර අවසන් කිරීමේ බලය තිබෙන්නේ කථානායකවරයාට ය. | පාර්ලිමේන්තුව විසිර වූවාට පසු ජනාධිපතිවරයා විසින්, ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දිනයක් නියම කිරීම අනිවාර්ය නොවේ. | (……) |
| **30.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වැනි සංශෝධනය යටතේ, පළාත් ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසිනි. | පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නම් කිරීමේ බලතල තිබෙන්නේ ප්‍රධාන අමාත්‍යවරයාට ය. | (……) |

**31. දේශපාලනය පිළිබඳ තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ සම්ප්‍රදාය තුනක් තිබේ. එයින් දෙකක් නම් කරන්න.**

I. සම්භාව්‍ය තුලනාත්මක

II. 20 වැනි සියවසේ තුලනාත්මක

III. සමකාලීන

**32. ලෝකයේ දේශපාලන පක්ෂ ක්‍රම කිහිපයක් තිබේ. ඒවායින් දෙකක් නම් කරන්න.**

I. තනි පක්ෂ ක්‍රමය / ඒක පක්ෂ ක්‍රමය
II. ද්වි පක්ෂ ක්‍රමය
III. අධිපති තනි පක්ෂ ක්‍රමය / අධිපති ඒක පක්ෂ ක්‍රමය
IV. අධිපති ද්වි පක්ෂ ක්‍රමය
V. බහු පක්ෂ ක්‍රමය

**33. දේශපාලන සහ සමාජ න්‍යාය තුළ සිවිල් සමාජය යන සංකල්පය අර්ථ හතරකින් භාවිත වේ. ඒවායින් දෙකක් නම් කරන්න.**

I. සම්භාව්‍ය ලිබරල්වාදී අර්ථය
II. සම්භාව්‍ය මාක්ස්වාදී අර්ථය
III. සාංගමික ප්‍රජාතන්ත්‍රවාදී අර්ථය
IV. නව මාක්ස්වාදී ග්‍රාම්ෂියානු අර්ථය

**34. රාජ්‍යය යනු සමාජයේ ඇති මානව සංවිධාන අතුරෙන් ඉහළම සංවිධානය යන අදහස දක්වන දේශපාලන න්‍යායික ධාරා දෙකක් දේශපාලන චින්තකයන් දෙදෙනෙකු සමඟ අනන්‍ය වී ඇත. එම ධාරා දෙක මොනවා ද?**

I. ඇරිස්ටෝටලියානු අර්ථය - ඇරිස්ටෝටල්
II. වෙබේරියානු අර්ථය - මැක්ස් වේබර්

**35. (1) ස්ත්‍රීන් දේශපාලන ක්ෂේත්‍රයෙන් බැහැර කිරීම ප්‍රශ්න කරන්නේ දේශපාලන අධ්‍යයනයේ ඇති කවර ප්‍රවේශයෙන් ද?**

ස්ත්‍රීවාදී ප්‍රවේශය/ ස්ත්‍රීවාදය

**(2) ආර්ථික සහ සමාජ පන්ති යන සාධක මඟින් දේශපාලනය තීරණය කරන බව සැලකෙන්නේ කවර දේශපාලන අධ්‍යයන ප්‍රවේශයෙන් ද?**

මාක්ස්වාදී ප්‍රවේශය/දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය/ ඓතිහාසික භෞතිකවාදය / සමාජවාදී ප්‍රවේශය

**36. (1) නීතිය සියලු පුද්ගලයින් සඳහා එක සමාන ලෙසින් ක්‍රියාත්මක කළ යුතු ය යන අදහස අවධාරණය කරන නීතියේ ආධිපත්‍යයට (Rule of Law) අයත් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මය කුමක් ද?**

නීතිය ඉදිරියේ සමානත්වය/ නීතිය පාලකයාට හා පලිතයාට එක සමානව ක්‍රියාත්මක කිරීම

**(2) ආණ්ඩුවේ බලය එක ආයතනයක් වෙත කේන්ද්‍රගත වීම වැළැක්වීමට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල භාවිත කරන මූලධර්මය කුමක් ද?**

බලතල වෙන් කිරීම/ බලතල බෙදීම / බලතල පංගු කිරීම

**37. (1) ඉන්දියානු ආණ්ඩුක්‍රමය සකස් වී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය කුමක් ද?**

අර්ධ - සන්ධීය මාදිලිය

**(2) ප්‍රංශ ආණ්ඩුක්‍රමය සකස් වී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය කුමක් ද?**

ඒකීය/ ඒකීය මධ්‍යගත

**38. නිලබල ක්‍රමය පිළිබඳ මැක්ස් වෙබර්ගේ න්‍යාය තුළ ආධිපත්‍ය ක්‍රම තුනක් තිබේ. ඒවායින් දෙකක් නම් කරන්න.**

I. සාම්ප්‍රදායික
II. අනුහස් හෙවත් කැරිස්මාවාදී
III. නෛතික - තාර්කික

**39. (1) ශ්‍රී ලංකාවේ මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව බලයට පත් වූයේ කුමන වසරේදී ද?**

1956

**(2) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විසිවන සංශෝධනය හඳුන්වා දුන්නේ කුමන වසරේදී ද?**

2020

**40. 1833 දී ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමයට සහ අධිකරණ පරිපාලනයට ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කළ කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනා නම් කරන්න.**

I. කෝල්බෲක්, විලියම් කෝල්බෲක්
II. කැමරන්, චාල්ස් කැමරන්, සී.එච්.කැමරන්

**41. ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාවෙහි 13 වන සංශෝධනය යටතේ හඳුන්වා දුන් බලය විමධ්‍යගත කිරීමේ ක්‍රමය තුළ බලතල ලැයිස්තු තුනක් තිබේ. ඒවායින් දෙකක් නම් කරන්න.**

I. පළාත් සභා ලැයිස්තුව
II. සමගාමී ලැයිස්තුව
III. මධ්‍යම ලැයිස්තුව/ සංවෘත ලැයිස්තුව

**42. රාජ්‍ය ස්වාධිපත්‍යයෙහි ඇති පැතිකඩ දෙක නම් කරන්න.**

I. අභ්‍යන්තර ස්වාධිපත්‍යය
II. බාහිර ස්වාධිපත්‍යය

**43. 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව ආයතන තුනකින් සමන්විත විය. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉන් එකකි. අනෙක් ආයතන දෙක කවරේ ද?**

I. අග්‍රාණ්ඩුකාරවරයා/ රැජිණ/ බ්‍රිතාන්‍ය කිරීටය
II. සෙනේට් සභාව/ උත්තර මන්ත්‍රී මණ්ඩලය/ දෙවැනි මණ්ඩලය/ ඉහළ මණ්ඩලය

**44. (1) නූතන ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය දාහත්වැනි සියවසේ දී යුරෝපයේ අත්සන් කරන ලද සාම ගිවිසුමක් මත පදනම් විය. එම ගිවිසුම නම් කරන්න.**

වෙස්ට්ෆේලියානු ගිවිසුම

**(2) කුඩා රාජ්‍යයන් ලෝකයේ මහ බලවතුන්ගෙන් අපක්ෂපාතව සිටිය යුතු ය යන මූලධර්මය අවධාරණය කළ විදේශ ප්‍රතිපත්ති ප්‍රවේශය නම් කරන්න.**

නොබැඳි පිළිවෙත

**45. (1) ලෝකය බල කඳවුරු දෙකකට බෙදුණු ලෝක ක්‍රමය විස්තර කෙරෙන සංකල්පය කුමක් ද?**

ද්වි ද්‍රැවීය ලෝක ක්‍රමය, ද්වි බල ද්‍රැවීය ලෝක ක්‍රමය

**(2) තනි ලෝක බලවතෙකු සහිත ලෝක ක්‍රමය විස්තර කෙරෙන සංකල්පය කුමක් ද?**

ඒක ද්‍රැවීය ලෝක ක්‍රමය, ඒක බල ද්‍රැවීය ලෝක ක්‍රමය

**46. ගැටුම් වැළැක්වීමේ ක්‍රම දෙකක් තිබේ. ඒවා මොනවා ද?**

I. සරළ වැළැක්වීම
II. ගැඹුරු වැළැක්වීම

**47. රාජ්‍ය ප්‍රතිපත්ති හැදෑරීම දෙයාකාර ස්වභාවයක් ගනී. ඒවා මොනවා ද?**

I. ප්‍රතිපත්ති සම්බන්ධ හැදෑරීම
II. ප්‍රතිපත්ති තුළ හැදෑරීම

**48. (1) රාජ්‍යය රහිතව පෙර පැවති මනුෂ්‍යයන් ජීවත් වූ තත්ත්වය හැඳින්වීමට සමාජ සම්මුතිවාදී න්‍යාය භාවිත කළ සංකල්පය කුමක් ද?**

ස්වාභාවික තත්වය/ ප්‍රකෘති තත්වය/ පූර්ව - රාජ්‍ය තත්වය

**(2) ලිබරල්වාදී දේශපාලන න්‍යායේ ආරම්භක දේශපාලන දාර්ශනිකයා නම් කරන්න.**

ජෝන් ලොක්, ලොක්

**49. (1) රාජ්‍ය වන්දනය අවධාරණය කළ විසිවන සියවසේ දේශපාලන මතවාදය කුමක් ද?**

නට්සිවාදය/ ෆැසිස්ට් වාදය/ නාසිවාදය

**(2) තෝමස් හොබ්ස් විසින් රචනා කරන ලද දේශපාලන න්‍යායට අයත් කෘතිය නම් කරන්න.**

ලෙවියාතන්

**50. මතවාදයක් ලෙස ජාතිකවාදය හඳුනාගත හැකි ප්‍රවේශ තුනක් තිබේ. ඉන් දෙකක් නම් කරන්න.**

I. චිරන්තනවාදී
II. නූතනවාදී
III. මෙවළම්වාදී / උපකරණවාදී

## 2.3 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය

### වගුව 2.1

1- A කොටසෙහි ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | ප්‍රශ්න අංකය | නිවැරදි වරණය |
|---|---|---|---|
| 01. | 4 | 16. | 3 |
| 02. | 3 | 17. | 5 |
| 03. | 5 | 18. | 1 |
| 04. | 4 | 19. | 3 |
| 05. | 4 | 20. | 3 |
| 06. | 2 | 21. | 1 |
| 07. | 4 | 22. | 4 |
| 08. | 1 | 23. | 5 |
| 09. | 2 | 24. | 2 |
| 10. | 1 | 25. | 3 |
| 11. | 3 | 26. | 2 |
| 12. | 2 | 27. | 1 |
| 13. | 3 | 28. | 5 |
| 14. | 2 | 29. | 4 |
| 15. | 2 | 30. | 3 |

මූලාශ්‍රය - අ.පො.ස (උ.පෙළ) දේශපාලන විද්‍යාව ලකුණු දීමේ පටිපාටිය, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 60කි.

කෙටි ලිඛිත පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40කි.

පත්‍රයේ මුළු ලකුණු - 60+40 =100

## 2.4 I පත්‍රයේ වරණ තෝරා ඇති ආකාරය

**වගුව 2.2**

1- A කොටසෙහි එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය


| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ගෙන ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | උත්සහ නොකළ |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | |
| 1 | 4 | 6.42 | 7.15 | 4.48 | 79.80 | 1.78 | 0.36 |
| 2 | 3 | 4.65 | 16.40 | 65.25 | 0.93 | 11.96 | 0.81 |
| 3 | 5 | 6.34 | 4.65 | 2.79 | 24.48 | 61.09 | 0.65 |
| 4 | 4 | 16.00 | 22.71 | 7.15 | 48.36 | 4.36 | 1.41 |
| 5 | 4 | 8.77 | 11.23 | 24.04 | 39.64 | 14.83 | 1.49 |
| 6 | 2 | 10.75 | 68.93 | 6.06 | 11.11 | 2.42 | 0.73 |
| 7 | 4 | 16.69 | 8.57 | 21.09 | 45.17 | 7.27 | 1.21 |
| 8 | 1 | 49.05 | 11.56 | 20.08 | 4.77 | 13.37 | 1.17 |
| 9 | 2 | 9.86 | 34.26 | 9.17 | 38.83 | 5.90 | 1.98 |
| 10 | 1 | 63.23 | 9.82 | 19.68 | 1.94 | 4.65 | 0.69 |
| 11 | 3 | 6.22 | 15.07 | 54.18 | 6.42 | 17.01 | 1.09 |
| 12 | 2 | 25.01 | 57.01 | 8.12 | 2.46 | 6.38 | 1.01 |
| 13 | 3 | 2.55 | 23.35 | 67.15 | 2.14 | 4.20 | 0.61 |
| 14 | 2 | 14.10 | 54.34 | 21.29 | 3.35 | 6.02 | 0.89 |
| 15 | 2 | 6.99 | 73.78 | 4.69 | 11.92 | 1.78 | 0.85 |
| 16 | 3 | 15.60 | 24.00 | 39.03 | 8.20 | 11.72 | 1.45 |
| 17 | 5 | 7.68 | 13.45 | 26.63 | 29.33 | 20.97 | 1.94 |
| 18 | 1 | 64.40 | 17.90 | 3.07 | 11.11 | 2.42 | 1.09 |
| 19 | 3 | 17.86 | 17.21 | 43.72 | 14.87 | 5.01 | 1.33 |
| 20 | 3 | 24.85 | 15.11 | 46.18 | 8.77 | 3.84 | 1.25 |
| 21 | 1 | 47.56 | 11.96 | 10.71 | 16.93 | 11.56 | 1.29 |
| 22 | 4 | 14.26 | 38.42 | 7.35 | 30.79 | 7.60 | 1.58 |
| 23 | 5 | 8.12 | 12.65 | 6.87 | 10.10 | 61.29 | 0.97 |
| 24 | 2 | 5.66 | 48.32 | 18.38 | 5.58 | 20.57 | 1.49 |
| 25 | 3 | 8.85 | 13.37 | 53.58 | 9.05 | 13.86 | 1.29 |
| 26 | 2 | 15.84 | 28.57 | 5.13 | 4.44 | 44.32 | 1.70 |
| 27 | 1 | 42.75 | 23.84 | 18.18 | 9.05 | 4.69 | 1.49 |
| 28 | 5 | 15.92 | 17.33 | 18.55 | 25.25 | 20.97 | 1.98 |
| 29 | 4 | 15.43 | 35.60 | 11.27 | 30.02 | 6.14 | 1.54 |
| 30 | 3 | 15.96 | 8.24 | 33.33 | 21.94 | 18.51 | 2.02 |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී.ලං.වි.දෙ.

## 2.5 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක

**ප්‍රස්තාරය 2.1**

I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/5/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

## 2.6 I පත්‍රයේ විශ්ලේෂණය

දේශපාලන විද්‍යාව I පත්‍රය A හා B යනුවෙන් කොටස් දෙකකි. A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් හා B කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20කින් යුක්ත වේ. A කොටසෙහි පහසුතාව 70%ක් හෝ ඊට වැඩි ප්‍රශ්න ගණන දෙකකි. එම ප්‍රශ්න වන්නේ 01 හා 15 යන ප්‍රශ්නයි. එමෙන්ම පහසුතාව 40%ට වඩා අඩු ප්‍රශ්න ගණන 8කි. එම ප්‍රශ්න වන්නේ 9, 16, 17, 22, 26, 28, 29 සහ 30 ප්‍රශ්නයි. එම ප්‍රශ්න අතුරෙන් පහසුතාව අඩුම ප්‍රශ්න වන්නේ 17 සහ 28 ප්‍රශ්නයි.

B කොටසෙහි ප්‍රශ්න අංක 32හි පහසුතාව 73%කි. පහසුතාව 40%ට අඩු ප්‍රශ්න 12කි. එම ප්‍රශ්න වන්නේ 33, 34, 36, 37, 38, 39, 44, 45, 46, 47, 48 සහ 50 ප්‍රශ්නයි. මෙම ප්‍රශ්න අතුරෙන් පහසුතාව අඩුම 38 ප්‍රශ්නයෙහි පහසුතාව 17%කි. සමස්තයක් ලෙස පළමු පත්‍රයේ A කොටසෙහි හා B කොටසෙහි පහසුතාව අඩු ප්‍රශ්නවලට අදාළ විෂය කරුණු පිළිබඳව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ අවධානය යොමු කිරීම වැදගත් වේ.

A කොටස

I පත්‍රයේ A කොටස දේශපාලන විද්‍යා විෂය නිර්දේශයේ නිපුණතා 14ක් ආවරණය වන පරිදි බහුවරණ ප්‍රශ්න 30කින් සමන්විත වේ. ප්‍රශ්නවල පහසුතාව 21% - 80% දක්වා පරාසයක විහිදී ඇත. බහුවරණ ප්‍රශ්න 30 අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්න අංක 1හි පහසුතාව 80%කි. එම ප්‍රශ්නය දැනුම හා අවබෝධය මත පදනම් වූ ප්‍රශ්නයක් වීම සාධනය වැඩි වීමට හේතු වී ඇත.

පහසුතාව අඩුම ප්‍රශ්න දෙකකි. එනම්, 17 සහ 28 ප්‍රශ්නයි. 17 ප්‍රශ්නයෙහි අඩු සාධනයට නිර්දේශිත රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධයෙන් බොහෝ අපේක්ෂකයන් සතුව තුලනාත්මක අවබෝධයක් නොමැති වීම හේතු වී තිබිය හැකි ය. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය පිළිබඳ අපේක්ෂකයන් සතු ප්‍රායෝගික අවබෝධය සීමා වීම 28 ප්‍රශ්නයෙහි පහසුතාව අඩු වීමට හේතු වී තිබිය හැකි ය.

B කොටස

I පත්‍රයෙහි B කොටසෙහි පහසුතාව වැඩිම 32 ප්‍රශ්නයෙහි පහසුතාව 73%කි. විවිධ ඉගෙනුම් අවධිවල දී අධ්‍යයනයට බඳුන් වූ සරල විෂය කොටසක් වීම නිසා අපේක්ෂකයන්ට මතකයෙන් පිළිතුරු ලබා දීමට හැකිවීම මෙම ඉහළ සාධනයට හේතු වූවා විය හැකි ය.

පහසුතාව අඩුම 38 ප්‍රශ්නයෙහි පහසුතාව 17%කි. නිලබල ක්‍රමය පිළිබඳ අපේක්ෂකයන් සතු න්‍යායාත්මක දැනුම ප්‍රමාණවත් නොවීම මෙහි පහසුතාව අඩු වීමට හේතු වන්නට ඇත.

## 2.7 නිපුණතා අනුව විශ්ලේෂණය

**වගුව 2.3**


නිපුණතා අනුව 1කොටසට අදාළ ප්‍රශ්න අංක

| නිපුණතාවය | **A** කොටසට අදාළ ප්‍රශ්න අංක | **B** කොටසට අදාළ ප්‍රශ්න අංක |
|---|---|---|
| 01. දේශපාලනයේ සහ දේශපාලන විද්‍යාවේ ස්වභාවය හඳුනාගත් පුරවැසියකු ලෙස ක්‍රියා කරයි. | 1,2,12 | 31 |
| 02. දේශපාලන විද්‍යා විෂය සමන්විත වන ක්ෂේත්‍ර හඳුනාගනිමින් දේශපාලන විද්‍යාව අධ්‍යයනය කරයි. | 13 | 32, 33 |
| 03. තමා ද පුරවැසියකු වන රාජ්‍ය පිළිබඳව න්‍යායික සහ ප්‍රායෝගික අවබෝධයකට පදනම සකසා ගනියි. | - | 34, 42, 48 |
| 04. ලෝකයේ පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති ප්‍රභේද ආශ්‍රයෙන් ආණ්ඩුක්‍රම විග්‍රහ කිරීමට ඇත හැකියාව ප්‍රකාශ කරයි. | 18 | - |
| 05. දේශපාලන මතවාදවල ස්වභාවය සහ කාර්ය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 4,14,15 | 35,49, 50 |
| 06. ගැටුම්වල ස්වභාවය අවබෝධ කොටගෙන ගැටුම් නිරාකරණය සහ සාමය ගොඩනැගීම පිළිබඳ අවශ්‍යතාව ප්‍රකාශ කරයි. | 23 | 46 |
| 07. ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනයේ සමාජ, ආර්ථික සහ දේශපාලන පැතිකඩ හඳුනාගනියි. | 20 | 40 |
| 08. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවර්ධනය පිළිබඳ අවබෝධ ප්‍රදර්ශනය කරයි. | 9,19,21,24 | 43 |
| 09. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ ඇති අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 3,5 | 36 |
| 10. සමකාලීන ලෝකයේ පවත්නා විවිධ ආණ්ඩුක්‍රම මාදිලි පිළිබඳ තුලනාත්මක අවබෝධයකින් යුතු පුද්ගලයෙකු ලෙස ක්‍රියා කරයි. | 16,17,25 | 37, 41 |
| 11. රාජ්‍ය ප්‍රතිපත්ති දේශපාලන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක්ය යන අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 6 | 38, 47 |
| 12. 1978 ව්‍යවස්ථාව යටතේ ඇති වූ ආණ්ඩුක්‍රමයේ ව්‍යුහාත්මක ලක්ෂණ, ආයතනික සංයුතිය සහ බල තුලනය හඳුනාගෙන පැහැදිලි කරයි. | 8,22,26,27,28, 29,30 | 39 |
| 13. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වභාවය සහ ප්‍රවණතා ඒවායේ ක්‍රියාකාරීත්වය ඔස්සේ ගෙන හැර දක්වයි. | 7 | - |
| 14. ජාත්‍යන්තර දේශපාලනයේ ස්වභාවය හා ප්‍රවණතා හඳුනාගෙන අදහස් දක්වයි. | 10 | 44,45 |
| 15. බාහිර ලෝකය සමඟ ශ්‍රී ලංකාව පවත්වන සම්බන්ධතාවල ස්වභාවය සහ ඵල විපාක පිළිබඳ අවබෝධයෙන් අදහස් දක්වයි. | 11 | - |

## 2.8 නිපුණතා අනුව පහසුතා දර්ශකය

**ප්‍රස්තාරය 2.2**


I පත්‍රයේ A කොටසෙහි විෂය නිපුණතා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/5/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 2.3**

I පත්‍රයේ B කොටසෙහි විෂය නිපුණතා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/5/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

## 2.9 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

09 ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 8 නිපුණතාවට අදාළ වෙස්ට්මිනිස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතිය හා එහි වෙනස්කම් පාඩම ඇසුරින් ඉදිරිපත් කර ඇත. අපේක්ෂකයන් අතුරෙන් 34.26%ක් නිවැරදි පිළිතුර වන 2 වරණය තෝරාගෙන ඇත. නමුත් අපේක්ෂකයන් අතුරෙන් 38.83%ක් නිවැරදි පිළිතුරු ලෙස තෝරාගෙන ඇත්තේ 4 වරණයයි.

1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රමයේ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය පිළිබඳව පැහැදිලි කිරීමේ දී එය දේශපාලනීකරණය වූ ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගෙන ඇත. නමුත් බොහෝ අපේක්ෂකයන්ට රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය හා දේශපාලනීකරණය වූ ආකාරය පිළිබඳව අවබෝධයක් නොතිබුණු බව පෙනේ. එහිදී සමහර අපේක්ෂකයන්ට ඒ ඒ ආණ්ඩුක්‍රමවල සුවිශේෂී ලක්ෂණ වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීම අභියෝගාත්මක වී ඇත.

1947 සෝල්බරි ආණ්ඩුක්‍රමයේ හා 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමයේ ආයතන පිළිබඳ පැහැදිලි කර දීමේ දී නිරවුල්ව හා නිශ්චිත දැනුමක් මෙන් ම අවබෝධයක් සංසන්දනාත්මකව සිසුන්ට ලබා දීම අත්‍යවශ්‍ය වේ.

17 ප්‍රශ්නය 13 ශ්‍රේණියේ 10 නිපුණතාවට අදාළ ආණ්ඩුක්‍රම මාදිලි පාඩම ඇසුරින් ඉදිරිපත් කර ඇත. අපේක්ෂකයන් 20.97%ක් නිවැරදි පිළිතුර වන 5 වරණය තෝරාගෙන ඇත. නමුත් අපේක්ෂකයන් 29.33%ක් නිවැරදි පිළිතුර ලෙස තෝරාගෙන ඇත්තේ 4 වරණයයි. එමෙන් ම 26.63%ක් නිවැරදි පිළිතුර ලෙස 3 වරණය තෝරා ගෙන ඇත.

ආණ්ඩුක්‍රම මාදිලි යටතේ ඇමරිකා එක්සත් ජනපද ආණ්ඩුක්‍රමයේ බලය බෙදාහැරීම පිළිබඳ සඳහන් කර ඇත. එම ආණ්ඩුක්‍රමයේ ව්‍යුහය හා බලය බෙදාහැර ඇති ආකාරය පිළිබඳව පුළුල් අවබෝධයක් අපේක්ෂකයන් සතු නොවීම ද මෙලෙස වැරදි වරණ වෙත බහුතරයක් අපේක්ෂකයන් යොමු වීමට හේතු වූවා විය හැකි ය.

එක් එක් රටවල ආණ්ඩුක්‍රම ආකෘති හා මාදිලි අතර පවතින වෙනසත්, ඒවායේ බලය බෙදාහැර ඇති ආකාරය හා විමධ්‍යගත කර ඇති ආකාරයත් පිළිබඳ නිරවුල් හා නිශ්චිත දැනුමත් ලැබෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම අවශ්‍යව ඇත.

26, 28 හා 29 ප්‍රශ්න 13 ශ්‍රේණියේ 12 නිපුණතාවට අදාළ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය පාඩම ඇසුරින් ඉදිරිපත් කර ඇත. මෙම ප්‍රශ්න 03 පිළිබඳව පොදුවේ සලකා බැලීමේ දී දක්නට හැකි තත්ත්වයක් වන්නේ අපේක්ෂකයන්ගෙන් වැඩි ප්‍රතිශතයක් නිවැරදි වරණය පිළිතුර ලෙස තෝරාගෙන නොමැති බවයි. 26 ප්‍රශ්නයට අදාළ ව අපේක්ෂකයන් 28.57%ක් ද, 28 ප්‍රශ්නයට අදාළ ව අපේක්ෂකයන් 20.97%ක් ද, 29 ප්‍රශ්නයට අදාළ ව අපේක්ෂකයන් 30.02%ක් ද නිවැරදි පිළිතුර තෝරාගෙන ඇත. නමුත් එම ප්‍රශ්න සඳහා වැරදි වරණ තෝරාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය ඉහළ මට්ටමක පවතී. 26 ප්‍රශ්නයේ 44.32%ක් 5 වරණය ද, 28 ප්‍රශ්නයේ 25.25%ක් 4 වරණය ද 29 ප්‍රශ්නයේ 35.60%ක් දෙවන වරණය ද පිළිතුර ලෙස තෝරාගෙන තිබීමෙන් ඒ බව

සනාථ වේ. මෙම ප්‍රශ්න, 13 ශ්‍රේණියේ අවසාන විෂයය කොටස්වලින් යොමුකර ඇති අතර අපේක්ෂකයන් සතුව නිවැරදි විෂයය කරුණු පිළිබඳව මනා අවබෝධයක් නොතිබීම මෙලෙස වැරදි පිළිතුරු කරා බහුතරයක් අපේක්ෂකයන් යොමු වීමට හේතු වී තිබිය හැකි ය. එමෙන් ම මෙම ප්‍රශ්න තුන මගින් ප්‍රකාශ දෙකක් ලබා දී ඇති අතර එම ප්‍රකාශ දෙකෙහි සත්‍ය අසත්‍යතාව සම්බන්ධව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර ඇත. මෙහි දී අපේක්ෂකයන් සතුව මෙම ප්‍රකාශ දෙක සම්බන්ධයෙන් නිශ්චිත අවබෝධයක් තිබිය යුතු අතර ප්‍රකාශ දෙක අතර සම්බන්ධතාවය පිළිබඳව ද අවබෝධයක් තිබිය යුතු ය. අපේක්ෂකයන් ප්‍රකාශ නිවැරදිව හඳුනා ගත්ත ද ඒවා අතර සම්බන්ධතාවය පිළිබඳ අනවබෝධය මෙම ප්‍රශ්න තුනෙහි වැරදි පිළිතුරු කරා අපේක්ෂකයන් බහුතරයක් යොමු වීමට හේතු වී තිබිය හැකි ය.

I පත්‍රයේ B කොටසෙහි පහසුතාව 70%ට වඩා වැඩි ප්‍රශ්න සංඛ්‍යාව 1කි. ඒ ප්‍රශ්න අංක 32යි. එම කොටසෙහි 20%ට වඩා අඩු පහසුතාවක් සහිත ප්‍රශ්න 4කි. එම ප්‍රශ්න වන්නේ අංක 38, 44, 45, සහ 48 වේ.

32 ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 2 නිපුණතාවට අදාළව සකසා ඇත. එහි පහසුතාව 73%කි. සමකාලීන ලෝකයේ දේශපාලන ආයතන අතර ඇති වැදගත් මාතෘකාවක් වන දේශපාලන පක්ෂ ක්‍රම පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම මෙහිදී අපේක්ෂා කර ඇත. 9 ශ්‍රේණියේ සිට දේශපාලන පක්ෂ ක්‍රම පිළිබඳ අවධානය යොමු වීමත් පක්ෂ පිළිබඳව අපේක්ෂකයන්ගේ ප්‍රායෝගික අවබෝධය පුළුල් වීමත් මෙහි පහසුතාව වැඩි වීමට හේතු වී ඇත.

38 ප්‍රශ්නය 13 ශ්‍රේණියේ 11 නිපුණතාවට අදාළව සකසා ඇත. මෙහි පහසුතාව 17%කි. රාජ්‍ය ප්‍රතිපත්ති හා නිලබල ක්‍රමය අතර පවතින සම්බන්ධතාවය විග්‍රහ කිරීමේ දී මැක්ස් වෙබර් ඉදිරිපත් කරන න්‍යායාත්මක කරුණු කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු කරයි. නමුත් ඒ පසුබිමෙහි පවතින නිලබල ක්‍රමයට අදාළ අධිකාරී ක්‍රම පිළිබඳව බොහෝ අපේක්ෂකයන් සතු න්‍යායාත්මක දැනුම ප්‍රමාණවත් නොවීම මෙහි පහසුතාව අඩු වීමට හේතු වී ඇත. පවතින සමාජයේ නිලබල ක්‍රමය ගොඩනැගීමට බලපා ඇති අධිකාරී ක්‍රම පිළිබඳ න්‍යායාත්මක දැනුම වර්තමාන ලෝකයේ උදාහරණ සහිතව සිසුන් වෙත ලබාදීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ය.

44 ප්‍රශ්නය 3, 14 සහ 15 යන නිපුණතාවලට අදාළව කොටස් දෙකක් ලෙස සකසා ඇත. මෙහි සමස්ත පහසුතාව 19%කි. මෙහි පළමු කොටස නූතන ජාතික රාජ්‍ය බිහිවීමේ පසුබිමට අදාළව අපේක්ෂකයන්ගේ අවබෝධය පරීක්ෂා කිරීම සඳහා සකසා ඇත. නමුත් පහසුතාව අඩු වීම තුළින් පැහැදිලි වන්නේ නූතන ජාතික රාජ්‍ය බිහිවීමේ පසුබිම පිළිබඳ බොහෝ අපේක්ෂකයන්ට ප්‍රාමාණික අවබෝධයක් නොතිබුණු බවයි. මෙම ප්‍රශ්නයෙහි දෙවන කොටසින් දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝකය ප්‍රධාන බල කඳවුරු දෙකකට බෙදී යාම හා එම කඳවුරුවලට සම්බන්ධ නොවී නොබැඳි පිළිවෙතක් අනුගමනය කළ කුඩා රාජ්‍යයන් පිළිබඳ අවධානය යොමුකිරීම සිදුකර ඇත. නමුත් විෂය නිර්දේශයේ අවසාන ඒකක කෙරෙහි අවධානය අඩු මට්ටමක පැවතීමත් අපේක්ෂකයන්ගේ ප්‍රායෝගික අවබෝධය පුළුල් නොවීමත් නිසා මෙහි පහසුතාව අඩු වන්නට ඇත.

45 ප්‍රශ්නයද 13 ශ්‍රේණියේ 14 නිපුණතාවට අදාළව සකසා ඇත. මෙහි පහසුතාව 18%කි. අන්තර්ජාතික දේශපාලනයේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය පිළිබද අපේක්ෂකයන් ප්‍රමාණවත් ලෙස අවධානය යොමු නොකිරීම මෙහි පහසුතාව අඩු වීමට හේතු වී ඇත. මේ සඳහා ජාතික මෙන්ම අන්තර්ජාතික දේශපාලනය පිළිබඳව සිසුන්ගේ දැනුම සහ ප්‍රායෝගික අවබෝධය යාවත්කාලීන කිරීම සඳහා අන්තර්ජාලයද භාවිත කරමින් විවිධ වැඩසටහන් සංවිධානය කරගැනීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් විය යුතුය.

48 ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 3 නිපුණතාවට අදාළව සකසා ඇත.මෙහි පහසුතාව 18%කි. රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ පැහැදිලි කරන න්‍යායාත්මක සංකල්ප පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙමඟින් අපේක්ෂා කර ඇත. නමුත් න්‍යායාත්මක සංකල්ප බොහෝ අපේක්ෂකයන්ගේ සියුම් අවධානයට ලක්නොවීම මෙහි පහසුතාව අඩු වීමට හේතුවක් විය හැකිය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දේශපාලන විද්‍යාවේ මූලික සංකල්පයක් වන රාජ්‍ය පිළිබඳ විග්‍රහ කිරීමේ දී එහි ස්වභාවය එක් එක් න්‍යායන් ඇසුරින් පැහැදිලි කරන විට ඒවා ඉදිරිපත් කළ චින්තකයින් හා ඔවුන්ගේ අදහස් පිළිබඳව සුවිශේෂී අවධානයක් යොමු කරමින් අධ්‍යයනය කළ යුතු අතර මේ පිළිබඳ ලියැවී ඇති පොත්පත් පරිශීලනයටද මඟ පෙන්විය යුතුය.

# III කොටස

## 3 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - II පත්‍රය

### 3.1 දේශපාලන විද්‍යාව II පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03යි (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10යි)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. මෙම කොටස්වලින් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ප්‍රශ්න පහකට ලකුණු 100කි.

I කොටස - රචනා හා අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න තුනකින් සමන්විත වේ. අවම වශයෙන් එක් ප්‍රශ්නයකට පිළිතුරු සැපයිය යුතුය.

II කොටස - රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න හතරකින් සමන්විත වේ. අවම වශයෙන් ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතුය.

III කොටස - රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න තුනකින් සමන්විත වේ. අවම වශයෙන් ප්‍රශ්න එකකට පිළිතුරු සැපයිය යුතුය.


II පත්‍රය සඳහා මුළු ලකුණු 100කි.

**මූලාශ්‍රය :** අ.පො.ස (උ.පෙළ) විභාගය, වර්ෂ 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න, 2018, ශ්‍රී.ලං.වි.දෙ.

## 3.2 II පත්‍රයේ විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.1**

II පත්‍රයේ එක් එක් ප්‍රශ්නවල පහසුතාව හා ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මූලාශ්‍රය : RD/16/4/AL, RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2021, ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. I කොටසට අයත් ප්‍රශ්න තුනෙන් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද II කොටසට අයත් ප්‍රශ්න 4න් දෙකක් ද, III කොටසට අයත් ප්‍රශ්න 3න් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු වේ.

I ප්‍රශ්නය "දේශපාලන විද්‍යාවේ ස්වභාවය හා විෂය ක්ෂේත්‍රය" ඇසුරින් සකස් කර ඇත. මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය - 41%කි මෙහි පහසුතාව 22%කි. සමාජ විද්‍යාත්මක ප්‍රවේශය පිළිබඳ බොහෝ අපේක්ෂකයන්ට පැහැදිලි නිරවුල් අවබෝධයක් නොමැති වීම මෙම අඩු සාධනයට හේතු වී තිබිය හැකි ය. සමහර අපේක්ෂකයන් සතු පිළිතුරු සැපයීම පිළිබඳ න්‍යායාත්මක දැනුම අවම වීම ද මෙයට බලපා තිබිය හැකි ය.

2 ප්‍රශ්නය පිළිතුරු සැපයීමට තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 48%ක් වන අතර එහි පහසුතාව 45%කි. මෙය කොටස් කිහිපයකින් යුත් ප්‍රශ්නයක් වීමත් පළමු ප්‍රශ්නයට සාපේක්ෂව සරල වීම හා නිශ්චිත විෂය කරුණු වලින් යුක්ත වීම මෙම සාධනයට හේතු වී තිබිය හැකි ය.


3 ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගත් අපේක්ෂක ප්‍රතිශතය 85%කි. රාජ්‍ය යන මාතෘකාව අපේක්ෂකයන් තුළ ජනප්‍රිය මාතෘකාවක් වීම මෙවැනි ඉහළ තෝරාගැනීමකට හේතුවක් විය හැකි ය. තවද අනුකොටස් 3කින් සමන්විත වීම නිසා පහසුවෙන් ලකුණු ලබා ගැනීමට හැකියාව පවතින බව අපේක්ෂකයන් උපකල්පනය කිරීම ද මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගන්නට හේතු වන්නට ඇත. එහෙත් මෙම ප්‍රශ්නයේ පහසුතාව 44%ක් වැනි මධ්‍යස්ථ අගයකි. ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී න්‍යායාත්මක සංකල්ප පිළිබඳ සමහර අපේක්ෂකයන් සතුව නිවැරදි අවබෝධයක් නොතිබීම මෙම මධ්‍යස්ථ සාධනයට හේතු වූවා විය හැකි ය.

II කොටස ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමය ආවරණය වන පරිදි ප්‍රශ්න 4කින් සමන්විත වේ. 4 ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂක ප්‍රතිශතය 90%කි. සමස්ත දෙවන කොටසේ ප්‍රශ්න අතුරෙන් ජනප්‍රිය ප්‍රශ්නය වී ඇත්තේ මෙම ප්‍රශ්නයයි. නමුත් මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 46%කි. මෙම ප්‍රශ්නය සරල විෂය කරුණුවලින් යුක්ත වීම හා පහළ ශ්‍රේණිවල සිටම ඉතිහාසය, පුරවැසි අධ්‍යාපනය වැනි විෂයයන් තුළින් ද අදාළ මාතෘකාව පිළිබඳ පෙර දැනුමක් ලැබී තිබීම මෙම ප්‍රශ්නය බහුතරයක් අපේක්ෂකයන් විසින් තෝරා ගැනීමට හේතු වී තිබිය හැකි ය. ප්‍රශ්නයට අදාළව පිළිතුර සඳහා නිශ්චිත කරුණු ඉදිරිපත් කිරීමට සමහර අපේක්ෂකයන් අපොහොසත් වීම අඩු සාධනයට හේතුවක් විය හැකිය. II කොටස දෙස අවධානය යොමු කිරීමේ දී පහසුතාව වැඩිම 5 ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 60%කි. 4 ප්‍රශ්නය හා සැලකීමේ දී 5 ප්‍රශ්නය පහසුතාව වැඩි වුව ද එය අපේක්ෂකයන් අතර ජනප්‍රිය ප්‍රශ්නයක් බවට පත්ව නැත. ප්‍රශ්න තෝරා ගැනීමේ දී පහසුවෙන් ලකුණු ලබා ගත හැකි ප්‍රශ්න තෝරා ගැනීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී සිසුන්ට අවශ්‍ය පුහුණුව ලබාදිය යුතු ය.

III කොටස ප්‍රශ්න 3කින් යුක්ත වන අතර අපේක්ෂකයන්ගෙන් 95%ක් පිළිතුරු සැපයීම සඳහා 10 ප්‍රශ්නය තෝරාගෙන ඇත. එම නිසා 10 ප්‍රශ්නය II පත්‍රයේ ජනප්‍රියම ප්‍රශ්නය වන නමුත් එහි පහසුතාව 40%කි. නමුත් 8 සහ 9 යන ප්‍රශ්න තෝරාගැනීමේ ප්‍රතිශතය පිළිවෙළින් 9%ක් හා 22%ක් වුවද එම ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 30%ක් හා 33%ක් වේ. මෙම කොටසට අදාළව පිළිතුරු ලිවීම සඳහා විෂය නිර්දේශයේ න්‍යායාත්මක කරුණු පිළිබඳව ප්‍රායෝගික දැනුම ලබා දීමත් කෙටි සටහන් ලියන ප්‍රශ්න සඳහා සිසුන් පුහුණු කරවීමත් මඟින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කරගත යුතු ය.

**ප්‍රස්තාරය** 3.2

පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය





**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

I, II, III කොටස් තුනෙහි ප්‍රශ්න 10 සැලකූවිට 5 ප්‍රශ්නය හැර අනෙකුත් ප්‍රශ්න 9 සඳහා ම අපේක්ෂකයන් වැඩි ප්‍රතිශතයක් ලකුණු ලබා ඇත්තේ ප්‍රශ්නය සඳහා වෙන්කළ ලකුණෙන් 00-25 පන්ති ප්‍රාන්තරය තුළ ය. 1 හා 9 ප්‍රශ්න සඳහා එම පන්ති ප්‍රාන්තරයේ ලකුණු ලබා ඇති අපේක්ෂයන් ප්‍රතිශතය 50% ඉක්මවා ඇත. 5 ප්‍රශ්නය සඳහා පමණක් වැඩි අපේක්ෂක ප්‍රතිශතයක් ප්‍රශ්නය සඳහා වෙන්කළ ලකුණෙන් 51-75 පන්ති ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇත. එම ප්‍රතිශතය 30% ඉක්මවා ඇත.

**ප්‍රස්තාරය 3.3**

II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

## 3.3 II පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂී නිරීක්ෂණ හා නිර්දේශ

### 3.3.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර

**I කොටස**

**1. දේශපාලනය අධ්‍යයනය කිරීම සඳහා ඇති සමාජ විද්‍යාත්මක ප්‍රවේශය විස්තර කරන්න.**

**හැඳින්වීම**

- දේශපාලනය අධ්‍යයනය කිරීම සඳහා ප්‍රවේශ කිහිපයක් තිබේ. සමාජ විද්‍යාත්මක ප්‍රවේශය එයින් එකකි.
- දේශපාලන විද්‍යාව සහ සමාජ විද්‍යාව එකිනෙකට ළඟින් සම්බන්ධ ශාස්ත්‍රීය විෂය දෙකක් නිසා ඒවා අතර දිගටම පවතින්නේ කිට්ටු සම්බන්ධයකි.
- දේශපාලන සමාජ විද්‍යාව නම් උප ක්ෂේත්‍රය, දේශපාලන විද්‍යාව සහ සමාජ විද්‍යාව යන ක්ෂේත්‍ර දෙකටම සම්බන්ධය.

**අන්තර්ගතය**

- දේශපාලන විද්‍යා ගවේෂණය, සමාජ විද්‍යා විධික්‍රම නිසා පෝෂණය වී ඇත.
- ඕගස්ත් කොම්ත්, කාල් මාක්ස් සහ මැක්ස් වේබර් යන දහනව වැනි සියවසෙහි සිටි සමාජ න්‍යායධරයෝ මෙම ප්‍රවේශයෙහි පුරෝගාමීහු වූහ.
- විසි වැනි සියවසෙහි මැද භාගයෙහි දී සමාජ පර්යේෂණ පිළිබඳ ෆ්‍රැන්ක්ෆර්ට් ගුරු කුලයේ න්‍යායධරයෝ මෙම ප්‍රවේශයේ නූතන පුරෝගාමීහු වූහ.
- නූතන දේශපාලන විද්‍යා විධි ක්‍රමය සමාජ විද්‍යාව සහ මානව විද්‍යාව යන විෂය දෙකෙන්ම අභාසය ලබා ඇත.
- සමාජ විද්‍යා ගවේෂණය අවබෝධකර ගැනීමට අපේක්ෂා කරන්නේ සමාජ ව්‍යුහයන්, සමාජ සංවිධාන, සමාජ ඒකක, මනුෂ්‍යයින් සහ සමාජය අතර සම්බන්ධය, සමාජ ස්ථරායණය සහ සමාජ පරිවර්තනය යනාදී තේමාය.
- පහත සඳහන් ආකාරයේ තේමා පිළිබඳව පුළුල් අවබෝධයක් ඇති කර ගැනීමට දේශපාලන විද්‍යාඥයින්ට සමාජ විද්‍යා ප්‍රවේශය බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. දේශපාලන පක්ෂ සහ ඒවායේ සමාජ පදනම්, පුරවැසියන්ගේ ඡන්ද චර්යාව, දේශපාලනයට බලපාන සමාජ ගැටුම්, දේශපාලනයේ සමාජ සහ පන්ති පදනම් සහ පන්ති අරගලය.
- දේශපාලනය පිළිබඳ සමාජ විද්‍යා ප්‍රවේශය පිළිතුරු සොයන්නට උත්සාහ ගන්නේ පහත සඳහන් ආකාරයේ ප්‍රශ්නවලට ය. පුරවැසියන් දේශපාලනයට සහභාගී වන්නේ ඇයි? සමාජයේ දේශපාලන බලය ඇත්තටම දරන්නේ කවර සමාජ කොටසක් හෝ සමාජ පන්තිද? ධනය, කුලය, පන්තිය, පවුල, ස්ත්‍රී පුරුෂ භාවය වැනි සාධක පුරවැසියන්ගේ දේශපාලන සහභාගීත්වයට බලපාන්නේ කවර ආකාරයෙන් ද? දේශපාලන පක්ෂ නියෝජනය කරන්නේකවර දේශපාලන අභිලාෂද?

**නිගමනය**

- සමාජ විද්‍යාත්මක ප්‍රවේශයෙන් ලැබෙන ප්‍රයෝජනය සහ එහි සීමා ගැන සඳහන් කරමින් පිළිතුර අවසන් කළ හැකිය.
- දේශපාලනය ඇත්ත වශයෙන්ම සිදුවන සමාජය වෙතට යෑමට එම ප්‍රවේශය දේශපාලන විද්‍යාඥයින්ට හැකියාව ලබා දෙයි.


- දේශපාලන විද්‍යාවේ ඇති සුවිශේෂී අනන්‍යතාව, සමාජ විද්‍යා ප්‍රවේශය නිසා සීමා වීම, එම ප්‍රවේශයේ ඇති එක් සීමාවකි. සමාජ විද්‍යා සාධක වලට වැඩි අවධානය යොමු කිරීම එයට හේතුවයි.

### 3.3.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.4**

ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු ප්‍රමාණය 20කි.




ඉන්;


ලකුණු 00– 05 ප්‍රාන්තරයේ 70.79%ක් ද
ලකුණු 06– 10 ප්‍රාන්තරයේ 16.46%ක් ද
ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 8.34%ක් ද
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 4.41%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 5ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 70.79%ක් වැනි ඉහළ අගයකි. අපේක්ෂකයන් අතුරෙන් 4.41%ක් ලකුණු 16ක් හෝ ඊට වඩා වැඩියෙන් ලබා ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.5**

ප්‍රශ්න අංක 1 සඳහා පහසුතා දර්ශකය




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

මෙම ප්‍රශ්නය ''දේශපාලනය සහ දේශපාලන විද්‍යාවේ ස්වභාවය හඳුනාගත් පුරවැසියෙකු ලෙස ක්‍රියාකරයි.'' යන නිපුණතාව හා "විෂයට අනන්‍ය වූ විවිධ ප්‍රවේශ භාවිත කරමින් දේශපාලනය හදාරයි" යන නිපුණතා මට්ටම මත පදනම් වී ඇත. මෙහි පහසුතාව 22%කි. මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 41%කි.

මෙම ප්‍රශ්නයෙන් සමාජ විද්‍යාත්මක ප්‍රවේශයේ න්‍යායාත්මක පැතිකඩ විමසා බලයි. නමුත් බොහෝ අපේක්ෂකයන් මේ සඳහා අඩු සාධනයක් පෙන්වා ඇත්තේ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය පිළිබඳ ඔවුන් සතු න්‍යායික දැනුම සීමා වීමත් මාතෘකාවට අදාළව කරුණු විග්‍රහ කිරීමේ වූ දුර්වලතාවත් නිසා විය හැකි ය. මෙම දුර්වලතා මගහරවා ගැනීමට නම් අධ්‍යයන ප්‍රවේශ හඳුනාගැනීමටත් ඒ ඒ අධ්‍යයන ප්‍රවේශ පිළිබඳ කරුණු වෙන් වෙන් වශයෙන් විග්‍රහ කිරීමටත් අවශ්‍ය අවබෝධය හා පුහුණුව, සිසුන් වෙත ලබාදීම කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී සමාජ විද්‍යාත්මක ප්‍රවේශයට අදාළව දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ දී යොදා ගත් කාල වකවානු, චින්තකයින් හා ගුරුකුල, දේශපාලන විද්‍යාවට සිදු කළ දායකත්වය, ක්‍රමවේද, දුර්වලතා පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.

### 3.3.2 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර

**2. (i) 'දේශපාලන මතවාද' යන සංකල්පය අර්ථ දක්වන්න.**

- දේශපාලන මතවාදවලට දීර්ඝ ඉතිහාසයක් පවතියි.
- දේශපාලන මතවාද යන වචනය භාවිතයට පැමිණියේ 18 වන සියවසේදී ය.
- කාර්මික විප්ලවයක් සමඟ බටහිර යුරෝපයේ සිදු වූ සමාජ, ආර්ථික සහ දේශපාලන පරිවර්තනයට සමගාමීව නූතන දේශපාලන මතවාද බිහිවිය.
- දේශපාලන මතවාදයක්,
  - සමාජයේ දේශපාලනයට බලපෑම් කරයි.
  - දේශපාලන ක්‍රියාකාරීත්වයට සහ දේශපාලන පරිවර්තනයට මඟ පෙන්වයි.
  - සමාජයේ විශාල ජන කොටසක් ආකර්ෂණය කර ගැනීමට සමත් වේ.
  - දේශපාලන මතිමතාන්තර සහ විශ්වාස ආදියෙන් සමන්විත නිශ්චිත අදහස් සමුච්චයකි.
- ඕනෑම දේශපාලන මතවාදයක පොදු ලක්ෂණ
  - එකිනෙකා ට සංගත වූ අදහස් මාලාවකින් සමන්විත වේ.
  - සමාජයේ යම් යම් කොටස්වල දේශපාලන විඥානය, විශ්වාස සහ ඉදිරි දැක්ම හැඩ ගැස්වීමට ද සමත් වේ.
- සමාජ කොටස් දේශපාලන ක්‍රියාකාරීත්වයට යොමු කිරීමේ හැකියාව ද සහිතය.
  - මෙයට නිදසුන් ලෙස ලිබරල්වාදය, ජාතිකවාදය, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය, ෆැසිස්ට්වාදය, රාජ්‍ය සුභසාධනවාදය, නව ලිබරල්වාදය යන මේවා නිදසුන් ලෙස දැක්විය හැක.

**(ii) දේශපාලන මතවාදයක් ලෙස සමාජවාදය විස්තර කරන්න.**

**හැඳින්වීම**

'සමාජවාදය' පිළිබඳ අදහස යුරෝපයේ 19 වැනි සියවසේ මුල් කාලයේ සිට මතු වී තිබිණ. පොදු දේපළ අයිතිය සහ සමාජ සමානාත්මතාව එහි මූලික මූල ධර්ම වේ.

- 19 වැනි සියවසේ දෙවන භාගයේ ආරම්භ වූ මාක්ස්වාදී සමාජවාදය විසිවැනි සියවසේ දී ප්‍රබල දේශපාලන මතවාදයක් ලෙස පැතිරිණි.
- එය ලිබරල්වාදයට සහ ධනවාදයට විවේචනයක් මෙන්ම විකල්පයක් ද විය.
- සමාජවාදයේ ප්‍රධාන අදහස නම් ධනවාදී ක්‍රමය අහෝසි කිරීම, පන්තිභේදය තුරන් කිරීම සහ ආර්ථික සමාජ අසමානත්වය තුරන් කිරීමය. එසේම දේපළවල පොදු සමාජීය අයිතිය වෙනුවෙන් ද එය පෙනී සිටියේ ය.
- සමාජවාදය ප්‍රබල මතවාදයක් බවට පත් කරන ලද්දේ මාක්ස්වාදය විසිනි.

**අන්තර්ගතය**

- සමාජවාදය යන අදහස මතුවන අවධි දෙකක් හඳුනා ගත හැකිවේ.

I. ධනවාදී ක්‍රමය යටතේ පැවති පෞද්ගලික දේපළ ක්‍රමය වෙනුවට පොදු දේපළ ක්‍රමයක් පිළිබඳ විකල්පයක් ඉදිරිපත් කිරීම.

II. කාල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස් විසින් මාක්ස්වාදය නමින් සමාජවාදය පිළිබඳ නව මතවාදයක් ඉදිරිපත් කිරීම. මෙය විද්‍යාත්මක සමාජවාදය යනුවෙන් හැඳින්වේ.

- 1848 දී ප්‍රකාශයට පත් කළ 'කොමියුනිස්ට් ප්‍රකාශනය' මඟින් කාල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස් විසින් සමාජවාදය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය ඉදිරිපත් කරන ලදි.

- සමාජවාදයේ මතවාදී අන්තර්ගතය;

I. ධනවාදී පෞද්ගලික දේපළ ක්‍රමය වෙනුවට සාමූහික අයිතිය පදනම් කරගත් පොදු දේපළ ක්‍රමයක් ඇති කිරීම.

II. පන්ති විරහිත සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීම.

III. සමාජ වාදයට අනුව රාජ්‍යය ක්‍රියාත්මක වූයේ නිෂ්පාදන මාර්ගවලට හිමිකම් කියන අතලොස්සක් වූ සමාජ පන්තියේ අභිලාෂ වෙනුවෙනි.

IV. සමාජවාදී න්‍යාය රාජ්‍යය හඳුනා ගන්නේ නිෂ්පාදන මාර්ගවලට හිමිකමක් නැති බහුතර ජනතාව සූරාකෑම සඳහා පවතින දේශපාලන ආයතනයක් ලෙසයි.

V. පීඩාකාරී උපකරණයක් වූ රාජ්‍ය යාන්ත්‍රණය අහෝසි කර දැමීම, රාජ්‍යය පිළිබඳ සමාජවාදී මතවාදයෙන් අවධාරණය කෙරේ.

VI. සෑම මනුෂ්‍යයෙකුටම සමානාත්මතාවයකින් සහ නිදහසින් යුතුව ජීවත් වීමට අවශ්‍ය සමාජ, ආර්ථික වටපිටාව සැකසීම, සමාජවාදී දෘෂ්ටියේ මූලික අරමුණයි.

- විසි වැනි සියවසේ දී සමාජවාදය ප්‍රබල දේශපාලන දෘෂ්ටියක් බවට පරිවර්තනය විය.

- විප්ලවවාදී සමාජවාදයට සමාන්තරව තුන්වැනි ලෝකයේ සමාජවාදී ධාරා කිහිපයක් ද ගොඩ නැගිණ.

**නිගමනය**


- දේශපාලන මතවාදයක් ලෙස සමාජවාදයේ ඇති විශේෂත්වය දැක්වීම.
- සමාජවාදය පන්ති බෙදීම සහ ඒ මත පදනම් වන රාජ්‍යය අහෝසි කිරීම අවධාරණය කරයි.
- සමාජවාදී සමාජයක ඊළඟ අවධිය කොමියුනිස්ට් සමාජයක් නිර්මාණය කිරීම බව සමාජවාදීහු විශ්වාස කරති.
- සමාජ සහ ආර්ථික සමානාත්මතාවය පිළිබඳව අවධාරණය කරන එකම දේශපාලන මතවාදය සමාජවාදයයි.

### 3.3.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.6**

ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු සංඛ්‍යාව 20කි.




ඉන්;


ලකුණු 00 – 05 ප්‍රාන්තරයේ 48.26%ක් ද
ලකුණු 06 – 10 ප්‍රාන්තරයේ 24.48%ක් ද
ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 17.51%ක් ද
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 9.75%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගත් අපේක්ෂකයන් අතුරෙන් 48.26%ක් ලකුණු 05ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබා ඇත. ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 9.75%කි.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.7**

ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශකය




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

මෙම ප්‍රශ්නය ''දේශපාලන මතවාදවල ස්වභාවය හා කාර්යය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි''යන නිපුණතාව සහ ''විවිධ දේශපාලන මතවාද හඳුනා ගැනීම, ඒවායේ මූලික ලක්ෂණ සහ දේශපාලන ක්ෂේත්‍රයේ දී ඒවා ඉටුකර ඇති කාර්යය විචාරාත්මක විමසයි" යන නිපුණතා මට්ටම් ඇසුරෙන් සකස් වී ඇත. මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 48%කි.

මෙය කොටස් 02කින් යුක්ත ප්‍රශ්නයක් වන අතර, සමස්ත ප්‍රශ්නයෙහි පහසුතාව 45%කි. ඒ අනුව මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන්ගෙන් බහුතරයක් ප්‍රශ්නය සඳහා සැලකිය යුතු මට්ටමේ සාධනයක් පෙන්නුම් කර ඇත. මෙම ප්‍රශ්නයේ පළමු කොටසින් ''දේශපාලන මතවාද''යන සංකල්පය අර්ථ දැක්වීම අපේක්ෂිත අතර ඒ සඳහා ලකුණු 05ක් ප්‍රදානය කර ඇත. (i) කොටසෙහි පහසුතාව 51%කි.

(ii) කොටසින් දේශපාලන මතවාදයක් ලෙස ''සමාජවාදය'' විස්තර කිරීම අපේක්ෂා කර ඇති අතර ඒ සඳහා ලකුණු 15ක් ප්‍රදානය කෙරේ. එහි පහසුතාව 38%කි. පළමු කොටසෙහි පහසුතා වැඩි වීමට දේශපාලන මතවාද පිළිබඳ සංකල්පමය අවබෝධය පමණක් පිළිතුර ලෙස බලාපොරොත්තු වීම හේතුවක් විය හැකිය. ''සමාජවාදය'' දේශපාලන මතවාදයක් ලෙස හඳුනාගෙන ඒ යටතේ පුළුල් ලෙස කරුණු විග්‍රහ කිරීම මෙහි (ii) කොටසින් අපේක්ෂා කර තිබූ අතර අපේක්ෂකයන් සමාජවාදය යන්න දේශපාලන මතවාදයක් ලෙස හඳුනාගෙන විග්‍රහ කිරීමට අපොහොසත් වීම, (ii) කොටසෙහි අඩු සාධනයට හේතු වූවා විය හැකිය. මෙම ප්‍රශ්නය සඳහා ඉහළ සාධන මට්ටමක් ළඟා කර ගැනීමට නම් ''සමාජවාදය'' යන අදහස අවධි දෙකක් යටතේ හඳුනා ගැනීම, ඒ හා බැඳුණු ප්‍රධාන අරමුණු මාක්ස්වාදය සමඟ බද්ධ කිරීම, දේශපාලන මතවාදයක් ලෙස සමාජවාදයේ විශේෂත්වය සහ අන්තර්ගත කරුණු පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

### 3.3.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර

**3. (i) 'රාජ්‍යය' යන සංකල්පය අර්ථ දක්වන්න.**

- රාජ්‍යය යනු ඓතිහාසික සහ සමාජීය ප්‍රපංචයකි.
- රාජ්‍යයේ ස්වභාවය සමාජයේ ඓතිහාසික වර්ධනයන්ට අනුකූලව වෙනස් වී ඇත.
- ගෝත්‍රික රාජ්‍යයේ සිට නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය තෙක් රාජ්‍යයේ ඓතිහාසික විකාශනය සිදුවී තිබේ.
- නූතන භෞමික රාජ්‍යය ප්‍රධාන අංග හතරක් යටතේ සංවිධාන ගත කොට තිබේ.
  - I. නිශ්චිත දේශ සීමාව
  - II. ජාතික පදනම
  - III. ආණ්ඩුව
  - IV. ස්වාධිපත්‍යය

**(ii) රාජ්‍යය, සමාජය තුළ ඉටු කරන භූමිකාව පැහැදිලි කරන්න.**

**හැඳින්වීම**

- රාජ්‍යය සහ සමාජය අතර නොබිඳිය හැකි සම්බන්ධතාවක් පවතී.
- රාජ්‍යයකින් තොරව සංවිධානාත්මක සමාජයක් පවත්වා ගෙන යා නොහැකි ය.
- සමාජයෙහි පවත්නා දේශපාලන බලයේ කේන්ද්‍රීය ප්‍රකාශනය රාජ්‍යයයි.

**අන්තර්ගතය**

- රාජ්‍යය සමාජයක් පාලනය කිරීමට නිර්මානය වූ බල ව්‍යූහවල සහ ආයතනවල එකතුවකි.
- රාජ්‍යයේ භූමිකාව පුළුල් සහ සංකීර්ණ වේ.
- රාජ්‍යය සමාජය තුළ ඉටු කරන භූමිකාව පහත සඳහන් පරිදි දැක්විය හැකිය.
  - I. නීතියේ, සමාජ පර්යායේ සහ දේපළවල භාරකාරත්වය.
  - II. ආර්ථික පරිපාලනය සහ මෙහෙය වීම.
  - III. සමාජ පාලනය, මෙහෙයවීම සහ සමාජ අධීක්ෂණය.
  - IV. සමාජයේ නීතිය සහ සාමය පවත්වා ගැනීම.
  - V. යුද්ධ ප්‍රකාශ කිරීම සහ යුද්ධ කිරීම.
- රාජ්‍යය සමාජයක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි.
- රාජ්‍යයේ වැදගත්කම වඩාත් හොඳින් අවබෝධ කර ගත හැක්කේ රාජ්‍යයක් නොමැති විට සමාජයක පැවතිය හැකි තත්ත්වය පිළිබඳ පරිකල්පනය කරන විටදී ය.
- සමාජයක සංවිධානාත්මක පැවැත්ම, ඒකාග්‍රතාව, සුරක්ෂිතතාව සහ සමාජ යහපැවැත්ම ආදිය සඳහා රාජ්‍යයේ පැවැත්ම අත්‍යවශ්‍ය වේ.

**(iii) ආණ්ඩුව රාජ්‍යයෙන් වෙනස් වන්නේ කෙසේ ද?**


- රාජ්‍යය සහ ආණ්ඩුව එකිනෙකට සම්බන්ධ වුවත්, ඒ දෙක එකක් ම නොවේ.
- රාජ්‍යය ස්ථිර ආයතනයක් වන අතර ආණ්ඩුව කලින් කලට වෙනස්වීමේ ලක්‍ෂණ සහිතය.
- පූර්ව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම වල රාජ්‍ය සහ ආණ්ඩුව අතර වෙනසක් නොපැවතිණි.
- ආණ්ඩුව යනු රාජ්‍යය සමන්විත වී තිබෙන ප්‍රධාන සාධකවලින් එක් සාධකයක් පමණි.
- රාජ්‍යයේ ස්වාධිපත්‍යය ක්‍රියාත්මක කරන සංවිධානය ආණ්ඩුව වේ.
- ආණ්ඩුවකින් නියෝජනය වන්නේ එක් විශේෂිත දේශපාලන මතවාදයක් හෝ දේශපාලන පක්‍ෂයක හෝ පක්‍ෂ සන්ධානයක අභිලාෂ වන අතර, රාජ්‍යයෙන් ප්‍රතිමූර්තිමත් කෙරෙන්නේ පොදු ඉලක්ක සහ පොදු පරමාදර්ශයන් ය.

**3.3.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය**

**ප්‍රස්තාරය** 3.8

ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.





ඉන්;

ලකුණු 00 – 05 ප්‍රාන්තරයේ 33.52%ක් ද
ලකුණු 06 – 10 ප්‍රාන්තරයේ 30.80%ක් ද
ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 25.31%ක් ද
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 10.38% ක් ද
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත. අපේක්ෂකයන් අතුරෙන් 33.52%ක් ලකුණු 05ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබා ඇති අතර, අපේක්ෂකයන්ගෙන් 35.69%ක් ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.9**

ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශකය




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

03 ප්‍රශ්නය ''තමා ද පුරවැසියකු වන රාජ්‍ය පිළිබඳ ව න්‍යායික සහ ප්‍රායෝගික අවබෝධයකට පදනම සකසා ගනියි'' යන නිපුණතාව සහ ''රාජ්‍ය යන සංකල්පය විග්‍රහ කිරීම, රාජ්‍යය හා එහි ස්වභාවය දේශපාලන විද්‍යා සංකල්ප සහ න්‍යාය ආශ්‍රයෙන් විග්‍රහ කරයි'' යන නිපුණතා මට්ටම් මත පදනම් වී ඇත.

මෙම ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විතය. පිළිතුරු සැපයීම සඳහා මෙම ප්‍රශ්නය 85%ක් වැනි ඉහළ අපේක්ෂකයන් ප්‍රතිශතයක් තෝරාගෙන ඇති අතර සමස්ත ප්‍රශ්නයෙහි පහසුතාව 44%කි. ප්‍රශ්නයේ (i)කොටසින් 'රාජ්‍ය' යන සංකල්පය අර්ථ දැක්වීම අපේක්ෂිත අතර ඊට හිමි ලකුණු ප්‍රමාණය 05කි. එහි පහසුතාව 48%කි.

(ii) කොටසින් රාජ්‍ය, සමාජය තුළ ඉටු කරන භූමිකාව පිළිබඳව විමසා ඇති අතර එයට හිමි ලකුණු ප්‍රමාණය 10කි. එහි පහසුතාව 38%කි.

ප්‍රශ්නයේ (iii) කොටසින් ආණ්ඩුව සහ රාජ්‍ය අතර පවතින වෙනස කෙටියෙන් විස්තර කිරීම අපේක්ෂා කර ඇති අතර ඒ සඳහා ලකුණු 05ක් හිමි වේ. එහි පහසුතාව 47%කි.

ප්‍රශ්නයේ (i) සහ (iii) කොටස් සඳහා අපේක්ෂක සාධනය වැඩි වීමට, පහළ ශ්‍රේණිවල සිටම රාජ්‍ය හා ආණ්ඩුව පිළිබඳ දැනුම සහ අවබෝධය ලැබී තිබීමත් මෙම ප්‍රශ්න කොටස්වලින් කෙටි පිළිතුරක් අපේක්ෂා කිරීමත් හේතු විය හැකිය. ප්‍රශ්නයේ (ii) කොටසින් රාජ්‍ය, සමාජය තුළ ඉටු කරන භූමිකාව නූතන ජාතික රාජ්‍ය යටතේ පුළුල් වීමත් එය විග්‍රහ කිරීම සඳහා අපේක්ෂකයන් විසින් න්‍යායික සහ ප්‍රායෝගික කරුණු ප්‍රමාණවත් ලෙස ඉදිරිපත් නොකිරීමත් මෙම කොටස සඳහා අපේක්ෂකයන්ගේ සාධනය අඩුවීමට හේතු වූවා විය හැකි ය.

මෙවැනි ප්‍රශ්න සඳහා ඉහළ සාධන මට්ටමක් ළඟා කර ගැනීමට නම් රාජ්‍ය පිළිබඳ විධිමත් නිර්වචන ඉදිරිපත් කිරීමටත්, රාජ්‍යයේ සාම්ප්‍රදායික හා සමකාලීන කාර්යයන් උදාහරණ සහිතව දැක්වීමටත්, රාජ්‍ය සහ ආණ්ඩුව අතර පවතින වෙනස න්‍යායාත්මක හා ප්‍රායෝගික කරුණු ඇසුරෙන් විග්‍රහ කිරීමටත් හැකිවන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ය.

## 3.3.7 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර

**4. (i) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය තුළ සිදු වූ ආර්ථික පරිවර්තනය කෙටියෙන් සාකච්ඡා කරන්න.**

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය යන්නෙන් අදහස් කරන්නේ 1796 - 1948 අතර කාල වකවානුවයි. මේ අවධිය තුල ශ්‍රී ලංකාවේ ආර්ථික පරිවර්තනය කෙරෙහි පුළුල් ලෙස බලපෑම් කළ කාලයකි. මෙය 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වූ කාලයත් 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වූ කාලයත් කාලයද විය. මූලික වශයෙන් මෙම ප්‍රතිසංස්කරණ දෙක යටතේ මෙරට සිදු වූ ආර්ථික සහ සමාජ පරිවර්තනයන් පහත සඳහන් අන්දමට දැක්විය හැකි ය.

- රජයේ වෙළඳ අධිකාරය අහෝසි කිරීම සහ ලිබරල් ධනවාදී ආර්ථික ක්‍රමයට පදනම් වැටීම.
- දේශීය නිෂ්පාදන විදේශිය වෙළඳ පලට යැවීමත් විදේශීය නිෂ්පාදන වලට ලාංකික සමාජය හුරුවීමත් හේතුවෙන් ලාංකික සමාජය විදේශිය වෙළඳපලේ බලපෑමට ලක් වීම.
- නූතන ධනේශ්වර ආර්ථිකයට අවශ්‍ය පදනම සකස් වීම සහ වෙළඳ වැවිලි හා ආයාත - නිර්යාත ආර්ථිකය මත පදනම් වූ යටත් විජිත ධනවාදී ආර්ථිකයක් නිර්මාණය වීම. ඒ වන විට ලංකාවේ පැවතියේ මූලික වශයෙන් ග්‍රාමීය ගොවි ආර්ථිකයක් සහ පෘතුගීසී හා ලන්දේසි යුගයෙන් ආරම්භ වූ සීමිත වාණිජ ආර්ථිකයකි.
- රාජකාරි ක්‍රමය අහෝසි කිරීම නිසා නිදහස් ශ්‍රම වෙළඳපළක් බිහිවීමට පදනම වැටීම.
- දේශීය ව්‍යවසායක පන්තියක් බිහිවීම, වෙළදාම හා කම්කරු හා ප්‍රවාහන කොන්ත්‍රාත් පතල් කර්මාන්තයත්, අරක්කු රේන්ද ගැනීමත් ඔවුන්ගේ ආරම්භක ව්‍යාපාරික කටයුතු විය.
- ශ්‍රී ලංකාව ප්‍රාථමික කෘෂිකාර්මික ද්‍රව්‍ය නිෂ්පාදකයෙකු ලෙස ලෝක ධනවාදි ආර්ථිකය සමග සම්බන්ධ වීම.
- ප්‍රාග්ධනය සම්පාදනය සඳහා වානිජ බැංකු ක්‍රමයක් ආරම්භ කිරීම.
- වානිජ ධනපති පන්තිය පදනම් කොට ගෙන සහ වතු වගාවේ පැතිරීමත් සමග දේශීය ධනපති පන්තියක් බිහිවීම.
- වතු වැවිලි ආර්ථිකයේ අභිවෘද්ධිය උදෙසා දේශීය, විදේශීය ආයෝජකයන් දිරි ගැන්වීම අරමුණු කරගත් ප්‍රතිපත්ති නිර්මාණය වීම.
- වරාය, දුම්රිය මාර්ග, මහාමාර්ග, සන්නිවේදන යනාදි ක්ෂේත්‍රවල දියුණුව.
- ආනයන අපනයන ආර්ථිකයක් ඇති වීම සහ ලංකාවේ ආර්ථිකය ලෝක ධනවාදී වෙළඳපොළ සමඟ සම්බන්ධ වීම.
- විදේශ වෙළඳපළ මුල්කරගත් වැවිලි ආර්ථිකයකින් සහ දේශිය වෙළඳපළ මුල්කරගත් යැපුම් ආර්ථිකයකින් සමන්විත ද්විත්ව ආර්ථිකයක් ඇති වීම.
- කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් හඳුන්වා දෙන ලද නිර්බාධවාදි ධනවාදී ක්‍රමයෙන් සුභසාධක රාජ්‍ය ක්‍රමය මාරුවීමත් සමග 1930 ගණන් වලදී නූතන සුභසාධක රාජ්‍ය ක්‍රමයකට පදනම සකස් වීම
- ඩොනමෝර් රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයේ දී ගොවිජනපද ව්‍යාපාර ආරම්භ කිරීම

**(ii) බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය තුළ ශ්‍රී ලංකාවෙහි සිදු වූ පරිවර්තනයෙහි තිබුණු සමාජීය පැතිකඩ විස්තර කරන්න.**

- රාජකාරි ක්‍රමය අහෝසි කිරීම ඇතුළුව වැඩවසම්වාදය අහෝසි කිරීමට ක්‍රියා කිරීමේ ප්‍රතිපලයක් ලෙසින් සමාජයේ පැවති කුල ව්‍යූහය දුර්වල සහ වෙනස් වීම.
- වතුවගාවට ප්‍රමුඛත්වය දීමේ ප්‍රතිඵලය ලෙස දේශිය කෘෂිකර්මාන්තය රජයේ අවධානයෙන් ගිළිහී යාම.
- ආර්ථික රටාව වෙනස් වීම හේතුවෙන් පැරණි වැඩවසම් රටාව යටතේ දක්නට ලැබුණු පාරම්පරික සමාජ බෙදීම් ක්‍රමයෙන් අහෝසි වීම, සහ නව පන්ති ව්‍යූහයක් නිර්මාණය වීම. දේශීය ධනපති පන්තිය, කම්කරු පන්තිය සහ නාගරික මධ්‍යම පන්තිය, මෙලෙස බිහි වූ ප්‍රධාන නව සමාජ පන්ති තුනයි.
- නාගරීකරණය නිසා බටහිර සංස්කෘතියට හැඩ ගැසුණු නාගරික මධ්‍යම පන්තියක් බිහි වීම.
- සමාජ ව්‍යූහයේ සංචලතා ක්‍රියාවලියට පදනම වැටීම.
- සාමාන්‍ය ජනතාව අතර ගොවි පන්තීන්ට අමතරව වතු කම්කරු සහ නාගරික නිර්ධන පන්තියක් බිහිවීම.
- බටහිර සංස්කෘතික බලපෑම්වලට ලාංකික සමාජය ක්‍රමයෙන් නතුවීම.
- සිවිල් සමාජය බිහි වීම පුළුල් වීම සහ සිවිල් සමාජයේ ක්‍රියාකාරීත්වය වර්ධනය වීම.
- කෝල්බෲක් පාලන ක්‍රමය යටතේ ඇරඹුණු සමාජ පරිවර්තන ක්‍රියාවලිය තවදුරත් පුළුල් වෙමින් වර්ධනය වීම විසි වැනි සියවසේ මුල් භාගයේදී සිදුවිය.

---

**නිගමනය**


- බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ ඇති වූ සමාජ පරිවර්තන, ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණ වල ප්‍රතිඵලයක් විය. එයට ප්‍රධාන සාධකයක් වූයේ යටත් විජිත ධනවාදී ක්‍රමයක් ප්‍රතිෂ්ඨාපනය කිරීමයි.
- යුරෝපීය සංස්කෘතිය පැතිරීම ද මෙම ක්‍රියාවලියට දායක විය.
- දේශීය සමාජයේ ප්‍රභූ පන්තීන් මෙම පරිවර්තනයෙන් ප්‍රතිලාභ ලැබුව ද, සාමාන්‍ය ජනතාවගෙන් අති බහුතරයට එවැනි ප්‍රතිලාභ නොලැබිණි.

### 3.3.8 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.10**

ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.




ඉන්;


ලකුණු 00 – 05 ප්‍රාන්තරයේ 30.97% ක් ද
ලකුණු 06 – 10 ප්‍රාන්තරයේ 27.30% ක් ද
ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 29.05% ක් ද
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 12.69% ක් ද
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත.

අපේක්ෂකයන් අතුරෙන් 12.69%ක් ලකුණු 16ක් හෝ ඊට වඩා වැඩි ලකුණු ලබා ඇති අතර, අපේක්ෂකයන්ගෙන් 30.97%ක් ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.11**

ප්‍රශ්න අංක 4 සඳහා පහසුතා දර්ශකය




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

04 ප්‍රශ්නය ''ශ්‍රී ලංකාවේ යටත්විජිත කාලයේ දී සිදුවන පරිවර්තනයේ දී සමාජ, ආර්ථික සහ දේශපාලන පැතිකඩ හඳුනා ගනියි'' යන නිපුණතාව සහ ''යටත් විජිතවාදය සහ යටත්විජිත පාලන ක්‍රමය ලංකාවේ සමාජ, ආර්ථික සහ දේශපාලන පරිවර්තනයට තුඩු දුන් ආකාරය විග්‍රහ කරයි'' යන නිපුණතා මට්ටමට අදාළව සකසා ඇත. මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 90%කි. සමස්ත ප්‍රශ්නයෙහි පහසුතාව 46%කි. අපේක්ෂකයන් වැඩි ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබුණ ද, තෝරාගත් අපේක්ෂකයන් අතුරෙන් බහුතරයක් සාර්ථකව පිළිතුරු සපයා නොතිබුණි.

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විතය. (i) කොටසින් ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන කාලය තුළ සිදු වූ ආර්ථික පරිවර්තන කෙටියෙන් සාකච්ඡා කිරීම අපේක්ෂා කර ඇති අතර, (ii) කොටසින් බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන කාලය තුළ ලංකාවේ සිදු වූ පරිවර්තනයේ සමාජීය පැතිකඩ විස්තර කිරීම අපේක්ෂා කර තිබුණි. (i) කොටස සඳහා ලකුණු 10ක් ප්‍රදානය කර ඇති අතර, එහි පහසුතාව 48%කි. (ii) කොටසට ද ලකුණු 10ක් ප්‍රදානය කර ඇති අතර, එහි පහසුතාව 44%කි.

බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමය තුළ ඇති වූ ආර්ථික හා සමාජ පරිවර්තන වෙන් වෙන්ව අවබෝධ කර ගැනීමට නොහැකි වීමත් එම පරිවර්තන ප්‍රමාණවත් ලෙස විස්තර නොකිරීමත් අපේක්ෂකයන්ගේ අඩු සාධනයට හේතු වී ඇත.

මෙම ප්‍රශ්නයේ දී කොටස් දෙකට ම අදාළව කරුණු වෙන් වෙන් වශයෙන් අවබෝධ කර ගැනීම සිදු කළ යුතු ය. එහි දී යටත් විජිත කාලවකවානු පිළිබඳව අවබෝධයක් සිසුන් ලබා ගත යුතු ය. එකම නිපුණතාවට අදාළ වුවත්, ප්‍රශ්න කොටස් ලෙස දැක්වීමේ දී වෙන් වෙන්ව පිළිතුරු ලබා දීමට, ඒවායේ සැකැස්ම සහ අන්තර්ගතය පිළිබඳව අවබෝධය ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී සිසුන් තුළ ගොඩනැංවීමට කටයුතු කළ යුතු ය. මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ දී ප්‍රශ්නයේ කොටස්වලට අදාළව හැඳින්වීම, අන්තර්ගතය හා නිගමනය වෙන් වෙන්ව ලිවීමට ද සිසුන්ට මඟ පෙන්විය යුතු ය.

### 3.3.9 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර

**5. (i) සුළුතර වාර්ගික ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධව සෝල්බරි ව්‍යවස්ථාවේ තිබූ විධිවිධාන කෙටියෙන් විස්තර කරන්න.**

**හැඳින්වීම**

සෝල්බරි ව්‍යවස්ථාව මගින් සුළුතර ජනකොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරබයා විධිවිධාන යොදනු ලැබූයේ රටේ බහුතර ජන කණ්ඩායමට, සීමා නොවන ආකාරයේ පාලන බලයක් ලැබුනහොත් ඒ බලය සුළුතර කණ්ඩායම්වලට අවාසිවන පරිදි යෙදවිය හැකිය යන කරුණ සැළකිල්ලට ගැනීම හේතු කොටගෙන ය. මේ අනුව සුළු ජන කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණෙන් විධිවිධාන කිහිපයක් ම සෝල්බරි ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලදි.

- 29 (1) වගන්තිය. මෙය සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පැවති ප්‍රබලතම ව්‍යවස්ථා විධිවිධානය විය. මේ වගන්තියේ සඳහන් විධිවිධාන වලින් අපේක්ෂා කළේ වාර්ගික හෝ ආගමික පදනම මත වෙනස්කම් සිදු කරන නීති පැණවීම වැළැක්වීමටය.
- බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමය. මෙම ඡන්ද කොට්ඨාශ පිහිටුවීමෙන් සෝල්බරි කොමිසම අපේක්ෂා කළේ ඇතැම් ප්‍රදේශවල ප්‍රධාන ජනවර්ගය සමග මිශ්‍රව සිටින සුළුජාතීන්ට පාර්ලිමේන්තු නියෝජනයක් සැපයීමයි.
- නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට නාමකරණයෙන් සාමාජිකයන් සය දෙනෙකු පත් කිරීම. මෙම විධිවිධානය යොදන ලද්දේ මහමැතිවරණයකින් ප්‍රමාණවත් නියෝජනයක් ලබා ගැනීමට නො හැකි වූ කිසියම් ජන කොටසක් වේ නම් ඔවුනට නියෝජනයක් ලබා දීම සඳහා ය.
- සෙනේට් මණ්ඩලය පිහිටුවීම. නිසි නියෝජනයක් නොලැබූ සුළු ජන කොටස් සෙනේට් මණ්ඩලය තුල නියෝජනය වීමට අවස්ථාව සළසා දීම මගින් සුළු ජන කොටස්වල අපේක්ෂා ආරක්ෂා කරගත හැකි වේය යන විශ්වාසයක් සෝල්බරි කොමිසම ට තිබිණි.
- ස්වාධීන රාජ්‍ය සේවා කොමිසන් සභාව
  මේවා සුළු ජන ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන තිබූ ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග ය.

**(ii) ඉහත (i) හි ඔබ සඳහන් කළ විධිවිධානවල අපේක්ෂිත අරමුණු ඉටු වී දැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.**

සෝල්බරි ව්‍යවස්ථාවේ සඳහන් සුළු වාර්ගික ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විධිවිධාන එම ව්‍යවස්ථා සම්පාදකයන් අපේක්ෂා කළ අන්දමට ඉටු නොවූ බව සඳහන් කල හැකි ය.

- 29 (1) වගන්තිය සුළුතර අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් ව්‍යවස්ථා විධිවිධානයක් ලෙස සැළකිය නොහැකි ය. මෙහි දර්ශන පථය සහ අභිප්‍රාය සීමා වූ අතර එහි නෛතික තත්වය අපැහැදිලි එකක් විය.

- සෙනේට් මණ්ඩලය පිහිටු වීමට මුල් වූ අරමුණු වලින් එකක් වූයේ සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වුව ද, එම මණ්ඩලයට නියෝජිතයන් පත් වූ ආකාරය අනුවත් එයට හිමි වූ බලතල වල ස්වභාවය අනුවත් මේ අරමුණ සෝල්බරි කොමිසම අපේක්ෂා කළ ආකාරයට ඉටු වූයේ නැත.
  අගමැතිවරයා විසින් සුළු ජාතිකයන් වෙනුවෙන් සෙනේට් සභිකයන් පත් කිරීමේ දී ඔවුන්ගේ සුළු ජන පදනම සැළකිල්ලට ලක් කළ ද ඒ කරුණට ඉහළින් ඔවුන්ගේ දේශපාලන පක්ෂ පදනම සැළකිල්ලට ගත් බව පෙනෙන්නට තිබුණි. එබැවින් ඔවුහු බොහෝ විට ඔවුන් නියෝජනය කළ සුළු ජන පදනම අමතක කර අගමැතිවරයාගේ පක්ෂයට ලැදි පිරිසක් ලෙස ක්‍රියා කළ හ.

- බහුමන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමයෙන් කොමිසම අපේක්ෂා කළ අරමුණු ඉටු කරගැනීමට නම් කොන්දේසි දෙකක් ඉටු විය යුතුව තිබුනි. එනම් (1) බහු මන්ත්‍රී ආසනයක් සඳහා ඉදිරිපත් විය යුත්තේ සුළු ජාතීන් වෙනුවෙන් එක් අපේක්ෂකයෙකු පමණක් වීම සහ (2) එලෙස ඉදිරිපත් වන අපේක්ෂකයාට දේශපාලන පක්ෂ පදනමින් තොරව සුළු ජාතීන්ට අයත් සෑම කෙනෙකුම ඡන්ද ප්‍රකාශ කිරීම. තමන්ගේම නියෝජිතයෙකු පත් කරගත හැකි ආකාරයට ඉහත සඳහන් අන්දමට සුළු ජාතීන් සෑම විට ම ක්‍රියා කළ බව ලංකා මැතිවරණ ඉතිහාසය තුලින් දක්නට ලැබෙන්නේ නැත. උදාහරණ වශයෙන් 1952 සහ 1956 වසර වල පැවැති මහමැතිවරණ වලදී බදුල්ල සහ බලන්ගොඩ යන බහු මන්ත්‍රී ආසන වලින් කිසිදු ද්‍රවිඩ අපේක්ෂකයෙකුට ජයග්‍රහණය කිරීමට හැකි වූයේ නැත.

- නාමකරණයෙන් මන්ත්‍රීවරුන් සය දෙනෙකු පත් කිරීමේ විධිවිධානයෙන් අපේක්ෂා කළේ යුරෝපීය, බර්ගර් සහ මුස්ලිම් ජාතිකයන් වෙනුවෙන් ප්‍රමාණවත් නියෝජිතයන් සංඛ්‍යාවක් පත් කර ගැනීම ය. මේ ක්‍රමය යටතේ 1947 මහමැතිවරණයෙන් පසු යුරෝපා ජාතිකයන් සිව් දෙනෙකු ද බර්ගර් ජාතිකයන් දෙදෙනෙකු ද 1952 මහමැතිවරණයෙන් පසු දෙවන පාර්ලිමේන්තුවට යුරෝපියයන් තිදෙනෙකු ද බර්ගර් ජාතිකයන් දෙදෙනෙකු ද පත් කරන ලද්දේ සුළුතර කණ්ඩායම් වලට ප්‍රමාණවත් නියෝජනයක් දීමේ අරමුණෙනි. එසේ වුව ද, 1965 සිට 1970 දක්වා බලයේ සිටි බණ්ඩාරනායක ආණ්ඩු සිංහල පීඩිත කුලවලට නියෝජනයක් දීම සඳහා මේ විධිවිධානය භාවිතා කළේ ය.

- තව ද, අගමැතිගේ උපදෙස් මත පත්වන මේ මන්ත්‍රීන් සැබැවින් ම සුළුජන මන්ත්‍රීවරුන් ලෙස හැඳින්වීමේ හැකියාවක් නොවී ය. මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු හැරුණු විට සෙසු මන්ත්‍රීවරු සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියා කිරීම වෙනුවට ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග වලට විරුද්ධ ව නො යෑමට වග බලා ගත් හ.

- ව්‍යවස්ථාවෙන් රාජ්‍ය සේවා කොමිසම පිහිටුවන ලද්දේ සුළු ජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණෙන් නොවුව ද, කොමිසම පිහිටුවීම අරභයා ඇති කළ විධිවිධාන සහ එය ක්‍රියාත්මක වූ ආකාරය තුළින් සුළු ජන කණ්ඩායම් වලට අයත් රාජ්‍ය සේවකයන්ගේ ආරක්ෂාව කිසියම් ප්‍රමාණයකට ඉටු වූ බවක් පෙනෙන්නට තිබුණි.

**නිගමනය**

නිදහසින් පසු ලංකාවේ සුළු ජන අයිතිවාසිකම් රැක දීම සඳහා යහපත් අරමුණක් සෝල්බරි ව්‍යවස්ථාවේ සම්පාදකයින්ට තිබිණ. එහෙත් නිදහසින් පසු කාලයේද ජන වාර්ගික තරඟය උත්සන්න වීමේ ප්‍රතිපලය වූයේ මෙම විධි විධාන නිසි ලෙස ක්‍රියාත්මක නොවීමයි.


එහි අවසාන ප්‍රතිඵලය වූයේ දිවයින තුල වාර්ගික සම්බන්ධතා සාමකාමී ලෙස පවත්වා ගැනීමට, සෝල්බරි ව්‍යවස්ථාවේ විධි විධාන වලට නොහැකි වීමයි.

### 3.3.10 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.12**

ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.





ඉන්;

ලකුණු 00– 05 ප්‍රාන්තරයේ 26.62%ක් ද
ලකුණු 06– 10 ප්‍රාන්තරයේ 22.62%ක් ද
ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 31.77%ක් ද
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 18.99%ක් ද
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත. අපේක්ෂකයන් අතුරෙන් 18.99%ක් ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇති අතර, අපේක්ෂකයන්ගෙන් 26.62%ක් ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇත.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්ළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.13**

ප්‍රශ්න අංක 5 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

05 ප්‍රශ්නය ''නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවර්ධනය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි'' යන නිපුණතාව සහ ''ඒ ඒ ආණ්ඩුක්‍රමයන්හි ලක්ෂණ වෙන් වෙන්ව පැහැදිලි කරයි'' යන නිපුණතා මට්ටමට අදාළව සකසා ඇත. මෙම ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂක ප්‍රතිශතය 60%කි. සමස්ත ප්‍රශ්නයෙහි පහසුතාව 53%කි.

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විතය. (i) කොටසින් සුළුතර වාර්ගික ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධව සෝල්බරි ව්‍යවස්ථාවේ තිබූ විධිවිධාන කෙටියෙන් විස්තර කිරීම අපේක්ෂා කර තිබුණි. (ii) කොටසින් සුළු ජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අදාළ විධිවිධානවල අපේක්ෂිත අරමුණු ප්‍රායෝගිකව ඉටු වූයේ ද යන්න සාකච්ඡා කිරීම බලාපොරොත්තු වී ඇත. (i) හා (ii) කොටස් සඳහා ලකුණු 10 බැගින් ප්‍රදානය කර ඇති අතර (i) කොටසෙහි පහසුතාව 58%කි. (ii) කොටසෙහි පහසුතාව 48%කි. (ii) කොටසට සාපේක්ෂව (i) කොටස සඳහා අපේක්ෂකයන් වැඩි සාධනයක් පෙන්නුම් කර ඇත.

සොල්බරි ආණ්ඩුක්‍රමයට අදාළ ව සුළුතර වාර්ගික ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යොදා තිබූ විධිවිධාන පිළිබඳ න්‍යායාත්මක අවබෝධයක් බොහෝ අපේක්ෂකයන් සතුවීම (i) කොටසෙහි වැඩි සාධනයට හේතු වී ඇත. සෝල්බරි ආණ්ඩු ක්‍රමයට අදාළව සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂ ව්‍යවස්ථාපිත විධිවිධාන හඳුන්වා දී ඇති අතර එම ව්‍යවස්ථාපිත විධිවිධානවලට අදාළ න්‍යායාත්මක කරුණු එලෙසම දැක්වීමට අපේක්ෂකයන් සතුව හැකියාවක් පැවතිය ද එම විධිවිධාන ඇසුරින් අපේක්ෂිත අරමුණු ඉටු වූයේද යන්න විස්තර කිරීමේ විශ්ලේෂණාත්මක හැකියාව අවම වීම (ii) කොටසෙහි අඩු සාධනයට හේතු වී ඇත. ආණ්ඩුක්‍රමයක ඇතුළත් විය යුතු ප්‍රධාන අංගයක් ලෙස මූලික අයිතිවාසිකම් සඳහන් කළ හැකි නමුත් 1947 සොල්බරි ආණ්ඩු ක්‍රමය තුළ නවාංගයක් ලෙස හඳුන්වා දෙනු ලැබුවේ සුළු ජන අයිතීන් ආරක්ෂා කිරීමට අදාළ විධිවිධානයන් බව අපේක්ෂකයන් දැනුවත්ව සිටිය යුතු ය. එකී විධිවිධාන ව්‍යවස්ථාපිතව 29 II හා 29 III වගන්ති තුළ ඇතුළත් වේ.

මෙවැනි ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී සුළුජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අදාළ ව්‍යවස්ථාපිත ආයතනවල ක්‍රියාකාරීත්වය පිළිබඳ මගපෙන්වීමක් සිසුන්ට ලබාදිය යුතුය. එහිදී සොල්බරි ආණ්ඩුක්‍රමයේ ව්‍යවස්ථාපිත ආයතනවල ව්‍යුහයේ හා සංයුතියේ ලක්ෂණ පැහැදිලි කිරීමේ දී සුළු ජන අයිතීන්වලට සිදුවන බලපෑම විස්තර කර දීම සිදුකළ යුතු ය.

### 3.3.11 ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර

**6. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ජනාධිපති ධුරයේ බලතල සම්බන්ධයෙන් පහත සඳහන් සංශෝධන මඟින් සිදු කරන ලද වෙනස්කම් පෙන්වා දෙන්න.**

**(i) 18වන සංශෝධනය**

මෙම සංශෝධනය ගෙන ලද්දේ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය කරන දේශපාලන ස්ථාවරත්වය සඳහා විධායක ජනාධිපතිවරයාගේ බලතල ශක්තිමත් කළ යුතු ය යන තර්කය මත ය. ඒ අනුව පහත සඳහන් වෙනස්කම් ජනාධිපතිවරයාගේ බලතල සම්බන්ධයෙන් සිදු කරන ලදි.

- ජනාධිපතිවරයා සඳහා පැවැති ධූර දෙකෙහි සීමාව ඉවත් කිරීම
- 17 වන සංශෝධනය මගින් ගොඩ නගන ලද සංවරණ සහ තුලන ක්‍රමයන්ගෙන් නිදහස් ව ජනාධිපතිවරයාට ස්වාධීන කොමිෂන් සභාවලට පත් කිරීම් කිරීමට බලතල ලබා දීම සහ එම කොමිෂන් සභා ජනාධිපතිට යටත්ව තැබීම
- ස්වාධීන කොමිෂන් සභාවල සාමාජිකයන් ඉවත් කිරීමේ බලය ද ජනාධිපතිවරයාට ලබා දීම
- කලින් පැවැති ව්‍යවස්ථා සභාව වෙනුවට ගොඩනගන ලද පාර්මේන්තු සභාවට බලය පැවැතියේ බැඳීම්වලට ලක් නොවන උපදෙස් (non-binding advice) ජනාධිපතිවරයා වෙත ලබා දීමට ය. මෙමගින් ඉහළ අධිකරණ වලට, ස්වාධීන කොමිසන් සභාවලට සාමාජිකයන් ඍජුව සහ සිය අභිමතය අනුව පත් කිරීමට ජනාධිපතිවරයාට අධිකාරිය ලබා දෙන ලදි.
- මේ සංශෝධනයෙන් නීතිපති, විගණකාධිපති, ඔම්බුඩ්ස්මන්, පාර්ලිමේන්තු මහලේකම් සහ අධිකරණ සේවා කොමිසමේ සභාපති හැර සෙසු සාමාජිකයන් පත් කිරීම් සම්බන්ධයෙන් ජනාධිපතිගේ බලය පුළුල් කරන ලදි.

**නිගමනය**

18 වන සංශෝධනයෙහි සමස්ත ප්‍රතිඵලය වූයේ ජනාධිපතිවරයාගේ තත්වය, බලතල සහ අධිකාරිය තවදුරටත් ශක්තිමත් වීම ය. ඒ අනුව 1978 මුල් ව්‍යවස්ථාව යටතේ පැවැති ජනාධිපතිධූරයට වඩා 18 වන සංශෝධනය යටතේ පැවැති ජනාධිපතිධූරය වඩා බලගතු විය. මෙලෙස 18 වන සංශෝධනයෙන් නැවත ශක්තිමත් කරන ලද ජනාධිපතිවරයාගේ විධායක බලය අධිකරණය, රාජ්‍ය සේවය සහ මැතිවරණ දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය කෙරෙහි අභියෝගයක් විය.

**(ii) 19වන සංශෝධනය**

19 වන සංශෝධනය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද සංශෝධන අතුරින් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී සංශෝධනය ලෙස හැඳින්විය හැකි ය.

එහි ප්‍රධාන අංග මෙසේය

- ජනාධිපතිවරයාගේ බලතල ක්‍රියාවට නැංවීම සංවරණ හා තුලන ක්‍රමයන්ට යටත් කිරීම.
- මේ අනුව 18 වන සංශෝධනයෙන් මුළුමනින් ම ජනාධිපති වටා ඒකරාශිකර තිබුණු විධායක බලය ක්‍රියාවට නැංවීම අගමැති සමග සිදු කිරීමට විධිවිධාන යෙදීම.
- ව්‍යවස්ථා සභාව නැවත පිහිටුවන ලද අතර එතෙක් ජනාධිපතිවරයා සතුව පැවැති ඇතැම් පත් කිරීම් පිළිබඳ බලයට එමගින් සංවරණ යෙදීම. එනම් ජනාධිපතිවරයා විසින් සිදු කරනු ලබන ඇතැම් පත් කිරීම් ව්‍යවස්ථා සභාව විසින් නියාමනය කිරීම.
- 19 වන සංශෝධනය ක්‍රියාත්මක කිරීමට පෙර ඇමතිවරු පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සැළකිය යුතු බලයක් භුක්ති වින්දේ ය. මෙම සංශෝධනයෙන් ඇමතිවරුන් සහ රාජ්‍ය ඇමැතිවරුන් පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට සීමාකම් පැනවිණි. ඒ අනුව කැබිනට් ඇමතිවරුන් 30 කට වඩා පත් කළ නොහැකි ය. රාජ්‍ය ඇමැතිවරුන් සහ නියෝජ්‍ය ඇමතිවරුන් 40 කට වඩා පත් කළ නොහැකි ය.
- ජනාධිපති විසින් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් අතුරින් ඇමතිවරුන් සහ නියෝජ්‍ය ඇමැතිවරුන් කිරිම පත් කළ යුත්තේ අගමැතිවරයාගේ උපදෙස්වලට යටත්ව ය.
- ජනාධිපතිවරයාට ඇමති මණ්ඩලයේ සංයුතිය, ඇමැතිවරුන්ට පවරන ලද විෂය කාර්ය වෙනස් කළ හැකි වුව ද, ඇමැතිවරුන් සිය ධූර වලින් පහකළ හැක්කේ අගමැතිගේ උපදෙස් මත ය.
- කැබිනට් මණ්ඩලය විසුරුවා හැරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සතුව පැවති බලය ඉවත් කරන ලද අතර, කැබිනට් මණ්ඩලයේ පැවැත්ම තීරණය කිරීම පාර්ලිමේන්තුව වෙත පවරන ලදි.
- ජනාධිපති නිල කාලය වසර පහ දක්වා අඩු කිරීම සහ ජනාධිපතිධූරය කෙරෙහි මුල් ව්‍යවස්ථාවෙහි පැවැති වාර දෙකෙහි සීමාව නැවත හඳුන්වා දීම.
- පාර්ලිමේන්තු නිල කාලය වන වසර පහෙන් අවසන් මාස හය තුල හැර ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට නොහැකි වීම.

- 19 වන සංශෝධනය යටතේ ජනාධිපතිවරයාගේ නිල කටයුතු මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අධිකරණ බලයට යටත් කිරීම. ඒ යටතේ සිවිල් සහ අපරාධමය කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරාගේ මුක්තියට සීමාවක් පැනවිණි.
- 1978 මුල් ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයා වෙත පවරන ලද බලතල සහ කාර්යයන්ට අතිරේකව තවත් බලතල සහ කාර්යයන් කිහිපයක් මේ සංශෝධනයෙන් ජනාධිපතිවරයා වෙත පවරා ඇත. ඒවා නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිපදින බවට සහතික වීම, ජාතික සහයෝගීතාව සහ සංහිඳියාව සහතික කිරීම, ව්‍යවස්ථා සභාව සහ සෙසු කොමිසන් සභාවල ස්වාධීනත්වයට පහසුකම් සැළසීම සහ මැතිවරණ කොමිසමේ උපදෙස් මත නිදහස් සහ සාධාරණ මැතිවරණ සහ ජනමතවිචාරණ පැවැත්වීම සුදුසු සහ හිතකර පරිසරයක් ඇති කිරීම


**නිගමනය**

- 19 වැනි සංශෝධනය, 1978 මුල් ව්‍යවස්ථාව යටතේ පැවති 'විධායක' ජනාධිපති ක්‍රමයේ සමස්ත ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම අරමුණු කොට ගෙන සකස් කරන ලද ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යෝජනාවක ප්‍රතිඵලයකි.
- ජනාධිපතිවරයාගේ බලය සීමා කිරීම එම ප්‍රතිසංස්කරණ ව්‍යායාමයේ එක් වැදගත් පැතිකඩකි. ඒ මගින් පාර්ලිමේන්තු කැබිනට් ආණ්ඩු ක්‍රමයේ මූලික පැති කිහිපයක් ලංකාවේ ආණ්ඩු ක්‍රමයට යළිත් හඳුන්වා දෙනු ලැබේ.
- එසේ වුවද මෙම ප්‍රතිසංස්කරණය නිසා අනපේක්ෂිත අයහපත් ප්‍රතිඵල ද ඇති විය. 2018 වසරේ අගදී සිදු වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදය එහි එක් නිෂේධනීය ප්‍රතිඵලයකි.

### 3.3.12 ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.14**

ප්‍රශ්න අංක 6 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.

ඉන්;

ලකුණු 00– 05 ප්‍රාන්තරයේ 37.71%ක් ද

ලකුණු 06– 10 ප්‍රාන්තරයේ 25.01%ක් ද

ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 24.30%ක් ද


ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 12.97%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත. අපේක්ෂකයන් අතුරෙන් 37.71%ක් ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇත. අපේක්ෂකයන්ගෙන් 12.97%ක් ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇත.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.15**

ප්‍රශ්න අංක 6 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

06 ප්‍රශ්නය ''1978 ව්‍යවස්ථාව යටතේ ඇති වූ ආණ්ඩුක්‍රමයේ ව්‍යූහාත්මක ලක්ෂණ ආයතනික සංයුතිය සහ බලතුලනය හඳුනාගෙන පැහැදිලි කරයි'' යන නිපුණතාවට සහ ''1978 ව්‍යවස්ථාවේ ප්‍රධාන සංශෝධනවලින් ආණ්ඩුක්‍රමයට ඇති කළ වෙනස්කම්වල ස්වභාවය හඳුනා ගැනීම'' යන නිපුණතා මට්ටමට අනුව සකස් කර ඇත. මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 40%කි. සමස්ත ප්‍රශ්නයෙහි පහසුතාව 44%කි.

මෙම ප්‍රශ්නය ද කොටස් දෙකකින් සමන්විතය. (i) කොටසින් 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ ජනාධිපතිවරයාගේ බලතල සම්බන්ධයෙන් 18 වන සංශෝධනය මඟින් සිදුකළ වෙනස්කම් ද, (ii) කොටසින් 19 වන සංශෝධනය මඟින් සිදු කරන ලද වෙනස්කම් ද හඳුනා ගැනීම අපේක්ෂා කර ඇත. (i) හා (ii) කොටස් සඳහා ලකුණු 10 බැගින් වෙන වෙනම ප්‍රදානය කර ඇත. (i) කොටසෙහි පහසුතාව 40%කි. (ii) කොටසෙහි පහසුතාව 49%කි. (i) කොටසට සාපේක්ෂව (ii) කොටස සඳහා වැඩි සාධනයක් පෙන්නුම් කර ඇත.

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමයට අදාළව ජනාධිපතිවරයාගේ බලතල සම්බන්ධයෙන් 18 හා 19 ව්‍යවස්ථාපිත සංශෝධන මඟින් සිදු කරන ලද වෙනස්කම් සුවිශේෂීව හඳුනා නොගැනීම සහ 18වන සංශෝධනය පිළිබඳ ප්‍රායෝගික අද්දැකීම් ප්‍රමාණවත් නොවීම (i) කොටසෙහි අඩු සාධනයට හේතු වී ඇත.

19වන සංශෝධනය ක්‍රියාත්මක වූ කාලය තුළ දී සිදු වූ ආන්දෝලනාත්මක තත්ත්වයන් වන අගමැති ඉවත් කිරීම, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම වැනි සිදුවීම් හේතුවෙන් රට තුළ විශාල කතිකාවක් නිර්මාණය වීමෙන් ඇති වූ ප්‍රායෝගික අද්දැකීම් බොහෝ අපේක්ෂකයන් ග්‍රහණය කරගැනීම (ii) කොටසෙහි වැඩි සාධනයට හේතු වූවා විය හැකි ය.

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය වර්තමානයේ භාවිත වන ආණ්ඩුක්‍රමයයි. මෙම ආණ්ඩුක්‍රමයට අදාළ වැදගත්ම ව්‍යවස්ථාපිත ආයතනික පද්ධතිය විධායක ජනාධිපතිධූරයයි. එම ජනාධිපතිධූරය සම්බන්ධව මුල් ව්‍යවස්ථාව තුළ මෙන්ම, පසු කාලීන සංශෝධන මඟින් සිදු කරන ලද වෙනස්කම් පිළිබඳ ලක්ෂණ වෙන් වෙන් වශයෙන් අවබෝධ කර ගැනීමට සිසුන්ට මග පෙන්වීම සිදු කළ යුතු ය. ජනාධිපතිධූරය සතු බලතල හා කාර්යයන්වල තත්ත්වය 18 හා 19 ව්‍යවස්ථා සංශෝධනවලට අදාළව පමණක් සීමා නොකර 17 වන සංශෝධනය ඇසුරින්ද පැහැදිලි කර දීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කර ගත යුතු ය. එහි දී එක් එක් ව්‍යවස්ථා සංශෝධනවල ජනාධිපතිධූරය සම්බන්ධව පවතින තත්ත්වය පමණක් නොව අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතනවල වෙනස්කම් වෙන් වෙන්ව හඳුනා ගැනීමට ද සිසුන් යොමු කළ යුතු ය. ප්‍රශ්න සැකැස්ම පිළිබඳව ද අවබෝධයක් සහිතව පිළිතුරු ලබා දීමෙන් සාධන මට්ටම ඉහළ තත්ත්වයක රඳවා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

### 3.3.13 ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර

**7. (i) 'ගැටුම' යන සංකල්පය අර්ථ දක්වන්න.**

- ගැටුමක් යනු පුද්ගලයන්, සමාජ කණ්ඩායම් හෝ රාජ්‍ය දෙකක් හෝ වැඩි ගණනක් අතර ඇතිවන විශේෂ සම්බන්ධතාවකි.
- ගැටුමක් යනු 'එකිනෙකාට නොපෑහෙන අරමුණු ඇති පාර්ශව දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් අතර ඇති සම්බන්ධතාවයකි' යන ක්‍රිස්ටෝපර් මිචෙල් දක්වා ඇති අර්ථකථනද සිසුන්ට භාවිත කළ හැකිය.

*(ලකුණු 05)*

**(ii) ගැටුම් වර්ගීකරණය කර ඇති ආකාරය නිදසුන් සහිතව පෙන්වා දෙන්න.**

ගැටුම් වර්ගීකරණය කළ හැකි ආකාර තුනක් තිබේ.

1. සරල වර්ගීකරණය
2. කෘත්‍යවාදී වර්ගීකරණය
3. දේශපාලන වර්ගීකරණය

**1. <u>සරල වර්ගීකරණය</u>**

i. පුද්ගල අභ්‍යන්තර ගැටුම්; එනම් පුද්ගලයින්ට තම සිත ඇතුලේ ඇතිවන ගැටුම්, මෙම ප්‍රභේදයට අයත් ය.

ii. අන්තර් පුද්ගල ගැටුම්; පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර තම අන්තර් සම්බන්ධතා වලදී ඇතිවන ගැටුම් ය.

iii. කණ්ඩායම් ඇතුලත ඇතිවෙන ගැටුම්; සමාජ කණ්ඩායමකට අයත් වන පුද්ගලයින්ගේ වෙනස් අරමුණු සහ අභාලාෂ මත පදනම්ව හට ගැනෙන ගැටුම්.

iv. කණ්ඩායම් අතර ඇතිවන ගැටුම්; මෙයට අයත් වන්නේ එකිනෙකාට නොපෑහෙන අරමුණු නිසා පුද්ගල කණ්ඩායම් අතර ඇතිවන ගැටුම් ය.

**2. <u>කෘත්‍යවාදී වර්ගීකරණය</u>**

දෙයාකාරයක ගැටුම් කෘත්‍යවාදී වර්ගීකරණයට අයත් වේ.

i. සාධනීය ගැටුම්, එනම්, ගැටුම අවසානයේදී, තමන්ට එයින් වාසියක් ඇති වූ බව ගැටුමෙහි පාර්ශ්වකරුවන් සිතන්නේ නම් එය සාධනීය ගැටුමකි.

ii. නිෂේධනීය ගැටුම්. නිෂේධනීය ගැටුමකදී පාර්ශ්ව සිතන්නේ ගැටුම නිසා තමන්ට අලාභයක් සිදුවූ බවයි. එවැනි ගැටුම්වලදී සිදුවන්නේ ගැටුම අලුත් කිරීමට පාර්ශ්ව පෙළඹීමයි.

**3. දේශපාලන වර්ගීකරණය**

මහාචාර්ය පීටර් වොලන්ස්ටීන්, තුන් ආකාරයක දේශපාලන ගැටුම් ඇති බව පෙන්වා දෙයි.

i. අන්තර් රාජ්‍ය ගැටුම්; මේවා රාජ්‍යයන් දෙකක් හෝ කිහිපයක් අතර, දේශ සීමා හෝ සම්පත් පිළිබඳ මතභේද නිසා හටගන්නා ගැටුම්ය. සමහර විට මෙවැනි ගැටුම් අන්තර් රාජ්‍ය යුද්ධ බවට ද පත් විය හැකිය.

ii. රාජ්‍ය අභ්‍යන්තර; ගැටුම් රාජ්‍යයන් ඇතුළත සිදුවන ගැටුම්වලට බොහෝ විට පදනම් වන්නේ දේශපාලන බලය පිළිබඳ ප්‍රශ්නයි. ව්‍යුහාත්මක, සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික සහ මතවාදී හේතු ඒවාට සාමාන්‍යයෙන් තුඩු දෙයි.

iii. රාජ්‍ය නිර්මාණ ගැටුම්

- මහාචාර්ය පීටර් වොලන්ස්ටීන් කියන පරිදි රාජ්‍ය නිර්මාණ ගැටුම් යනු රාජ්‍යයක් තුළ යම් කිසි භූමි ප්‍රදේශයකට අයිතිවාසිකම් කියන ප්‍රජාවක් සහ රාජ්‍යය අතර ඇති වන ගැටුම් ය.
- වාර්ගික අනන්‍යතාව, ප්‍රාදේශීය අනන්‍යතාව, බලය බෙදා ගැනීම යන මේවා අවධාරණය කරන ගැටුම් රාජ්‍ය නිර්මාණ ගැටුම් ය.
- රාජ්‍ය නිර්මාණ ගැටුම් විසඳීම සඳහා එවැනි ඉල්ලීම් වලට දේශපාලන වශයෙන් ඉඩ ලබා දෙමින් පවත්නා දේශපාලන ව්‍යුහ ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ.

*(ලකුණු 10)*

**(iii) ගැටුම් සමථන මාධ්‍යයක් ලෙස සහමන්ත්‍රණය (negotiation) යන සංකල්පය ලුහුඬින් පැහැදිලි කරන්න.**


- ගැටුම් සමථන ක්‍රියාවලියේදී උපයෝගී කර ගන්නා ප්‍රධාන මාධ්‍ය හතරක් තිබේ. සහමන්ත්‍රණය ඒවායින් එකකි. අනෙක් ඒවා නම් මැදිහත්කරණය, සාම ගිවිසුම් සහ සාමය ගොඩනැගීම ය.
- ගැටුම් උත්සන්න වීම වැළැක්වීමට සහ ගැටුම් විසඳීමට පාර්ශව අතර සහමන්ත්‍රණය අවශ්‍ය වේ.
- රොජර් ෆිෂර් සහ විලියම් යූරි සහමන්ත්‍රණය යන්න අර්ථ දක්වන්නේ මෙපරිදිය. 'සහමන්ත්‍රණය යනු අපට අන්‍යයන්ගෙන් ලබා ගැනීමට වුවමනා දේ ලබා ගැනීම සඳහා යොදා ගන්නා මාධ්‍යයකි. ඔබ සහ අනෙක් පාර්ශ්වය අතර බෙදාගත හැකි පොදු අභිලාෂ මෙන්ම පටහැනි අභිලාෂද පවතින විට දෙපාර්ශවය අතර එකඟතාවක් ඇතිකර ගැනීම අරමුණු කොට ගෙන සිදුවන සන්නිවේදන හුවමාරුව සහමන්ත්‍රණයයි.'
- සහමන්ත්‍රණය යනු ගැටුමකට හෝ ආරවුලකට මැදි වී සිටින පාර්ශ්ව ඒවා විසඳා ගැනීම සඳහා 'කථා කිරීමේ' නැතහොත් 'සාකච්ඡා කිරීමේ' ක්‍රියාවලියයි.
- සහමන්ත්‍රණ ආකාර තුනක් තිබේ. ඒවා නම් (අ) ගැටලු විසඳීමේ සහමන්ත්‍රණය, (ආ) ආරවුල්කාරී සහමන්ත්‍රණය, සහ (ඇ) නම්‍යශීලී සහමන්ත්‍රණය යි.

### 3.3.14 ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.16**

ප්‍රශ්න අංක 7 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.





ඉන්;

ලකුණු 00– 05 ප්‍රාන්තරයේ 40.39%ක් ද
ලකුණු 06– 10 ප්‍රාන්තරයේ 26.20%ක් ද
ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 22.16%ක් ද
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 11.25%ක් ද
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත. අපේක්ෂකයන් අතුරෙන් 66.59%ක් වැනි ඉහළ ප්‍රතිශතයක් ලකුණු 10ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබා ඇත. අපේක්ෂකයන් අතුරෙන් 11.25%ක් ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇත.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.17**

ප්‍රශ්න අංක 7 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

7 ප්‍රශ්නය “ගැටුම්වල ස්වභාවය අවබෝධ කොටගෙන ගැටුම් නිරාකරණය සහ සාමය ගොඩනැගීම පිළිබඳ අවශ්‍යතාව ප්‍රකාශ කරයි” යන නිපුණතාව සහ "ගැටුම් හා ගැටුම් නිරාකරණය පිළිබඳ න්‍යායික සහ ප්‍රායෝගික අංශ පැහැදිලි කිරීමේ" නිපුණතා මට්ටම ඇසුරින් සකස් කර ඇත. අපේක්ෂකයන් අතුරෙන් 71%ක් මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන ඇති අතර සමස්ත ප්‍රශ්නයෙහි පහසුතාව 37%කි.

මෙම ප්‍රශ්නය න්‍යායාත්මක කරුණු මත පදනම් වූ කොටස් තුනකින් සමන්විත වූ ප්‍රශ්නයකි. (i) කොටසට ලකුණු 5ක් ද, (ii) කොටසට ලකුණු 10ක් ද, (iii) කොටසට ලකුණු 5ක් ද වෙන් කර තිබේ. (i) කොටසෙහි පහසුතාව 42%කි.

න්‍යායාත්මක කරුණු මත පමණක් පදනම්ව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති බැවින් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා අපේක්ෂකයන් සතුව විධිමත් දැනුමක් තිබිය යුතු ය. ගැටුම් වර්ගීකරණය නිදසුන් සහිතව පැහැදිලි කිරීම හා සහමන්ත්‍රණය යන සංකල්පය පැහැදිලි කිරීමට දක්වා ඇති දුර්වලතාවය (ii) හා (iii) කොටස්වල අඩු සාධනයට හේතු වී තිබිය හැකිය.

ගැටුම් පිළිබඳ සංකල්ප ප්‍රායෝගික බැවින් ඒ පිළිබඳ වැඩමුළු සහ ක්‍රියාකාරකම් පදනම් කර ගෙන සිසුන්ගේ දැනුම වර්ධනය කිරීමට කටයුතු කළ යුතු අතර මෙවැනි පැහැදිලි කිරීම් සිදු කළ යුතු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතු ආකාරය පිළිබඳ පෙර පුහුණුවක් ද සිසුන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

## 3.3.15 ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර

**8. ප්‍රංශයේ ඩිගොල්වාදී ආණ්ඩුක්‍රමයේ ඇති ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න.**

**හැඳින්වීම**

- ප්‍රංශයේ පස්වැනි සමූහාණ්ඩුවේ ආණ්ඩුක්‍රමය ඩිගෝල්වාදී ආණ්ඩුක්‍රමය ලෙසද හැඳින්වේ. එයට හේතුව එය ජනරාල් චාල්ස් ඩිගෝල් විසින් ඇති කරනු ලැබීමයි.
- එය විසින් කලින් පැවති පාර්ලිමේන්තුවේදී ආණ්ඩුක්‍රමය අහෝසි කර අර්ධ ජනාධිපති ක්‍රමයක් ඇති කරන ලදි.
- පස්වැනි සමූහාණ්ඩුව බොහෝ සේ මධ්‍යගත, ඒකීය ආණ්ඩු ක්‍රමයක් ද වේ.
- දේශපාලන අස්ථාවරභාවයට, දුර්වල විධායකය සහ මනා ලෙස සංවිධාන ගත නොවූ දේශපාලන පක්ෂ ක්‍රමයක් පැවතීම යන දුර්වලතා සහිතව තුන්වැනි හා සිව්වැනි සමූහාණ්ඩු යටතේ පැවති ආණ්ඩුක්‍රම විස්ථාපනය කිරීම එහි අරමුණ විය.
- නව ව්‍යවස්ථාවේ ප්‍රධාන නිර්මාණය වූයේ බල සම්පන්න ජනාධිපති ධූරයයි.
- මෙය වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රමයෙන් වෙනස් ආණ්ඩුක්‍රම ආකෘතියකි.

*(ලකුණු 03)*

**අන්තර්ගතය**

පස්වන සමූහාණ්ඩුව යටතේ ජනාධිපතිවරයා.

- ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා, ද ජාතික සමගියේ සංකේතයද වෙයි.
- රටේ ඇති දේශපාලන බෙදීම් සහ පක්ෂ දේශපාලනයෙන් ස්වාධීනය සිටිය යුතු යැයි අපේක්ෂා කෙරේ. (ඇල්ජීරියානු අර්බුදය අවස්ථාවේ දී මෙන්)
- ජනාධිපතිවරයා සිටින්නේ පාර්ලිමේන්තුවට ඉහළිනි. පාර්ලිමේන්තුව අගමැතිවරයා හා කැබිනට් මණ්ඩලය ජනාධිපතිවරයාට පහළින් සිටිති.

- ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වඩා බලතල අතින් බලවත් විධායකයේ ප්‍රධානියාය.
- අගමැතිවරයා සහ ඇමතිවරුන් පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.
- ඇමතිවරුන්ට කැබිනට් මණ්ඩලයේ සහ ව්‍යවස්ථාදායකයේ සමගාමී සාමාජිකත්වය දැරිය නොහැකිය. ව්‍යවස්ථාදායකයේ සාමාජිකයෙකු කැබිනට් මණ්ඩලයට පත් කරනු ලැබූ විට ඔහු/ ඇය පාර්ලිමේන්තුවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්විය යුතුය.
- විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර බලතල බෙදීමක් තිබේ.
- මුලදී තිබුණේ ජනාධිපතිවරයා ඡන්ද විද්‍යාලයකින් තෝරා පත් කිරීමේ ක්‍රමයයි. පසුව 1962 දී එය වෙනස් කර, ජනාධිපතිවරයා සෘජු මහජන ඡන්දයෙන් පත් කරනු ලැබීම ආරම්භ විය.
- ජනාධිපතිවරයාට හදිසි අවස්ථා බලතල ද තිබේ. ඔහුට හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ හැකිය.
- ජනාධිපතිවරයා තෝරා පත් කරන්නේ පස් වසරක ධූර කාලයකටය.
- ජනාධිපතිවරයා විසින් අගමැතිවරයා පත් කරනු ලබන අතර, ඔහු කැබිනට් ඇමතිවරුන් පත් කරන්නේ අගමැතිවරයාගේ උපදෙස් මතය.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු නොවන අයෙකු අගමැති ලෙස පත් කිරීමට ද ජනාධිපතිවරයාට බලය තිබේ.
- අගමැතිවරයා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ පසු ඔහුට/ ඇයට පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය ලබා ගැනීම අවශ්‍ය නොකෙරේ. අගමැතිවරයාට වැදගත් වන්නේ ජනාධිපතිවරයාගේ විශ්වාසයයි.

*(ලකුණු 15)*

**නිගමනය**

- සත්වැනි සමූහාණ්ඩුවෙන් ප්‍රංශයට හඳුන්වා දෙන ලද්දේ ද්විත්ව විධායක සහ අර්ධ ජනාධිපති ක්‍රමයකි.
- ඩිගෝල්වාදී ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ
  (අ). ආණ්ඩුක්‍රමය ජනාධිපති කේන්ද්‍රීය වීම
  (ආ). විධායකය ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීන වීම.
- ශ්‍රී ලංකාවේ 1978 පළමු ජනරජ ව්‍යවස්ථාව විසින් ඇති කරන ලද ආණ්ඩුක්‍රමයට ආදර්ශය වූයේ ප්‍රංශයේ ඩිගෝල්වාදී ආණ්ඩුක්‍රමයයි.
- මෙම ප්‍රංශ ඩිගෝල්වාදී ආණ්ඩු ක්‍රමය බොහෝ කලකින් සංශෝධන වලට භාජනය කර නැත.


*(ලකුණු 02)*

### 3.3.16 ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.18**

ප්‍රශ්න අංක 8 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය කි.




ඉන්;


ලකුණු 00 – 05 ප්‍රාන්තරයේ 34.68%ක් ද
ලකුණු 06 – 10 ප්‍රාන්තරයේ 25.65%ක් ද
ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 22.09%ක් ද
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 17.58%ක් ද
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත.

මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගත් අපේක්ෂකයන් අතුරෙන් 60.33%ක් ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇත. අපේක්ෂකයන් අතුරෙන් 17.58%ක් ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.19**

ප්‍රශ්න අංක 8 සඳහා පහසුතා දර්ශකය




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

08 ප්‍රශ්නය "සමකාලීන ලෝකයේ පවත්නා විවිධ ආණ්ඩුක්‍රම මාදිලි පිළිබඳ තුලනාත්මක අවබෝධයකින් යුතු පුද්ගලයෙකු ලෙස ක්‍රියා කරයි" යන නිපුණතාව සහ "සමකාලීන ලෝකයේ පවතින ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රමවල අනන්‍යතා සහ වෙනස්කම් විග්‍රහ කරයි" යන නිපුණතා මට්ටම මත පදනම්ව සකස් කර ඇත.

අපේක්ෂකයන් අතුරෙන් 9%ක් වැනි සුළු ප්‍රතිශතයක් මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන ඇත. සමස්ත ප්‍රශ්නයෙහි පහසුතාව 30%කි. ආණ්ඩුක්‍රම මාදිලි පිළිබඳ විධිමත් දැනුමක් බොහෝ අපේක්ෂකයන් සතු නොවීම හේතුවෙන් මෙම ප්‍රශ්නය අඩු අපේක්ෂකයන් පිරිසක් පිළිතුරු සැපයීම සඳහා තෝරා ගැනීමට හේතු වූ බව සිතිය හැකි ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ආණ්ඩුක්‍රම මාදිලි පිළිබඳ දැනුම ලබාදීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකි අතර අන්තර්ජාලය මගින් අදාළ නිර්දේශිත රටවල ආණ්ඩුක්‍රම ඉතිහාසය හා ඒවායේ මූලික ලක්ෂණ පිළිබඳ කරුණු ගවේෂණයට සිසුන් යොමු කිරීම ද සිදු කළ හැකි ය. මෙවැනි නිපුණතාවන් සිසුන් තුළ සාධනය කිරීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩි අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

## 3.17 ප්‍රශ්න අංක 9 සහ අපේක්ෂිත පිළිතුර

**9. (i) 'රාජ්‍ය ප්‍රතිපත්ති' යන්න නිර්වචනය කරන්න.**

"රාජ්‍ය ප්‍රතිපත්ති" යන්න නිර්වචනය කළ හැකි ආකාර කිහිපයක් තිබේ. එම අර්ථකථන ආශ්‍රයෙන් "රාජ්‍ය ප්‍රතිපත්ති" යන්න පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට අපට හැකි වේ.

- රාජ්‍ය ප්‍රතිපත්ති යනු දේශපාලන ක්‍රියාවලියකි. එය සියලු පුරවැසියන්ට අදාළ දෙයක් ද වෙයි.
- රාජ්‍ය ප්‍රතිපත්ති යනු එක් ප්‍රතිපත්ති ලේඛනයකට හෝ අවස්ථාවකට සීමා වන්නක් නොවේ.
- රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියේ අවධි කිහිපයක් තිබේ. ඒවා නම් ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය සකස් කිරීම, ප්‍රතිපත්ති නිර්මාණය, ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීම සහ ප්‍රතිපත්ති ඇගයීමයි.
- රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කරන්නේත්, ක්‍රියාවට නගන්නේත් දේශපාලන අධිකාරියයි.
- රාජ්‍ය ප්‍රතිපත්ති වලින් ආමන්ත්‍රණය කරන කරුණු ඇත්ත වශයෙන් පවතින ඒවා මෙන්ම මනඃකල්පිත ඒවා ද විය හැකිය.
- රාජ්‍ය ප්‍රතිපත්තිවල ස්වරූපය, අන්තර්ගතය සහ ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය, ප්‍රතිපත්ති සම්පාදනය කරන බලධාරීන් සතුව ඇති තොරතුරු අනුව වෙනස් විය හැකිය.
- තොමස් ආර් ඩයි රාජ්‍ය ප්‍රතිපත්ති යන්න අර්ථ දක්වන්නේ ආණ්ඩු කරන්නේ මොනවාද? ඒවා එසේ කරන්නේ මන්ද? සහ එයින් ඇතිවන වෙනස කුමක්ද යනුවෙනි.
- හැරල්ඩ් ලැස්වෙල්ට අනුව, ආණ්ඩුවේ ක්‍රියාකාරී සැලසුමේ ඇති අපේක්ෂිත වැඩසටහන් අරමුණු, ඇගයීම් සහ භාවිත රාජ්‍ය ප්‍රතිපත්තියට අයත් වෙයි.
- ජෙම්ස් ඇන්ඩර්සන් රාජ්‍ය ප්‍රතිපත්තිය යන්න අර්ථ දක්වා තිබෙන්නේ, රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව ඇති දැනුම ප්‍රයෝජනයට ගනිමින් යම් කිසි ගැටළුවක් විසඳීම සඳහා ආණ්ඩුවේ ක්‍රියාධරයන් අනුගමනය කරන පැහැදිලි අරමුණක් සහිත ක්‍රියාවලියක් ලෙසය.

*(ලකුණු 05)*

**(ii) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමයේදී දේශපාලන විධායකය සහ ස්ථිර විධායකය සතු භූමිකාව පැහැදිලි කරන්න.**

**හැඳින්වීම**

- නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමවල රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියේදී දේශපාලන සහ ස්ථිර විධායකය යන දෙකම වැදගත් කාර්ය භාරයක් ඉටු කරති.
- සාම්ප්‍රදායික වටහා ගැනීම් වූයේ ප්‍රතිපත්ති සම්පාදනය දේශපාලන විධායකයේ වගකීම බවත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ස්ථිර විධායකයකට අයත් නිලධාරීන්ගේ කාර්යය බවත්ය.
- දේශපාලන හා ස්ථිර විධායකයට අමතරව, තවත් බල ආයතන දෙකක් ද, අවශ්‍ය අවස්ථාවන්හි රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියට සම්බන්ධ වෙති. ඒ ව්‍යවස්ථාදායකය සහ අධිකරණයයි.
- ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමෙන් ඇති රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියට ප්‍රාදේශීය හා පළාත් පාලන අධිකාරීහු ද සම්බන්ධ වෙති.

*(ලකුණු 03)*

**අන්තර්ගතය**

දේශපාලන විධායකයේ කාර්යභාරය

- දේශපාලන න්‍යායට අනුව රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ අවසාන බලධාරියා වන්නේ දේශපාලන විධායකය වන කැබිනට් මණ්ඩලයයි.
- දේශපාලන විධායකය, රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය පිළිබඳව ව්‍යවස්ථාදායකය හරහා මහජනතාවට වගකියති.
- ජනාධිපති ආණ්ඩුක්‍රමයකදී පවා ප්‍රතිපත්ති සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට නායකත්වය දෙන්නේ දේශපාලන විධායකයයි.
- ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී දේශපාලන විධායකය, සිවිල් සේවය මත රැඳෙයි.
- පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල, ව්‍යවස්ථා සම්පාදන න්‍යාය පත්‍රය කුමක්දැයි තීරණය කරන්නේ දේශපාලන විධායකය වන කැබිනට් මණ්ඩලයයි.
- එබැවින් දැනට සිදුවන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේදී දේශපාලන විධායකය, ව්‍යවස්ථාදායකය අභිභවා සිටීමයි.

ස්ථිර විධායකයේ කාර්යභාරය

- නූතන රාජ්‍යවල ස්ථිර විධායකය පිහිටුවා තිබෙන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට හා රාජ්‍ය පරිපාලන කටයුතු වලටය. එය 'නිලබල ක්‍රමය' සහ 'සිවිල් සේවය' යනුවෙන් හඳුන්වනු ලබන පුද්ගලයින්ගෙන් සමන්විත ස්ථිර ආයතනයකි.
- ස්ථිර විධායකය යන්න සළකනු ලැබෙන්නේ අ-දේශපාලනික විශේෂඥයින්ගෙන් සමන්විත ආයතනයක් ලෙසය. ආණ්ඩුව වෙනස් වුවද, මෙම ස්ථිර විධායකය වෙනස් නොවේ. එබැවින් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සැළකෙනු ලබන්නේ දේශපාලන නොවන තාක්‍ෂණික ව්‍යායාමයක් ලෙසයි.
- ස්ථිර විධායකයේ ප්‍රධාන කාර්යය ආණ්ඩුවේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීමයි. එය දේශපාලන විධායකයේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වන්නේ ස්වාධීනවයි.
- රාජ්‍ය පරිපාලනය පිළිබඳ සාම්ප්‍රදායික න්‍යායට අනුව ස්ථිර විධායකයට ප්‍රතිපත්ති සම්පාදන වගකීමක් නැත.
- එහෙත් වර්තමානයේ සැළකෙන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති වල ඇති සංකීර්ණතාව නිසා නිලධාරීන් දේශපාලඥයින් අභිභවා ඉදිරියට පැමිණ ඇති බවයි. ඔවුනට ඒ සඳහා අවශ්‍ය විශේෂඥතාව ද, දැනුම ද, තොරතුරු ද තිබේ.
- සමහරුන් තර්ක කරන්නේ වර්තමානයේ නිලධාරීන් සැබෑ ප්‍රතිපත්ති සම්පාදකයින් වී ඇති බවයි. මෙය හැඳින්වෙන්නේ දේශපාලනය නිලධාරීකරණය වීම ලෙසය.

*(ලකුණු 10)*

**නිගමනය**

- ප්‍රතිපත්ති ක්‍රියාවලියේ දී දේශපාලන විධායකය සහ ස්ථිර විධායකය සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියා කිරීම අවශ්‍ය වේ. එමෙන්ම ස්ථිර විධායකය දේශපාලන වශයෙන් අපක්ෂපාතී විය යුතුය.
- දේශපාලඥයින් ද මහජනතාව ද රාජ්‍ය පරිපාලනයට සෘජුව බලපෑම් නොකළ යුතු යයිද මතයක් පවතී.
- රාජ්‍ය ප්‍රතිපත්ති තුළින් මහජන ප්‍රශ්න විසඳී නැතැයි යන විවේචනය ද සමාජයේ තිබේ. රැකියා විරහිත භාවයේ ගැටලුව නොවිසඳී තිබීම නිදසුනකි.
- නූතන ප්‍රජාතන්ත්‍රවාදී රටවල ස්ථිර විධායකය රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී විශාල කාර්යයක් ඉටු කරයි. නිලධාරීන් සතු විශේෂඥ දැනුම හා පළපුරුද්දත් සංකීර්ණ සමාජ ගැටළු පිළිබඳ ඔවුන් සතු අවබෝධයත් එයට හේතුවයි.


*(ලකුණු 02)*

### 3.3.18 ප්‍රශ්න අංක 9 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.20**

ප්‍රශ්න අංක **9** සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණු වල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.





ඉන්;

ලකුණු 00– 05ප්‍රාන්තරයේ 60.40%ක් ද
ලකුණු 06– 10ප්‍රාන්තරයේ 20.40%ක් ද
ලකුණු 11 – 15ප්‍රාන්තරයේ 11.04%ක් ද
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 8.16%ක් ද
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත.
අපේක්ෂකයන් අතුරෙන් 60.40%ක් ලකුණු 05ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබා ඇත. අපේක්ෂකයන් අතුරෙන් 19.2%ක් ලකුණු 11ක් හෝ ඊට වඩා වැඩියෙන් ලබා ඇත. ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාවෙන් අඩක් හෝ ඊට අඩුවෙන් ලබාගත් ප්‍රතිශතය 80.80%ක් වැනි ඉහළ ප්‍රමාණයකි.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළපර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය** 3.21

ප්‍රශ්න අංක 9 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

9 ප්‍රශ්නය " රාජ්‍ය ප්‍රතිපත්ති දේශපාලන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක්ය යන අවබෝධය ප්‍රදර්ශනය කරයි" යන නිපුණතාව සහ දේශපාලනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධ කරන ක්‍රියාවලිය විස්තර කිරීමත්, රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියෙහිලා නිලබල ක්‍රමයේ භූමිකාව පැහැදිලි කිරීමත් යන නිපුණතා මට්ටම් මත පදනම්ව සකස් කර ඇත. කොටස් 2කින් සමන්විත මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය 22%කි. සමස්ත ප්‍රශ්නයෙහි පහසුතාව 33%කි.

(i) කොටසේ පහසුතා 38%කි. (ii) කොටසට සාපේක්ෂව සාධනය වැඩි වීමට හේතු වී ඇත්තේ, විධිමත් එක් නිර්වචනයක් පමණක් පිළිතුර ලෙස බලාපොරොත්තු වීම විය හැකි ය. (ii) කොටසේ පහසුතාව 28%කි. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන දේශපාලන විධායකය හා ස්ථිර විධායකයේ භූමිකාව පිළිබඳ ව සමහර අපේක්ෂකයන් සතුව මනා අවබෝධයක් නොතිබීම සහ පිළිතුර නිසි ලෙස ගොනු කිරීමට ඇති නොහැකියාව හේතුවෙන් සාධනය අඩු වූවා විය හැකි ය.

රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ව සහ එහි ක්‍රියාකාරිත්වයට සම්බන්ධ වන දේශපාලන විධායකය මෙන්ම ස්ථිර විධායකය පිළිබඳ මෙන්ම ආයතන අතර ඇති වෙනස පිළිබඳව ද සිසු අවබෝධය පුළුල් කිරීම සිදු කළ යුතු ය. මේ සඳහා විවාද, සංවාද හා විවිධ වැඩසටහන් ආදිය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ යොදා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

## 3.2.19 ප්‍රශ්න අංක 10 සහ අපේක්ෂිත පිළිතුර

**10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.**

**(i) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට බලපාන සාධක**

- භූ - දේශපාලනික සහ මූලෝපායයික සාධක
  - i. ඉන්දියානු සාගරයේ මධ්‍ය ලක්ෂයක පිහිටීම
    - ➢ ශ්‍රී ලංකාව ඓතිහාසික සහ නූතන ප්‍රධාන නාවුක මාර්ගවලට යාබද දිවයිනක් වශයෙන් පිහිටා තිබීම.
    - ➢ ලෝක බලවතුන්ගේ සාගරික උපාය මාර්ගවල (වෙළඳ, ආර්ථික, දේශපාලනික සහ ආරක්ෂක ආදී වූ උපාය මාර්ග) නොසලකා හැරිය නොහැකි ස්ථානයක පිහිටීම.
  - ii. දකුණු ආසියාතික රටක් සහ ඉන්දියානු සාගරයේ වටද්දර කලාපයේ (Indian ocean rim region) රටක් ලෙස පිහිටා තිබීම.
    - ➢ මේ නිසා බහු පාර්ශ්වික විදේශ ප්‍රතිපත්තිය ආශ්‍රිතව SAARC කලාපීය සංවිධානයේත්, BIMSTEC, IORA වැනි සාගරික වටද්දර කලාපීය සංවිධානවලත් ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස ක්‍රියාත්මක වීම.

- කලාපීය සහ ජාත්‍යන්තර බල තුලනය

  ගෝලීය බල තුලනයේ සිදුවන වෙනස්කම් සහ දකුණු ආසියා කලාපයේ මෙන්ම ආසියාවේ සිදුවන දේශපාලන, ආර්ථික, වෙළඳ සහ ආරක්ෂක යන ක්ෂේත්‍රවල වෙනස්කම් විදේශ ප්‍රතිපත්තියේ හැඩය තීරණය කිරීමට බලපාන බව.
- දේශපාලන ආර්ථිකය

  නිදහසින් පසු බලයට පත් ආණ්ඩු අනුමානය කරන ආර්ථික සහ සංවර්ධන දෘෂ්ටිවාද, උපාය මාර්ග සහ සැලසුම්.
- පාලන තන්ත්‍රයේ සහ දේශපාලන ප්‍රභූන්ගේ අභිලාෂ

  බලයට පත් වන පාලන තන්ත්‍ර සහ දේශපාලන නායකයින්ගේ අභිලාෂ අනුව බහු පාර්ශ්වික සහ ද්වි පාර්ශ්වික විදේශ ප්‍රතිපත්තිවල වෙනස්කම් සිදුවන බව.
- ජාතික අභිලාෂයන් සහ ජාතික බලය

  ජාතියක් ලෙස පවතින අභිලාෂ (national interests) සහ දේශපාලන ස්ථාවරත්වය, ආර්ථික ධාරිතාවන්, මිලිටරි ශක්තිය යනාදී සාධක විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය තීරණය කරන බව.
- ජන සමාජයේ අපේක්ෂා, මහජන මතය සහ අධිපති දෘෂ්ටීන්

  මහජන මතය සහ බහුතර මහජන මතය හැසිරවිය හැකි අධිපති දෘෂ්ටීන් විදේශ ප්‍රතිපත්තියට බලපාන බව.
- කුඩා රාජ්‍යයක් (Small state) වීම

  භෞමික සහ දේශපාලන, ආර්ථිකමය බලය අතින් කුඩා රාජ්‍යයක් වීම නිසා, කුඩා රාජ්‍යයන්ට අනන්‍යවන ගැටළු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන බව. ප්‍රධාන බලවතුන් පසුපස යාමට සිදුවීම (band wagoning) ඒ හේතුකොටගෙන සිදුවන තත්ත්වයකි.

## (ii) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

- ව්‍යවස්ථානුකූලවාදය

I. පටු අර්ථය : ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ ආණ්ඩු ක්‍රමයේ ස්වභාවය, ආයතන සහ භාවිත තීරණය කරනු ලැබ තිබීම සහ ඒ අනුව ආණ්ඩුකරණය සිදුවීම.

II. පුළුල් අර්ථය : සංවරණ සහ තුලන, බලතල බෙදීම, බලතල වෙන් කිරීම, මූලික නිදහස සහ මූලික අයිතීන් සුරක්ෂිත කිරීම සහ නීතියේ ආධිපත්‍ය සහිත ආණ්ඩු ක්‍රමයකට පදනම් මූලධර්ම සැකසීම.

- මහජන පරමාධිපත්‍ය

ආණ්ඩු බලය ජනතාව නැමැති උල්පතින් නිර්මාණය වන බව සැලකීම සහ දේශපාලන බලය මහජන කැමැත්ත මත රඳා පැවතීම.

- බලතල වෙන් කිරීම සහ බලතල බෙදීම

ආණ්ඩු බලය එක් පුද්ගලයෙකු හෝ ආයතනයක් වෙත කේන්ද්‍රගත වීම වැළැක්වීම මෙහි අරමුණයි.

- සංවරණ සහ තුලන

I. ආණ්ඩුවේ ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ආයතනවලින් එකක් අනිත් ආයතන අභිබවා යන්නේ නම් එම ආයතනය සෙසු ආයතන විසින් සංවරණය කළ යුතු බව.

II. ආණ්ඩුවේ ආයතන අතර බල සමතුලිතතාව.

- නීතියේ ආධිපත්‍යය

I. නීතිය ඉදිරියේ සමානත්වය (equality before law)

II. ව්‍යවස්ථාදායක සහ විධායක බලය පුද්ගල නිදහස ආරක්ෂා කරනු පිණිස නෛතික සංවරණයකට සහ අධිකරණයේ විමර්ශනයට පාත්‍ර විය යුතු වීම.

- මානව අයිතිවාසිකම් තහවුරු වීම.

විශ්ව පරිමාණ මානව අයිතිවාසිකම් සහ ව්‍යවස්ථාවෙන් අර්ථ දක්වනු ලබන මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම.

- සීමිත ආණ්ඩුව.

සංවරණයට සහ තුලනයට ලක් වූ බලතල සහිත ආණ්ඩුවේ ධූර කාලය ද සීමිතය.

- ප්‍රජාවට වගවීම.

- නිදහස් සහ සාධාරණ මැතිවරණ.

## (iii) ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය ක්‍රියාධරයෝ

රාජ්‍යය ක්‍රියාධරයින් වශයෙන් ජාතික රාජ්‍යය සහ සෘජුවම ජාතික රාජ්‍ය විසින් සාමාජිකත්වය දැරෙන සහ හැසිරවෙන අන්තර්ජාතික සංවිධාන මෙයින් අදහස් කෙරේ.

### 1. ජාතික රාජ්‍යය

- ජාත්‍යන්තර දේශපාලනයේ සාම්ප්‍රදායිකව ප්‍රධාන ක්‍රියාධරයා ලෙසින් සැලකුනේ ජාතික රාජ්‍යයන්ය. මෑත කාලීනව රාජ්‍ය නොවන ක්‍රියාධරයින් ජාත්‍යන්තර පද්ධතිය තුළ බලපෑම් සහගත තත්වයක් අත්කර ගත්ත ද ඒ තුළ රාජ්‍යයේ භූමිකාව දුර්වල වී නැත.
- නූතන ජාතික රාජ්‍යයට පදනම වැටුණේ 1648 වෙස්ට්ෆේලියා ගිවිසුම මගින් ඇති කළ එකඟතා ආශ්‍රයෙනි. වෙස්ට්ෆේලියානු මූලධර්ම විසින් රාජ්‍ය අභ්‍යන්තර (intra state) සහ අන්තර් රාජ්‍ය (inter state) සම්බන්ධතා සම්බන්ධ වැදගත් කොන්දේසි දෙකක් ප්‍රකාශයට පත් කෙරිණි.

I. රාජ්‍යයන් ස්වාධිපති ඒකකයන් ය. අභ්‍යන්තර කටයුතු සම්බන්ධයෙන් රාජ්‍යයන්ට ස්වාධීනත්වය හිමි වේ.

II. රාජ්‍ය අතර සම්බන්ධතා රාජ්‍යයන්ගේ ස්වාධිපත්‍යය ස්වාධීනත්වය පිළිගැනෙන සේ හැඩ ගැසිය යුතුය.

- 1933 මොන්ටිවිඩියෝ සම්මුතිය මගින් භූමිය, ජනගහනය, ආණ්ඩුව සහ සෙසු රාජ්‍යයන් සමග සබඳතා පැවැත්විය හැකිවීමේ ධාරිතාව රාජ්‍යයේ අංග ලක්‍ෂණ ලෙසින් ප්‍රකාශයට පත් කෙරිණි.

### 2. අන්තර් ජාතික රාජ්‍ය සංවිධාන

- ආණ්ඩුව මගින් සෘජුවම රාජ්‍යයන් නියෝජනය කෙරෙන අන්තර්ජාතික සංවිධාන අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන ලෙස හැඳින්වේ.
- අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන රාජ්‍යයන්ගේ සාමූහික අවශ්‍යතා මුදුන්පත් කර ගැනීම පිණිසත්, බහු පාර්ශ්වීය සහයෝගීතාව (multi lateral cooperation) නිර්මාණය කිරීම උදෙසාත් ගොඩ නැගී ඇත.
- වත්මන් ජාත්‍යන්තර පද්ධතිය තුළ පුළුල්තම අන්තර්ජාතික රාජ්‍ය සංවිධානය වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයයි.
- අරමුණු අතින් අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන වර්ග කිහිපයක් හඳුනාගත හැකිය.

i. ගෝලීය පරිමාණ සංවිධාන (උදා: එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක වෙළඳ සංවිධානය, ලෝක බැංකුව)

ii. කලාපීය සංවිධාන (SAARC, EU, ASEAN)

## (iv) ඉන්දීය ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

- ඉන්දියාව ඒකීය සහ සංඝීය ලක්‍ෂණ දෙකම පෙන්නුම් කරන ආණ්ඩුක්‍රම මාදිලියක් සහිත නිසා අර්ධ සංඝීය ව්‍යුහයක් සහිත බවට හඳුනා ගැනේ.

- කෙසේ වෙතත්, සංධීය වාදය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සෘජුව සඳහන් වී නැත. එසේ වුවත් ඉන්දියාවේ ඇත්තේ සන්ධීය ක්‍රමයක්ය යන පොදු පිළිගැනීමක් තිබේ.
- අනෙකුත් සංධීය ක්‍රම වල මෙන් ප්‍රාන්ත වල බල සමමිතිකතාව ඉන්දීය ආණ්ඩු ක්‍රමයේ දක්නට නොලැබේ. ඒ වෙනුවට ඇත්තේ ප්‍රාන්ත අතර බල අසම්මිතික බවකි. ඒ අනුව සමහර ප්‍රාන්ත වලට අනෙක් ප්‍රාන්ත වලට වඩා වැඩි බලතල තිබේ.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක පැවැත්ම අවධාරණය කර තිබේ.
- එහෙත් මෑත කාලීන ප්‍රවණතා ප්‍රකට කරන්නේ ප්‍රාන්තවල ස්වායත්තතාව වැඩි දියුණු වෙමින් පවතින බවයි.
- ඇමරිකාවේ ඇති සාම්ප්‍රදායික සංධීය ක්‍රමයක දක්නට ලැබෙන සෘජු, දෘඪ භාවය ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ දක්නට නොලැබේ. ඒ වෙනුවට නම්‍ය සංධීය ක්‍රමයක් ඉන්දියාවේ පවතී.
- ඉන්දියානු ආණ්ඩුක්‍රමය වෙස්ට්මින්ස්ටර් ක්‍රමයත්, ජනරජ ක්‍රමයත් අතර මිශ්‍රණයක් හා එකතුවක් ලෙස නිර්මාණය කර තිබේ.

## (v) දේශපාලන පක්ෂවල කාර්යයන්

මැතිවරණමය හෝ වෙනත් ක්‍රමයකින් ආණ්ඩු බලය ජයග්‍රහණය කිරීම පිණිස සංවිධානය වී ඇති පුද්ගල කණ්ඩායමක් දේශපාලන පක්ෂයක් ලෙස හැඳින්විය හැක. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල දේශපාලන පක්ෂ සතු කාර්යභාරය අධිකාරිවාදී නැතහොත් ප්‍රජාතන්ත්‍රවාදී නොවන ක්‍රමවල පක්ෂවල කාර්යභාරයෙන් වෙනස් විය හැකිය. සමස්ථයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල ඇති දේශපාලන පක්ෂවල කාර්යභාරය පහත සඳහන් පරිදි හඳුනාගත හැකිවේ.

### i. නියෝජනය

ඡන්ද දායකයින්ගේ සහ සාමාජිකයින්ගේ මත සහ අභිලාෂ දේශපාලන ක්‍රමය තුළ සහ දේශපාලන ආයතන තුළ නියෝජනය කරන්නේ පක්ෂ විසිනි.


- දේශපාලන අභිමතාර්ථ හැඩ ගැන්වීම - මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන, දැනුවත් කිරීමේ උපකරණ සහ ප්‍රචාරක රැස්වීම් ආශ්‍රයෙන් දේශපාලන වැඩසටහන් හැඩ ගැන්වීම.
- විවිධ සමාජ කණ්ඩායම්වල අභිලාෂ ඒකරාශී කිරීම සහ ඒවා දේශපාලන සහ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයට එකතු කිරීම.
- ජනතාව මෙහෙය වීම සහ ජනතාවට දේශපාලන අධ්‍යාපනයක් ලබා දීම සහ ජනතාව දේශපාලන ඉලක්ක සඳහා මෙහෙය වීම.
- ආණ්ඩුබලය සංවිධානය කිරීම - ආණ්ඩුවට ඒකාග්‍රතාව සහ ස්ථාවරත්වය සැපයීම, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම වලට පක්ෂ වලින් තොර පැවැත්මක් නැත.
- දේශපාලන ක්‍රමයේ සුජාතභාවයට දායකත්වය සැපයීම - පුරවැසියන්, සමාජ කණ්ඩායම් සහ ආණ්ඩුව අතර සබඳතාව ගොඩ නැගීම තුළින් එය සිදු කෙරේ.
- දේශපාලන ප්‍රභූ කණ්ඩායම් නිර්මාණය කිරීම සහ නව කණ්ඩායම් බඳවා ගැනීම. දේශපාලන ප්‍රභූ තන්ත්‍රය යනු දේශපාලන බලය අභ්‍යාස කරන සමාජ ස්තරයයි. නැතහොත් දේශපාලන පංතියයි. දේශපාලන පක්ෂවල ප්‍රධාන කාර්යක් වන්නේ මෙම දේශපාලන ප්‍රභූ ස්තරය නිර්මාණය කිරීම සහ ඒ වෙත නව සාමාජිකයන් බඳවා ගැනීමයි.

**3.3.20 ප්‍රශ්න අංක 10 සඳහා විශ්ලේෂණය**

**ප්‍රස්තාරය 3.22**

ප්‍රශ්න අංක 10 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.





ඉන්;

ලකුණු 00 – 05 ප්‍රාන්තරයේ 42.64%ක් ද,
ලකුණු 06 – 10 ප්‍රාන්තරයේ 25.54%ක් ද,
ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 21.00%ක් ද,
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 10.82%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත. අපේක්ෂකයන් අතුරෙන් 68.18%ක් ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇත. අපේක්ෂකයන් අතුරෙන් 10.82%ක් ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ

**ප්‍රස්තාරය 3.23**

ප්‍රශ්න අංක 10 සඳහා පහසුතා දර්ශකය




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2021, ශ්‍රී. ලං. වි. දෙ.

10 ප්‍රශ්නය කෙටි සටහන් ලිවිය යුතු කොටස් 5කින් සමන්විත අතර ඉන් තෝරාගත් කොටස් දෙකක් සඳහා පමණක් පිළිතුරු ලිවීම අපේක්ෂා කර ඇත. 95%ක් වැනි ඉතා ඉහළ අපේක්ෂක ප්‍රතිශතයක් පිළිතුර සැපයීම සඳහා මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත.

සමස්ත විෂයය නිර්දේශය ආවරණය වන පරිදි ප්‍රශ්න සකස්කර ඇත. මෙම ප්‍රශ්නයේ කොටස් පහේම සාමාන්‍ය පහසුතාව 40%කි.

අපේක්ෂකයන් වැඩි ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය තෝරා ගැනීමට කාල කළමනාකරණයේ අවශ්‍යතාවය කෙටි සටහන් ලිවීම තුළින් බලාපොරොත්තු වීම හේතුවක් විය හැකිය. එමෙන් ම මෙම කෙටි සටහන්වල දී ගැඹුරු විෂයය කරුණු බලාපොරොත්තු නොවීම සහ ලකුණු ලබා ගැනීම සාපේක්ෂව පහසු යැයි සිතීම මත කෙටි සටහන් සඳහා පිළිතුරු සැපයීමට අපේක්ෂකයන් බහුතරයක් යොමු වීමට හේතු විය හැකි ය. එහෙත් සාපේක්ෂව මෙම කොටස් සඳහා ද අපේක්ෂක සාධනය අඩු මට්ටමක පවතී. කෙටි සටහන් ලිවීමේ දී නිශ්චිත කරුණු සංක්ෂිප්තව දැක්වීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී සිසුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට කටයුතු කළ යුතු ය.